ISSN 1391 - 1031
2018 ජුනි
24 වෙළුම 02 කලාපය

ආධාරය රු 30/=


# නියමුවා


ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී


*"සියලුම පීඩිත පංති මේ දක්වා ලැග සිටි අධ්‍යාත්මික වහල්භාවයෙන් ගැලවී ඉන් ඉවතට යාමේ මාර්ගය නිර්ධන පංතියට පෙන්වා දුන්නේ මාක්ස්ගේ දාර්ශනික ද්‍රව්‍යවාදය පමණකි. ධනපතිවාදයේ පොදු ක්‍රමය තුළ නිර්ධන පංතියට හිමිව තිබෙන සැබෑ තත්වය පැහැදිලි කළේ මාක්ස්ගේ ආර්ථික න්‍යාය පමණකි."*

**ලෙනින්**
**තෝරා ගත් කෘති,**
**01 වැනි වෙළුම,**
**52-53 පිටු**

# ඒකාධිපති විධායකය අවසන් කරන '20' ජනතාව අතට

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20වැනි සංශෝධන කෙටුම්පත පසුගිය 25වැනි දින ජ.වි.පෙ. පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ලෙස පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා වෙත ඉදිරිපත් කිරීමත් සමග එය ප්‍රසිද්ධ ලියවිල්ලක් බවට පත්ව ඇති අතර එයට එරෙහි අවලාදකරුවන් නිරුත්තර කරමින් ජනතාව අතර මහත් සංවාදයට බඳුන් වෙමින් තිබේ.

විශේෂයෙන් 20වැනි සංශෝධනය පිළිබඳව ව්‍යාජ භීතියක් මැවීමට ඒකාධිපති අශිෂ්ටත්වයට පක්ෂපාතී කිහිපදෙනෙකු දිගින් දිගට උත්සාහ ගනිමින් සිටියද කෙටුම්පත පුළුල් ජනතා සංවාදයකට බඳුන් කරවීමට ජ.වි.පෙ. තීරණය කළේය. ඒ අනුව එළඹෙන කාලය තුළ ආගමික නායකයින්, මාධ්‍යවේදීන්, ආචාර්යවරුන්, කලාකරුවන්, වෘත්තීයවේදීන්, වැඩකරන ජනතාව ඇතුළු විවිධ සමාජ බලවේග සමග 20වැනි සංශෝධන කෙටුම්පත සාකච්ඡා කිරීමට ජ.වි.පෙ. අපේක්ෂා කරයි.

පසුගිය 28වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේදී මාධ්‍ය හමුවක් පවත්වමින් ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා 20වැනි සංශෝධනය පිළිබඳව පුළුල් සමාජ කථිකාවක් මගින් රටේ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කර ගැනීමේ දිශාවට තැබූ පියවර සාර්ථක කරගැනීම සඳහා උපරිම කැපවීමෙන් ක්‍රියාකරන බව අවධාරණය කර සිටියේය.

මහජනතාව විසින් ඡන්දයකින් ජනාධිපති තෝරා ගනු වෙනුවට පාර්ලිමේන්තුව විසින් ජනාධිපතිවරයෙකු තෝරා ගැනීම මෙම සංශෝධනයේ ප්‍රධානතම යෝජනාවක් වේ. එම ජනාධිපතිවරයා සතුව ඉතාමත් සීමිත බලතල ප්‍රමාණයක් තිබෙන අතර ඒ ජනාධිපතිවරයා රාජ්‍යයේ ප්‍රධානියාද වේ. සංශෝධනයට අනුව පූර්වයෙන් ජනාධිපතිවරයා සතුව තිබුණු බලතල විශාල ප්‍රමාණයක් අග්‍රාමාත්‍යවරයා, කැබිනට් මණ්ඩලය, පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථා සභාව වෙත පැවරෙනු ඇත.

විශේෂයෙන් මෙම සංශෝධනය මගින් 13වැනි සංශෝධනයට අදාළ ජනාධිපතිවරයාගේ බලතල කිසිවක් වෙනස් නොවන පරිදි සකස් කර ඇති අතර පාර්ලිමේන්තුවේ අස්ථාවරභාවය වැළැක්වීම සඳහාද විශේෂ යෝජනා කිහිපයක් ඉදිරිපත් කරනු ලැබ තිබේ. විශේෂයෙන් මන්ත්‍රීවරුන් පක්ෂයේ තීරණයට පටහැණිව පිල් මාරු කිරීම වැළැක්වීම සඳහා වන නෛතික ප්‍රතිපාදන මෙහි ඇතුළත්ය.

**02 වැනි පිටුවට**





**2018 මැයි 07**
**රතු මැයි රැලිය**
**කොළඹ BRC පිටියේදී**

## 05 අලුත් මුහුණු සොයන



ලොව පුරා මෙන්ම ලංකාවේද මතුව තිබෙන අර්බුදය ධනපති ක්‍රමයේ අර්බුදය මිස පුද්ගල සාධකවල...

## 07 ප්‍රාග්ධනයේ සූරාකෑම...



ප්‍රාග්ධනයේ පැවැත්ම ඇත්තේ ලාභය මතය. ලාභය නැතිනම් ප්‍රාග්ධනයක් නැත. ප්‍රාග්ධනයක් නැතිනම් පැවැත්මක්...

## 11 බල අරගලයට...



ඕනෑම රටක සුළු ජාතික කණ්ඩායම් හා බහුතර ජනතාවගේ ආගමේ නොවන...

## 12 උපාධි විකිණීමට බලය...



වෛද්‍යවරයකු වීමේ වුවමනාව සහිත ඕනෑම කෙනෙකු වෛද්‍ය සභාවේ නියාමනය සහිත ආයතනයක...


සංවාදය.......................... 03
තරුණ.............................. 04
ආවර්ජනා........................ 06
විශේෂ .............................. 08-09
ජාත්‍යන්තර........................ 10
කාලීන.............................. 12
වේදිකාව.......................... 13


**යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!**

# සටන් බිම

## WFTU කලාපීය නිරීක්ෂණ කමිටුව කොළඹදී රැස්වේ



ලෝක වෘත්තීය සමිති සම්මේලනයේ ආසියානු කලාපීය නිරීක්ෂණ කමිටුව පසුගියදා කොළඹ දී රැස් වූ අතර මේ සඳහා ලෝක වෘත්තීය සමිති සම්මේලනයේ නියෝජ්‍ය ලේකම් මහදේවන් සහෝදරයා ඇතුළු විදෙස් රටවල නිරීක්ෂණ කමිටු සාමාජිකයෝ පිරිසක් සහභාගි වූහ. ඉන්දියාව, නේපාලය, බංගලිදේශය, දකුණු අප්‍රිකාව, මැලේසියාව ආදී රටවල වෘත්තීය සමිති නායකයින් මේ සඳහා සහභාගි වී තිබිණි.

අන්තර් සමාගම් සේවක සංගමයේ ප්‍රධානත්වයෙන් පැවැත් වූ මෙම රැස්වීම සඳහා එහි සභාපති වසන්ත සමරසිංහ, ලේකම් ජානක අධිකාරී ඇතුළුව සමස්ත ලංකා වෘත්තීය සමිති සම්මේලනයේ ජාතික සංවිධායක මහින්ද ජයසිංහ, එහි සභාපති සභාපති සමන්ත කෝරලේ ආරච්චි, සමස්ත ලංකා වෛද්‍ය නිලධාරී සංගමයේ සභාපති වෛද්‍ය අසංග වික්‍රමසිංහ ඇතුළුව ලංකා බැංකු සේවක සංගමය, ලංකා වතු සේවක සංගමය, ලංකා වෘත්තීය සමිති සම්මේලනය යන වෘත්තීය සමිතිවල නියෝජිතයෝද මෙහි සමාරම්භක අවස්ථාවට සහභාගි වූහ.

ලෝක පරිමාණයෙන් වැඩකරන ජනතාව ලක්වෙමින් තිබෙන පීඩනය හා ඊට එරෙහිව කලාපීය වශයෙන් ගත හැකි ක්‍රියාමාර්ගයන් සම්බන්ධව පොදු යෝජනා සකස් කිරීම මෙම කමිටු රැස්වීමේ අරමුණ වූ බව අන්තර් සමාගම් සේවක සංගමයේ ලේකම් නීතීඥ ජානක අධිකාරී සහෝදරයා නියමුවා වෙත පැවසීය.

## දුම්රිය ඉල්ලීම් වෙනුවෙන් පැය 48ක වැඩ වර්ජනයක්




දුම්රිය සේවකයින්ට බලපාන ඉල්ලීම් කිහිපයක් මුල්කරගෙන ජූනි මස 06 දින රාත්‍රි 12.00 සිට පැය 48ක වැඩ වර්ජනයක් සිදු කිරීමට දුම්රිය වෘත්තීය සමිති සන්ධානය තීන්දු කළ බව එහි කැඳවුම්කරු එස්.පී. විතානගේ සහෝදරයා පවසයි. එම ඉල්ලීම් අතර සරත් අමුණුගම මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති කැබිනට් අනුකාරක සභාව යෝජනා කර ඇති දුම්රිය පාලක මණ්ඩල යෝජනාව වහාම අවලංගු කිරීම හා දුම්රිය දෙපාර්තමේන්තු ව්‍යුහයන් වෙනස් නොකර දුම්රිය සේවය ගොඩ නැගීමත්, ශ්‍රේණි හතරකට පමණක් බලපාන පරිදි ලබාදී ඇති MP-01, MP-02 වැටුප් තලවලට සමාන වැටුප් තල ලෙස ලබාදී ඇති RM-01, RM-02 වැටුප් තලවලට සාපේක්ෂව අනිකුත් සියලු ශ්‍රේණිවල වැටුප් සංශෝධනය කිරීම සහ කල් නොයවා එකවිට ඒ සියල්ල සිදු කිරීම ඇතුළු ඉල්ලීම් 6ක් අඩංගු වන බවත් මෙම ඉල්ලීම් ඉටුකිරීමට බලධාරීන් එකඟවන්නේ නම් මිස, අන් කවර හේතුවක් නිසාවත් නියමිත වෘත්තීය ක්‍රියාමාර්ගය නතර කිරීමට හෝ අත්හිටුවීමට අදහස් නොකරන බවද විතානගේ සහෝදරයා පවසා සිටී.


## ජල සම්පාදනය විරෝධතාවක



වසර තුනකට වරක් වැටුප් වැඩිවන ආයතනයක් වන ජල සම්පාදන සේවකයින් හට 2018 ජනවාරි සිට නව වැටුප් වැඩිවීමක් ලැබිය යුතුව තිබෙන නමුත් මේ වන තෙක් එය නොලැබීමට එරෙහිව මැයි 28 සිට විරෝධතා ක්‍රියාමාර්ග අරඹා තිබේ. 2018 පෙබ. සහ මාර්තු මාසවල ගත් වෘත්තීය ක්‍රියාමාර්ග අනුව 25%ක වැටුප් වැඩිවීමක් ලබාදෙන බවට අමාත්‍යාංශය විසින් දුන් ලිඛිත පොරොන්දුව මත එම වෘත්තීය ක්‍රියාමාර්ගය අත්හිටු වූ නමුත් එම පොරොන්දුව 2018 මැයි මස වැටුපටවත් නොලැබුණු බව සඳහන් කරන උපාලි රත්නායක සහෝදරයා, මෙසේ පොරොන්දු කඩකිරීමට එරෙහිවත් නව වැටුප වහාම ලබා දෙන ලෙසටත් බලකරමින් මැයි මස 28 වන දින පෙ.ව. 9.00 සිට ප.ව. 1.00 දක්වා පැය 4 ක විරෝධතාවයක යෙදුණු බවද මේ සඳහා රත්මලාන ප්‍රධාන කාර්යාලය, ප්‍රධාන කාර්යාලය අවට කාර්යාල, දෙහිවල සහ මොරටුව කොට්ඨාසවල සියලු සේවකයින් සහභාගි වූ බවද කියා සිටියේය.

මැයි මස 30වැනි දිනට බස්නාහිර පළාතේ සියලු සේවකයින් සහභාගි කරගනිමින්ද ඉන් අනතුරුව පිළිගත හැකි විසඳුමක් නොලැබෙන්නේ නම් ජූනි මස පළමුවැනිදායින් පසු දීපව්‍යාප්ත අඛණ්ඩ විරෝධතාවයන්වල යෙදීමට තීරණය කර ඇති බවද ඉංජිනේරු උපාලි රත්නායක සහෝදරයා පවසයි.

## ඌව මහ ඇමතිට එරෙහිව මූලික අයිතිවාසිකම් නඩුවක්



ඌව මහ ඇමති විසින් බදුල්ල දෙමළ බාලිකා විදුහලේ විදුහල්පතිවරිය දණ ගැස්සවීමේ සිද්ධියට අදාළව ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් නඩුවක් පැවරීමට ලංකා ගුරුසේවා සංගමය පසුගියදා කටයුතු කළේය. මෙහිදී වගඋත්තරකරුවන් ලෙස ඌව පළාත් මහ ඇමතිවරයා ඇතුළු අධ්‍යාපන බලධාරීන් කිහිප දෙනෙකු නම් කර ඇතැයි ලංකා ගුරුසේවා සංගමයේ ප්‍රධාන ලේකම් මහින්ද ජයසිංහ සහෝදරයා නියමුවාට පැවසීය.

විදුහල්පතිනිය දණගැස්වීමේ සිද්ධියට අදාළව කිසිදු පරීක්ෂණයක් මෙතෙක් අවසන්ව නැති අතර නැවත ඔහුට අධ්‍යාපන අමාත්‍ය ධුරය ලබාදීමටද කටයුතු කර ඇති බවත් ඊට සම්බන්ධ රාජ්‍ය නිලධාරිහුද නිරුපද්‍රිතව සිටින බවත් මෙහිදී මහින්ද ජයසිංහ සහෝදරයා පැවසීය. පසුගිය රාජපක්ෂ පාලන කාලය තුළද මෙවැනිම ආකාරයේ ගුරුවරියකට පහරදීමේ සිද්ධිය සම්බන්ධයෙන් යම් සාධාරණයක් හෝ කරගත හැකිවූයේ ගුරුවරුන්ගේ මැදිහත්වීම මත පමණක් බවද වර්තමානයේ පවා දේශපාලකයින් ගුරුවරුන්, විදුහල්පතිවරුන් මත දේශපාලන බලය මුදාහරිමින් කටයුතු කිරීමට එරෙහිව ඕනෑම ක්‍රියාමාර්ගයකට යාමට සූදානම් බවද මෙහිදී මහින්ද ජයසිංහ සහෝදරයා පැවසීය.

# එතෙරින්...

## ටිල්වින්-නලින්ද මාක්ස් සමරුවක් සඳහා නේපාලයට




නේපාල කොමියුනිස්ට් පක්ෂයේ කාල් මාක්ස් 200වැනි සමරුව සඳහා ආරාධනා ලැබූ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා සහ පාර්ලිමේන්තු මන්ත්‍රී නලින්ද ජයතිස්ස සහෝදරයා එම එම අවස්ථාවට සහභාගි වූහ. මැයි 30/31 දෙදින නේපාලයේ කත්මන්ඩු නුවර පැවති මෙම සමරු අවස්ථාවේදී ටිල්වින් සිල්වා සහෝදරයා අදහස් පළ කළ අතර මේ සඳහා වෙනත් රටවලින් සහභාගි වූ වමේ පක්ෂ නියෝජිතයින් සමඟද සාකච්ඡා පැවැත්වීය.

## විජිත හේරත් චීනයේ කොමියුනිස්ට් පක්ෂ නායක හමුවක




ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් සහ දේශපාලන මණ්ඩල සභික විජිත හේරත් සහෝදරයා චීන කොමියුනිස්ට් පක්ෂයේ මාක්ස් සමරු වැඩසටහනක් සහ වැඩමුළුවක් සඳහා සහභාගි වීමට චීනයේ සංචාරයක යෙදී සිටී. මැයි 25 සිට ජූනි 03 දක්වා පැවැත්වෙන මෙම වැඩසටහන සඳහා දකුණු ආසියානු වාමාංශික පක්ෂ නායකයින් රැසක්ද සහභාගි වී සිටී.

## හඳුන්නෙත්ති-නදීක ගුරුගේ 'එතෙර අපි' ස්වීඩන් සමුළුවේ



එතෙර අපි ස්වීඩන් ශාඛාවේ මහා සභා රැස්වීම සහ එතෙර අපි ස්වීඩන් ශාඛාව සංවිධානය කළ කලා සංස්කෘතික ප්‍රසංගය පසුගියදා ස්වීඩනයේ ස්ටොක්හෝම් නගරයේදී සාර්ථකව පැවැත්විණි. මෙම අවස්ථාව සඳහා 'එතෙර අපි' සභාපති ජවිපෙ දේශපාලන මණ්ඩල සභික සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා සහ සංගීතවේදී නදීක ගුරුගේ සහභාගි විය. එතෙර අපි මහා සභාව සඳහා නව නිලධාරි මණ්ඩලයක් පත්කරගත් අතර සංස්කෘතික ප්‍රසංගය සඳහා ස්වීඩනයේ පදිංචි ශ්‍රී ලාංකික දරුවන්ගේ නර්තන හා සංස්කෘතික අංගද එක්කර තිබුණි.

## කටාර් 'එතෙර අපි' පීඩාවට පත්වූවන්ට ආහාර බෙදයි




වෙසක් සැමරුව අදාළව කටාර් එතෙර අපි සංවිධානය විසින් වැටුප් නොලබා පීඩාවට පත්ව සිටින ශ්‍රී ලාංකිකයන් පිරිසකට වියළි ආහාර පාර්සල් බෙදා දීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදී. මේ අවස්ථාවට කටාරයේ ශ්‍රී ලංකා තානාපති සහ වෙසක් උත්සවයට කටාරයට ගොස් සිටින පූජ්‍ය දොඩම්පහල රාහුල හිමි ඇතුළු විශාල පිරිසක් සහභාගි වී සිටියහ.

## ඒකාධිපති විධායකය...

පළමු පිටුවෙන්

මෙම සංශෝධනය අනුව ජනාධිපතිවරයාට දඬුවම් නියම වූවෙකු නිදහස් කිරීමේ බලය දිගටම තිබුණද නිදහස් කළ යුතු වැරදිකරුවන් ගැන කැබිනට් මණ්ඩලයේදී එක් එක් පුද්ගලයාගේ නමට අනුමැතිය ලබාගත යුතුව තිබේ. එසේම දැනට ජනාධිපතිවරයෙකුට සීමාවකින් තොරව ඉතා විශාල කාර්ය මණ්ඩලයක් පත්කර ගත හැකි අතර ඔවුන්ට වැටුප්, දීමනා, වාහන, ඉන්ධන සීමාවක් නැතිව ලබා දිය හැකිය. එහෙත් නව සංශෝධනයෙන් ඊට සීමාවක් යෝජනා කර ඇති අතර ජනාධිපතිවරයාගේ කාර්ය මණ්ඩලයට අවශ්‍ය ප්‍රමාණය කැබිනට් මණ්ඩලය විසින් තීරණය කළ යුතුය.

එසේම නව සංශෝධනය අනුව අග්‍රාමාත්‍යවරයාගේ නිර්දේශ මත ජනාධිපතිවරයා විසින් අමාත්‍යවරුන් පත්කළ යුතුව තිබේ. ජනාධිපතිවරයා සතු පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලය අහෝසි කොට තිබෙන අතර පාර්ලිමේන්තුවේ සැසි වාර අවසන් කිරීමේ බලයද ඉවත් කොට ඇත. එසේම නව යෝජනාව අනුව ව්‍යවස්ථා සභාව විසින් විගණකාධිපතිවරයට කටයුතු කළ නොහැකි බවට නිර්දේශයක් ලබා දුනහොත් පමණක් ජනාධිපතිවරයාට අලුත් කෙනෙකු පත්කළ හැකිය. මේ ආකාරයට තනි පුද්ගලයෙකු සතුව තිබූ විශාල බලතල ප්‍රමාණයක් ඊට පහළ ආයතනවලට ලබාදී තිබේ.

කෙසේ වුවද මාධ්‍ය හමුවේදී අදහස් දැක්වූ අනුර දිසානායක සහෝදරයා රටේ දේශපාලන සංස්කෘතියේ ගොඩනැගී ඇති සියලු ජරාජීර්ණ තත්වයන් ඉවත් කිරීම 20වැනි සංශෝධනයෙන් කළ නොහැකි බව පෙන්වා දුන්නේය. "පාර්ලිමේන්තුවේ විකිණෙන මන්ත්‍රීවරුන් ඉන්න නිසා ජනාධිපතිවරයා පත් කිරීමේදී මුදලාලිලාට අවශ්‍ය ජනාධිපතිවරයෙක් පත්කළ හැකි බවට දැන් මතයක් ඉදිරිපත් කර තිබෙනවා. මේ වගේ ප්‍රශ්නවලට ව්‍යවස්ථාවෙන්ම උත්තර හොයන්න බැහැ. රටේ දේශපාලන සංස්කෘතියේ දියුණුවක් අත්වෙන්න ඕනෑ. මන්ත්‍රීවරුන් විකිණෙමින් අස්ථාවරභාවය හදනවා නම් එවැනි පක්ෂවල එවැනි නියෝජිතයන් පත් නොකිරීමේ වගකීමක් ජනතාවට තිබෙනවා. ඒ වගේම අපේ රට මුහුණ දෙමින් තිබෙන සමාජයීය, ආර්ථික, දේශපාලන අර්බුදයන්ට මේ විසිවැනි සංශෝධනයෙන් පිළිතුරු ලැබෙයි කියලා අපේ කිසිම විශ්වාසයක් නැහැ. ඒ ප්‍රශ්නවලට පිළිතුරු ලබාගැනීම සඳහා වෙනත් දේශපාලන අරගලයක් අපට තිබෙනවා. ඒ අතර ප්‍රජාතන්ත්‍රවාදය පුළුල් කරගැනීම සඳහා අවස්ථාවක් අපට තිබෙනවා. මේ පාර්ලිමේන්තුවට මෑත ඉතිහාසයේ ඉදිරිපත් කර තිබෙන ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමේ සංශෝධනය තමයි, මේ ඉදිරිපත් කර තිබෙන ව්‍යවස්ථා සංශෝධනය." ඔහු අවධාරණය කළේය.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# ගංවතුර, ආපදා කළමනාකරණය හා ආණ්ඩුව...

පසුගිය දිනවල ඇතිවූ අයහපත් කාලගුණික තත්වය සමග ගංවතුර උවදුරකට මුහුණදීමට පළාත් කිහිපයක ජනතාවට සිදුවිය. මරණ ගණනාවක්ද සිදුවූ අතර විශාල පිරිසක් ගංවතුරෙන් අවතැන් වූහ. දේපළ හානිද ඇතිවිය.

දැන් වසර ගණනාවක් තිස්සේ සෑම වසරකම මැයි හා ජුනි මාසවල ගංවතුර තර්ජනයට මුහුණදීමට කොළඹ, ගම්පහ, කළුතර, ගාල්ල, මාතර, රත්නපුර වැනි දිස්ත්‍රික්කවල ජීවත්වන ජනතාවට සිදුව තිබේ. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ පැහැදිලි කිරීම්වලට අනුව මෙම තත්වය ඇති වන්නේ නිරිත දිග මෝසම් සක්‍රීය වීමත්, ඒ සමග බෙංගාල බොක්ක කලාපයේ නිර්මාණය වන අඩු පීඩන තත්වයත් නිසාය. එය එසේනම් මෙම ගංවතුර තත්ත්වය අහම්බයක් නොව, හදිසියේ නොදන්වා එන උවදුරක් නොව, සෑම වසරකම මෙම කාලයේ සිදුවන කාලගුණික සංසිද්ධියකි. එබැවින් එවැන්නකට මුහුණදීමට සැලසුම් සහිත ආණ්ඩුවකට, පාලනයකට අපහසු නොවේ. එහෙත් අපේ රටේ සිදුව තිබෙන්නේ කුමක් ද? සෑම වසරකම අප අත්විඳින්නේ කුමක්ද?

අහස පුරා වැසි වලාකුළු මෝදුවී වහින්නට සරසෙන විට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව කාලගුණ අනාවැකි (?) නිකුත් කරමින්, වැසි ඇතිවිය හැකි බව කියයි. ඊළඟට ආපදා කලමනාකරණ අමාත්‍යාංශය (එයද බොහෝවිට ආපදාවට ලක්වේ.) නිවේදන නිකුත් කිරීමෙන් ආපදා තත්වයකදී විමසිල්ලෙන් සිටින ලෙස ජනතාවට උපදෙස් දෙයි. තවත් විවිධ ආයතන නිවේදන නිකුත් කරමින් නාය යාමේ අනතුරු ඇඟවීම් කරති. අනතුරුදායක ප්‍රදේශවලින් ඉවත්වන මෙන් ජනතාවගෙන් ඉල්ලා සිටිති. එහෙත් අනතුරු දායක ප්‍රදේශවල සිටින ජනතාව යන්නේ කුමන ස්ථානයකටද යන්න කවුරුත් නොදනිති. තමන් අමාරුවෙන් උපයාගත් දේපළ අතහැර යාමට නොහැකි මිනිස්සු නිවෙස්වලම හිඳිති. ඉන්පසු විපතක් සිදුවූ විට "අපි කල්තියා උපදෙස් දුන්නා" යයි කියා රජයේ ආයතන ඇඟ බේරා ගනියි. මෙම විගඩම් වෙනසක් නැතිව අවුරුදු පතා සිදුවේ.

අනෙක් අතට ගංවතුර ගලා ජනතාව අවතැන් වූවිට ආණ්ඩුව නිවේදනයක් නිකුත් කරමින් 'සහන සැලසීමට' මුදල් වෙන් කළ බව කියයි. එහෙත් ජනතාවට කඩිනමින් සහන සැලසීමට අවශ්‍ය යාන්ත්‍රණයක් ආණ්ඩුවට නැත. ඒ නිසා ආණ්ඩුවේ සහන ජනතාවට නිසි ලෙස නොලැබෙන අතර, ලැබුණද එය ලැබෙන්නේ ගංවතුර බැස ගියාටද පසුවය. මින් ඇතිවන හිස්තැන පිරවීමට විවිධ රූපවාහිනී නාලිකාද, විවිධ සංවිධානද ගංවතුරින් විපතට පත්වූවන්ට සහනදීමේ 'සහන වැඩසටහන්' ක්‍රියාත්මක කරයි; භාණ්ඩ එකතු කරයි. හැකි ලෙස බෙදයි. දැන් මෙම ක්‍රියාවලිය සම්ප්‍රදායක් බවට, මෝස්තරයක් බවටද පත්ව තිබේ. එය හරියටම 'වෙසක් දන්සැල් දෙනවා සේ' හැම වසරකම කෙරෙන කාර්යයක් වී තිබේ.

ජනතාව විපතට පත්වූ විට ආණ්ඩුවට දොස් කියමින් නොසිට ඔවුන්ට කුමන ආකාරයෙන් හෝ පිළිසරණක් වීම ඇගයිය යුතුය. මෙවැනි අවස්ථාවල ජනතා විමුක්ති පෙරමුණේ රතුතරුව සහන සේවා බලකායද ක්‍රියාත්මක වන්නේ විපතකදී ජනතාවට සහන සැලසීම මනුෂ්‍යත්වයේ ලක්ෂණයක් නිසාය.

එහෙත් විය යුත්තේ කුමක්ද? හැම වසරකම දැන දැනම මිනිසුන් විපතට පත්වන්නට ඉඩහැර ඔවුන්ට සහනදීමද? නැතිනම් මෙම විපත පාලනය කිරීමට දිගුකාලීන සැලසුමක් ක්‍රියාත්මක කිරීමද? ආණ්ඩුවක වගකීම වන්නේ, වසරක් පාසා සිදුවන මෙම තත්වය විපතක් බවට පත් නොවීමට දිගුකාලීන විසඳුම් සහිතව ක්‍රියාත්මක වීමය. එසේ නැතිව ගංවතුරෙන් යටවුණු පසු 'බත් පැකට්' බෙදීම නොවේ. ආපදා කළමනාකරණය යනු එයයි. එහෙත් සිදු නොවන්නේද එයමය.

කඳු බෑවුම්, ගංගා අද්දර වැනි අනතුරුදායක ස්ථානවල ජීවත්වන ජනතාව එම ස්ථානවලින් ඉවත්කිරීමේ, ආරක්ෂිත තැන්වල යළි පදිංචි කිරීමේ දිගුකාලීන සැලසුමක් ආණ්ඩුවලට තිබුණේද? නැත. එසේම වැසි වතුර බැසයාම අවහිරකරමින් අවිද්‍යාත්මකව හා අවිධිමත්ව තැන තැන ඉදිකර ඇති නීති විරෝධී ඉදිකිරීම් වෙනස් කර, වැසිවතුර නිදහසේ බැස යාමට අවශ්‍ය තත්වයන් සැකසීම සඳහා දිගුකාලීන සැලසුමක් සහිතව ආණ්ඩු වැඩකරමින් සිටීද? නැත. නායයාම් සඳහා බොහෝවිට බලපාන උස්බෑවුම් සහිත කඳු හෙළිපෙහෙළි කිරීම, ඒවායේ පස්කැපීම, ගල් කැඩීම වැනි ක්‍රියා පාලනය කොට අත්‍යාවශ්‍ය උස් කඳු බෑවුම් වනගත කිරීමට සැලසුම් තිබේද? නැත. සැබෑ තත්වය එයයි. මෙම ප්‍රශ්නයේදී ආණ්ඩු සිටින්නේ ගංවතුරට ආධාර බෙදන ස්වේච්ඡා සංවිධානවලටත් පසුපසිනි. එබැවින් ආණ්ඩුවේ වගකීම වන්නේ, විපතට පත්වූ පසු සහන දීම නොව, කාලගුණික ක්‍රියාදාමයක ප්‍රතිඵල නිසා සෑම වසරකම අත්විඳීමට සිදුවන මෙම විපත පාලනය කිරීම සඳහා විද්‍යාත්මක පදනමක සිට දිගුකාලීන සැලසුමක් සහිතව ක්‍රියාත්මක වීමය. එහෙත් ජනතාවගේ 'අවාසනාව' වී ඇත්තේ, එවැනි ආණ්ඩුවක් තවමත් රටේ බිහි නොවීමත්, සොබාදහමට මුහුණ දිය හැකි එවැනි ආණ්ඩුවක්, එවැනි පාලනයක් බිහිකර ගැනීමට ජනතාව කල්පනා නොකිරීමත්ය.

එබැවින් දැන් අප ඉදිරියේ ඇත්තේ, විපත සිදුවූ පසු නිවේදනවලින් සහන බෙදන හා උපදෙස් දෙන පාලනයක් හා විපතට පත්වූ පසු කාගෙන් හෝ ලැබෙන සහන මත යැපීමට බලා සිටින ජනතාවක්ය. මෙය වෙනස් කිරීමට ජනතාව තීරණය කරන තෙක් (ආණ්ඩු මෙය වෙනස් නොකරන නිසා!) මේ ඛේදවාචකය මෙලෙසම සිදුවනු ඇත.



# අප දෙරටේම ජනතාවට සිටින්නේ පොදු සතුරෙක්

## ස්වීඩන් කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරක සභික ඔගස්ට් එමානුවෙල් එලියසන් සහෝදරයා

*නියමුවා:- අධිරාජ්‍යවාදයේ වත්මන් අවධිය ඔබ විග්‍රහ කරන්නේ කෙසේ ද?*

*එමානුවෙල් එලියසන් සහෝදරයා:-* මෙය අධිරාජ්‍යවාදයේ දිරාපත් වන අවධියයි. එය හොඳටම කුණු වී අවසන්, අධිරාජ්‍යවාදය කඩා වැටෙන්නට පටන් අරගෙන. මා ඉන් කියන්නේ අධිරාජ්‍යවාදය තවදුරටත් අනතුරුදායක නැත කියා නොවෙයි, අධිරාජ්‍යවාදය තවදුරටත් වඩා අනතුරුදායක දෙයක් බවට මේ වන විට පත් වී තිබෙනවා. එහි ආක්‍රමණශීලීත්වය වැඩි වී තිබෙනවා.

අධිරාජ්‍යවාදී බලයේ ප්‍රමුඛයා වන්නේ එක්සත් ජනපද අධිරාජ්‍යවාදයයි. එහෙත් එක්සත් ජනපදය අද තිබෙන්නේ, සමාජයීය වශයෙන් සහ ආර්ථික වශයෙන් කඩා වැටෙමිනුයි.

මේ අතරේ නව බල කේන්ද්‍රයක් වර්ධනය වෙමින් තිබෙනවා. විශේෂයෙන්ම චීනය හා රුසියාව වැනි රටවල් ලෝක බලවතුන් බවට පත් වෙමින් තිබෙනවා. මෙම රටවල් ධනවාදී ද සමාජවාදීද යන්න නොතකා ලෝක බලවතුන් බවට වර්ධනය වෙනවා. විශේෂයෙන් රුසියාව අධිරාජ්‍යවාදී රටක් බවට පත් වෙමින් සිටිනවා. එය එක්සත් ජනපද ආධිපත්‍යයට තර්ජනයක් වෙමින් වර්ධනය වන අයුරු පෙනෙනවා. එක්සත් ජනපද අධිරාජ්‍යවාදය මෙම රටවල් ලෝක බලවතුන් ලෙසට වර්ධනය වීම වැළැක්වීමට උත්සාහ කරමින් සිටිනවා. මේ නිසා ලෝකය ගැටුම්වලින් පිරුණ තැනක් බවට පත් වී අවසන්. අපි දකිනවා, එක්සත් ජනපදය රුසියාවටත් චීනයටත් එරෙහිව ආක්‍රමණකාරී ලෙස මැදිහත් වී සිටින ආකාරය. ඉන් අදහස් කරන්නේ රුසියාව 'හොඳයි' යන්න නොවෙයි. රුසියාව ජාත්‍යන්තර වශයෙන් තම ස්ථානය ආරක්ෂා කර ගැනීමට කටයුතු කරමින් සිටිනවා. මේ තත්වය තුළ ඔවුන් එකිනෙකා සමග යුද වැදීමට පටන් ගෙන. හැමවිටම මුහුණට මුහුණලා නොවෙයි. වෙනත් මාර්ගයන් ගෙන් එකිනෙකා සමග යුද වැදී සිටිනවා. මේ නිසා ලෝකය තුළ ඉදිරියේදී වැඩියෙන් යුදමය තත්වයන් නිර්මාණය වීමට ඉඩකඩ තිබෙනවා.

*නියමුවා:- මේ මොහොතේ ඔබ රටේත්, පොදුවේ යුරෝපය තුළත් වර්ධනය වන දේශපාලනික ප්‍රවණතාව කුමන ආකාරයක් ගනීද?*

*එමානුවෙල් එලියසන් සහෝදරයා:-* මේ වන විට ස්වීඩනයේත් මුළු යුරෝපය තුළත් දක්ෂිණාංශික ජනප්‍රියවාදී කණ්ඩායම්වල සහ අන්ත දක්ෂිණාංශික ජාතිවාදී කණ්ඩායම්වල වර්ධනයත් දැකිය හැකියි. ස්වීඩනයේ අන්ත දක්ෂිණාංශික ජාතිවාදී පක්ෂය වන්නේ ස්වීඩන් ඩිමොක්‍රටික් පක්ෂයයි. එය පසුගිය මැතිවරණයේදී 14%ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගත්තා. ඉදිරියේදී එය තවත් වැඩි වේවි.

ධනවාදීන් ජාතිවාදය ජනතාව බෙදීමේ උපකරණයක් ලෙස පාවිච්චි කරමින් සිටිනවා. කම්කරු පංතිය භේද භින්න කිරීමට එය යොදා ගන්නවා.

ශ්‍රී ලංකාවේ හා ස්වීඩනයේ ජාතික ගැටලුව එකිනෙකට වෙනස්. ශ්‍රී ලංකාවේ ජාතික ගැටලුව ඓතිහාසිකව ගොඩනැගුණ එකක්. එයට දීර්ඝ ඉතිහාසයක් තිබෙනවා. ස්වීඩනය තුළ ඒ ආකාරයේ ජාතික ගැටලුවක් නැහැ. ස්වීඩනයේ මෙම තත්වය මතු වී ඇත්තේ, සංක්‍රමණික ගැටලුව නිසයි. අධිරාජ්‍යවාදී යුද්ධ හේතුවෙන්, ධනවාදය විසින් ගොඩනගනු ලැබූ දරිද්‍රතාවය විසිනුත් අප වැනි රටවල සංක්‍රමණික ප්‍රශ්නයක් නිර්මාණය කර තිබෙනවා. ස්වීඩනය යුරෝපයේ වැඩිම සංක්‍රමණිකයන් ප්‍රමාණයක් සිටින රට.

එහි බලපෑම අප රටේ ආර්ථිකයටත් කම්කරු ජනතාවටත් දැනෙනවා. මේ නිසා අප රටේ කම්කරු ජනතාවට රැකියා අවදානමක් ඇති වී තිබෙනවා. නිවාස පිළිබඳ ගැටලු ඇති වී තිබෙනවා. වැටුප් ප්‍රශ්න පැන නැගී තිබෙනවා. මීට අමතරව ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්න පවා නැගී තිබෙනවා.

> "අප දෙරටේම කම්කරු ජනතාව රැකියා සුරක්ෂිතභාවය පිළිබඳ ගැටලුවට මුහුණ දී සිටිනවා. ඒ වගේම වැඩිවන ජීවන වියදම, විරැකියාව ආදී ප්‍රශ්න අප දෙරටේම පොදුයි. මීට අමතරව අප දෙරටේම කම්කරුවන් සටන් කොට දිනා ගත් අයිතීන් අහිමි කරලීමේ ප්‍රශ්නයටද මුහුණ දෙමින් තිබෙනවා. මේ නිසා අප දෙරටේ ම ජනතාවට ඇත්තේ පොදු අරගලයක්."

මෙයට වගකිව යුත්තේ සංක්‍රමණියන් නොවෙයි. මෙය ධනේශ්වර ක්‍රමයේ අර්බුදයේම කොටසක්. එහෙත් ජනතාව සිතන්නේ මීට වගකිව යුත්තේ සංක්‍රමණිකයන් බවයි. මේ නිසා ඔවුන් සංක්‍රමණ විරෝධී, අන්ත දක්ෂිණාංශික, දක්ෂිණාංශික, දක්ෂිණාංශික ජනප්‍රියවාදී පක්ෂවලට ඡන්දය දීමට පෙළඹී සිටිනවා. සම්ප්‍රදායික ධනපති දේශපාලන පක්ෂවලට මේ සඳහා පිළිතුරු නැහැ. වමේ ව්‍යාපාරය ලෙස මේ නිසා අප හමුවේ දුෂ්කර කාර්යභාරයක් පැවරී තිබෙනවා. ජනතාවට, කම්කරු පංතියට මේ තත්වය අවබෝධ කර දිය යුතු වෙනවා. ඔවුන් වමේ ව්‍යාපාරය වෙතට දිනා ගත යුතුව තිබෙනවා.

*නියමුවා:- අප දෙරටේ කම්කරු පංතියට මුහුණ දීමට තිබෙන පොදු ගැටලුව ඔබ දකින ආකාරයට මොකක්ද?*

*එමානුවෙල් එලියසන් සහෝදරයා:-* අප දෙරටේම ජනතාවට ඇත්තේ පොදු සතුරෙක්. අප මතක තබා ගත යුතුයි ධනවාදය සහ අධිරාජ්‍යවාදය ජාත්‍යන්තර ප්‍රපංචයක්, ජාත්‍යන්තර ක්‍රමයක්. එබැවින් අප දෙරටේම ජනතාවගේ පොදු සතුරා අධිරාජ්‍යවාදයයි.

ශ්‍රී ලංකාවට පැමිණි ගමනේදී මට ඔබේ පක්ෂයේත් ඔබ පක්ෂයේ වෘත්තීය සමිතිවලත් නායකයින් මුණගැසීමට අවස්ථාව සැලසුණා. එහිදී අප දෙරටට බලපාන ප්‍රශ්න පිළිබඳ සාකච්ඡා කළා. එවිට මට අවබෝධ වූයේ අප දෙරටේම ජනතාවට මුහුණ දීමට සිදු වී ඇති ප්‍රශ්න බොහෝ දුරට සමාන බවයි. අප දෙරට පවතින්නේ ආර්ථික සංවර්ධයේ මට්ටම් දෙකක. ස්වීඩනය වඩාත් දියුණු අධිරාජ්‍යවාදී රටක්. ශ්‍රී ලංකාව ආර්ථිකමය වශයෙන් සංවර්ධනය නොවූ රටක්. නමුත් අපට මුහුණ දීමට සිදු වී ඇත්තේ මට්ටම් දෙකක ඇති සමාන ප්‍රශ්නවලටයි.

අප දෙරටේම කම්කරු ජනතාව රැකියා සුරක්ෂිතභාවය පිළිබඳ ගැටලුවට මුහුණ දී සිටිනවා. ඒ වගේම වැඩිවන ජීවන වියදම, විරැකියාව ආදී ප්‍රශ්න අප දෙරටේම පොදුයි. මීට අමතරව අප දෙරටේම කම්කරුවන් සටන් කොට දිනා ගත් අයිතීන් අහිමි කරලීමේ ප්‍රශ්නයටද මුහුණ දෙමින් තිබෙනවා. මේ නිසා අප දෙරටේ ම ජනතාවට ඇත්තේ පොදු අරගලයක්.

*නියමුවා:- ඔබ ප්‍රථම වරට ස්වීඩනයේ කොමියුනිස්ට් පක්ෂය නියෝජනය කරමින් ජනතා විමුක්ති පෙරමුණේ මැයි පෙළපාළියට හා රතු මැයි රැලියට සහභාගි වූවා. එහි ලැබූ අත්දැකීම කවරේද?*

*එමානුවෙල් එලියසන් සහෝදරයා:-* ජනතා විමුක්ති පෙරමුණේ මැයි දින පෙළපාළියට හා රතු මැයි රැලියට මා සම්බන්ධ වූයේ ප්‍රථම වතාවට. එය ඉතාම වටිනා අත්දැකීමක්. ඔබත් සමග ඒ අත්දැකීම 15 වැනි පිටුවට







# ප්‍රජාතන්ත්‍රවාදය අගයන තරුණයන්ගේ වගකීම

20වැනි ව්‍යවස්ථා සංශෝධනය හා හෙට දවසේ ලාංකේය දේශපාලනය සෘජු සම්බන්ධයක් සහිත වන බව ඉතා පැහැදිලිය. අපේ රට තුළ ගෙවුණු දශක කිහිපය දෙස හැරී බැලීමේදී රටේ ආර්ථිකය කඩාවැටීම, දිගින් දිගටම දක්නට ලැබෙන අතර රටේ පාරිභෝගික භාණ්ඩ හා සේවා මිල ගණන්, ණය බර දරාගැනීමට නොහැකි ලෙස ඉහළ යාමද ප්‍රමුඛය. එමෙන්ම නිෂ්පාදන ක්ෂේත්‍රයේ කඩා වැටීමද මෙයට සමගාමීවම සිදුවන්නක් බව නිරීක්ෂණය කළ හැකිය. සමාජීය ලෙස මතුවෙමින් ඇති නොවිසඳුණු ගැටලු දිනෙන් දින වර්ධනය වීමත් සිදුවෙමින් තිබේ. වර්තමානය වනවිට ධනපති ක්‍රමයට ලාංකේය සමාජය වෙත උරමකර දිය හැකිව ඇත්තේ මෙබදු පරිසරයකි. මෙකී තත්වය තවදුරටත් රටක් ලෙස ඉදිරියට යාමට නොහැකි වටපිටාවක් නිර්මාණය කරමින් ඇති බව නොරහසකි.

මෙයට සාපේක්ෂව රටේ නිර්මාණය වී ඇති ප්‍රශ්න ගණාවකට විසඳුම් සෙවීමට බලයට පත් ආණ්ඩු දිගින් දිගටම අසමත් වීම තුළ නිර්මාණය වූ දේශපාලන අර්බුය අද වන විට රට දේශපාලනික වශයෙන් අරාජිකත්වයකට ඇද දමමින් පවතී.

මෙකී තත්වය හමුවේ තවදුරටත් රටේ ජනතාවට පෙර පැවති ක්‍රමයට ජීවත්වීමට නොහැකි තත්වයක් රට තුළ නිර්මාණ වීම බලාපොරොත්තු විය හැකි සේම පාලකයන්ටද තවදුරටත් පැරණි ක්‍රමයට රට පාලනය කිරීමට නොහැකි වටපිටාවන් නිර්මාණය වීම සිදුවන්නකි. හෙට දවසේ ලාංකේය සමාජය මුහුණදීමට නියමිත මෙකී තත්වය රටේ තරුණයන් හට අන් හැමටම වඩා දැනෙනු ඇත්තේ තරුණයන් යනු ඕනෑම කටයුත්තකදී වඩාත් ඉදිරියෙන් සිටින කොටස වන නිසාවෙනි.

අද දවසේදී වුව තරුණයන් යනු තමන් මුහුණ දෙන අධ්‍යාපන, රැකියා හා ආර්ථික ප්‍රශ්නවලදී පවතින ආණ්ඩු හා සෘජුව ගැටෙමින් තම අයිතිවාසිකම් දිනාග ැනීමේ සටන්වල නියැලෙන රටේ ප්‍රමුඛ කොටසයි. එකි සටන් ක්‍රියාමාර්ග මර්දනය උදෙසා කටයුතු කරනු ලබන්නේ ප්‍රජාතන්ත්‍ර විරෝධීව සම්මත කරගන්නා ලද දැනට 19 වතාවක් සංශෝධනයට ලක්ව ඇති මෙකී ව්‍යවස්ථාවද යොදාගනිමිනි.

විධායක ජනාධිපති ක්‍රමය යනු රටේ පවතින ධනේශ්වර ආණ්ඩුවලට ප්‍රජාතන්ත්‍රවාදය අහෝසි කොට මර්දනීය ක්‍රියාමාර්ග ගැනීම උදෙසා වන ඉඩකට ව්‍යවස්ථාවෙන්ම සපයා දී ඇති තත්වයක් වන නිසාම රටේ ප්‍රජාතන්ත්‍රවාය අගයන්නන් ලෙස විධායක සතු බලතල ඉවත්කිරීම උදෙසා වන 20වැනි ව්‍යවස්ථා සංශෝධනය සඳහා පාලකයන්ට බලකර සිටිය යුතුය. ඉහත කී අර්ථයෙන් වැඩිපුර පීඩාවට ලක්වන්නන් ලෙස රටේ තරුණ ප්‍රජාව මෙකී ව්‍යවස්ථා සංශෝධනය කරලීමේ ක්‍රියාමාර්ගයේදී වඩාත් වඩාත් ඉදිරියෙන් සිට පාලකයන්ට බලකර සිටිය යුතුය.

# 'එකම රටක් මනු පවුරක්'

ජීව විද්‍යාත්මකව සීයයට සීයයක්ම සමානතා දක්වන මිනිස් කණ්ඩායම් ජාති, ආගම්, කුල, ගෝත්‍ර, සංස්කෘතීන් ආදී ලෙස විවිධාකාරයෙන් බෙදී වෙන්වී සිටියි. එම බෙදීම පසෙකලා, සිංහල, මුස්ලිම්, හින්දු ආදී විවිධ ජාතිකත්වයන් එක්ව ජාතික සමගිය වෙනුවෙන් අත්වැල් බැඳගැනීමට සැලැස්වීම සඳහා සමාජවාදී තරුණ සංගමය පෙරට විත් සිටී. ඒ වෙනුවෙන් ඉදිරි මාස කිහිපය තුළ රට පුරා ව්‍යාප්ත වුණු වැඩසටහන් ගණනාවක් සංවිධානය කරනු ලැබ ඇත.

මේ යටතේ සියලු ජාතිකත්වයන් නියෝජනය කරගනිමින් ගම්මානයක් තුළ සිදුකළ යුතු වැදගත් ක්‍රියාකාරකම් සියලු දෙනා එකතු වී සිදුකිරීම, පන්සල හො පල්ලියට යන මාර්ගය පිළිසකර කිරීම, පෙර පාසල් ළමුන් එකතු කරගනිමින් චිත්‍ර ඇඳීමේ වැඩසටහන් පැවැත්වීම ආදී ඕනෑම ක්‍රියාකාරකමක් ගමට සුවිශේෂී නම් පන්සලේ නායක ස්වාමීන්වහන්සේ, පල්ලියේ මවුලවිතුමා, ක්‍රිස්තියානි පල්ලියේ පියතුමා සහ ගමේ වැඩිහිටියන් පිළිගත් ගෞරවාදරයට පාත්‍රවූවන් සියලු දෙනාගේ දෑතින් සිදු කිරීම එක් ක්‍රියාවලියකි. රට පුරා විසිරුණු සෑම ගමකම මේ වැඩසටහන් ක්‍රියාත්මක වන ඇති අතර එයින් එක ගමේ විසිරී ජීවත්වන ජාතිකත්වයන් කිහිපයක පිරිස එකට එකතු කළ හැකිවනු ඇත. පසුගිය කාලයේ මහනුවර ප්‍රදේශයේ ඇති වූ සිදුවීම් යළි සිදුනොවීමට එවන් බැඳීම් වැදගත් වෙයි.

රාමසාන් කාලයේදී මුස්ලිම් ජාතිකත්වයට අයත් සහෝදරවරුන් නෝම්බි අත්හරින චාරිත්‍රයේදී අන්‍ය ජාතිකත්වයන් අයත් සහෝදරවරුන් සමඟ සම්බන්ධවීම ජුනි 04 සිට 10 දක්වා රට පුරා, මුස්ලිම් ආගමික ස්ථාන මූලික කරගනිමින් සිදුවන අතර එහි ප්‍රධාන වැඩසටහන ජුනි 06 දින මාලිගාවත්තේදී සිදු කිරීමට නියමිතය.

'එකම රටක් මනු පවුරක්' ජාතික සමගියේ පණිවිඩය, රැගෙන රට සිව් දෙසින් හලාවත මහනුවර, රත්නපුර, ගාල්ල නගරයෙන් ආරම්භ වී නුගේගොඩ නගරයෙදී එකතුවන සාම බයිසිකල් සවාරිය ජූලි 23 දින ධාවනය වේ. එදිනම සවස ආනන්ද සමරකෝන් එළිමහන් රංගපීඨයේදී 'එකම රටක් මනු පවුරක්' ජාතික සාම රැලිය සහ සංස්කෘතික ප්‍රසංගය පැවැත්වීමට නියමිතය.

සියලුම ජාතිකත්වයෙන්ගෙන් යුතු පුද්ගලයින් පළමුව මිනිසුන් ලෙස දැකීමටත් ඔවුන් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතා ගොඩනැගීම කෙරෙහිත් කටයුතු සංවිධානය කරන සමාජවාදී තරුණ සංගමය සාමකාමී ශ්‍රී ලාංකිකයන් ගොඩනැගීමේ මහඟු කාර්යය වෙනුවෙන් උරදී සිටියි. එය ලාංකේය සමාජයේ යහපැවැත්ම සඳහා මහඟු පිටුබලයක් වනු නොඅනුමානය.

# වෙනිසියුලා හා ශ්‍රී ලංකා තරුණ මිත්‍රත්ව හමුවක්

වෙනිසියුලානු කොමිනියුස්ට් තරුණ සංවිධානය (JCV) සහ සමාජවාදී තරුණ සංගමය (SYU) අතර අත්දැකීම් හුවමාරු කරගැනීමේ දින 05ක මිත්‍රත්ව වැඩසටහනක් පසුගිය මැයි 29 ආරම්භ විය. සමාජවාදී තරුණ සංගමයේ නායකයින් හා වෙනිසියුලානු තරුණ සංගමයේ නායකයින් අතර පළමු හමුව මැයි 29 දින තරුණ සංගම් මුලස්ථානයේදී පැවැත්විණි. ඒ සඳහා සමාජවාදී තරුණ සංගමය නියෝජනය කරමින් ජාතික සංවිධායක එරංග ගුණසේකර, ජාත්‍යන්තර කටයුතු ලේකම් අංජන අමරසිංහ, බන්දුල පුෂ්පකුමාර, අසිත නිරෝෂණ, නිපුණා සාරංගි, දීප්ත වසන්ත යන සහෝදරවරුන් හා සහෝදරිය ද වෙනිසියුලාවේ තරුණ සංගමය නියෝජනය කරමින් එහි ජාතික සංවිධායක හෙක්ටර් අප්ලෝ හා ජාත්‍යන්තර කටයුතු ලේකම් ගේබ්‍රියල් යන සහෝදරයන් සහභාගි විය.





මෙම මිත්‍රත්ව වැඩසටහන වෙනිසියුලානු කොමියුනිස්ට් තරුණ සංගමයේ ඉල්ලීම මත සමාජවාදී තරුණ සංගමය විසින් සංවිධානය කළ අතර මැයි 29 සිට ජුනි 03 දක්වා පැවැත්විය. මෙහි දී අත්දැකීම් හුවමාරු වැඩසටහන්, තරුණ වැඩමුළු, තරුණ ක්‍රියාකාරී හමු, දේශපාලන සාකච්ඡා සභාවන් ආදි වැඩසටහන් රාශියක් පැවැත්විය.

## මේ මෙතැන, මල් පඳුර පැළවුණු තැන

පාලු ගුරු නිවහනට,
වංකගිරියේ තක්සලාවට
බැහැයි නොකියා සපැමිණ,
සිංහලෙන් සිනා සී
සිංහලම කතා කළ,
සිංහලද දෙමළදැයි
නොදන්නා මිනිස්කම
සිංහලෙන් ඉගැන්වූ
දෙමළ හිත...
රාමචන්ද්‍රන් ,
ඉංග්‍රීසි මාස්ටර්
නිදා හුන් තැනය මෙය.
පිළිස්සී අඟුරු වුණු ඒ සිරුර,
වැටී තිබුණේ මෙතැනය...

රවුම්, 'ගාන්ධි මොඩලය'
තැලී, පොඩි වී, ඇද වුණ
සිංහලත් දෙමළ හා ඉංග්‍රීසි
සමව කියැවිය හැකි වුණ
ඒ උපැස් යුවළ ද,
වැටී තිබුණේ මෙතැන ය...

ගුරුවරුන් අඩු දිනවල
සිංහලෙන් පැවරුම් දෙන,
ඉංග්‍රීසි පොත්-සඟරා
බලෙන් අපටත් කියවන
කලාප කාර්යාලෙට
ඉඳහිට දිනෙක ඇවිදින
හුරු පුරුදු ඒ උණුහුම
නිවී තිබුණේ මෙතැන ය...

මේ මෙතැන,
ඇසළ මාසය කෙළවර
නම නොදන්නා මල් පිපෙන
මල් පඳුර පැළවුණු තැන,
ඒ නිසල හදවත
වැටී තිබුණේ මෙතැනය...

සෞම්‍ය සඳරුවන් ලියනගේ ගේ 'හැටේ වත්තේ මග්දලේනා' කවි පොතෙන් උපුටා ගන්නා ලදී

''ප්‍රථමයෙන්ම මම කොමියුනිස්ට් ආචාර ධර්ම ගැන සඳහනක් කරන්නෙමි. ඔබ කොමියුනිස්ට්වාදීන් වීමට පුහුණුව ලබා ගත යුතුය. තරුණ සමිති සාමාජිකයන්ගේම උගනීමේ සංවිධානවීමේ එක්සත්වීමේ හා සටන් කිරීමේ කටයුතු මගින් ඔවුනට පුහුණුවක් ලැබීමට හා ඔවුන්ගේ නායකත්වය අපේක්ෂා කරණ අය පුහුණු කිරීමට එම සාමාජිකත්වයට හැකිවන පරිද්දෙන් තරුණ සමිතියේ ප්‍රායෝගික කටයුතු සංවිධානය කරගැනීම එහි වගකීම වේ. තරුණ සමිතිය කොමියුනිස්ට්වරු පුහුණු කළ යුත්තේය. ඒ තරුණ ජනයාට පුහුණුවල ශික්ෂණය හා උගෙනුම දීමේ සම්පූර්ණ අරමුණ විය යුත්තේ ඔවුන් කොමියුනිස්ට් ආචාර ධර්ම කෙරෙහි තරයේ බැඳුණු පිරිසක් කිරීමය.

*ලෙනින්,11 වෙළුම, තරුණ සංගම්වලට භාර කර්තව්‍යයන්. 66 පිටුව*



# අලුත් මුහුණු සොයන පැරණි ධනවාදය

වර්තමානයේ ශ්‍රී ලංකාව ඉතාම බරපතළ සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික අර්බුදයකට ගොදුරු වී ඉන් මිදීමට නොහැකිව සිටින බව අප නිතර නිතර කථාකර ඇත්තෙමු. ශ්‍රී ලංකාවේ සමස්ත සමාජ ක්‍රමයම ගොඩගත නොහැකි අර්බුදයක පවතින්නේය යන්න මනස්ගාතයක් හෝ මිත්‍යාවක් නොව විෂය මූලික යථාර්ථයකි.

ඉතාම කෙටියෙන් ගත්විට ලංකාවේ ආර්ථිකය බිඳවැටී තිබේ. නිෂ්පාදන මාර්ග ඵලදායී නොවීමත් නව නිෂ්පාදන මාර්ග හඳුන්වාදීමට නොහැකිවීමත් නිසා රට විශාල මූල්‍ය අර්බුදයකට ලක්ව තිබේ. ඒ නිසාම ලංකාවේ ආර්ථිකයේ පැවැත්ම ණය මත, බදු මත, දඩ මත තීරණය වී තිබේ. ණය යනු ආදායම් මාර්ග යක් නොව පොලිය සමඟ ගෙවිය යුතු වියදම් මාර්ගයක් බව පැහැදිලිය. නිෂ්පාදන මාර්ග නොමැතිකම නිසා රටට මෙන්ම රජයටද ආදායම් නැත. එවිට රජයේ ආදායම් සඳහා බදුබර වැඩිකෙරේ. මේ දිනවල ගෑස්, ඉන්ධන, කිරිපිටි ආදී භාණ්ඩ හා බස් ගාස්තු වැනි සේවා ඪ සක මිල විශාල වශයෙන් ඉහළ යන්නේ බදුබර නිසාය. බදුබර පටවා උරාගන්නා ආදායම්ද ආණ්ඩුවේ නාස්තිය, වංචා හා දූෂණ නිසා විනාශ වේ. අවසානයේ පොදු ජනතාව පීඩාවට පත්ව සිටී. මේ හා බැඳුණු දේශපාලන අර්බුදයක්ද රටේ තිබේ. ආණ්ඩුව තුළ වන ප්‍රතිවිරෝධතා විසින් රට අරාජික කරනු ලැබ තිබේ. රටේ පාලනයක් නැත. ඒ අතර ධනපති දේශපාලන පක්ෂ කැඩී බිඳී ඒවායේ අභ්‍යන්තර අර්බුද මතුව තිබේ. එ.ජා.ප.ය තුළ අර්බුදයන්ය. මහින්ද පිල හා මෛත්‍රී පිල ලෙස දෙකට බෙදී තිබූ ශ්‍රීල.නි.ප.ය දැන් තුනට බෙදී තිබේ. ඒ, 16 දෙනාගේ කල්ලිය බිහිවීම සමඟය. ධනපති දේශපාලන නායකයෝ පිල් මාරු කරමින් පිලෙන් පිලට යමින් විකාර දසුන් පෙන්වති.

ඒ අතර රටේ විනය සදාචාරය, පිරිහී සංස්කෘතික පිරිහීමකට රට පත්ව තිබේ. තනි වචනයෙන් කිවහොත් ලංකාවේ ධනපති ක්‍රමය පවතින්නේ, ගොඩගත නොහැකි අර්බුදයකය. වසර 70ක එ.ජා.ප., ශ්‍රීල.නි.ප. (හවුල් ආණ්ඩු) පාලනය රට ගෙනවිත් තිබෙන ආගාධය එසේය. මේ අන් කිසිවක් නොව සමාජ ක්‍රමයක් ලෙස ධනවාදයේත් ධනපති පක්ෂවලත් නොහැකියාව පෙන්වීමකි.

ලංකාව තුළ පමණක් නොව ලෝක පරිමාණයෙන් සලකා බැලුවද ධනපති ක්‍රමය යළි අලුත්වැඩියා කළ නොහැකි අර්බුදයකට පත්ව තිබේ. වසර 500ක ධනපති ක්‍රමය එහි අවසානයට ලක්ව තිබේ. එය මිනිසුන්ට පීඩා දෙමින් මරණ මංචකයේ පසුවේ. ලෙනින් වරක් අවධාරණය කළ පරිදිම ධනවාදයේ අර්බුයෙන් මිදීමට ධනපති පංතියට, ධනපති ක්‍රමයට නොහැක. ඒ හරියටම අයෙකුට තමන්ගේ සපත්තුවේ පටිවලින් ඇද තමන්වම ඔසවා ගැනීමට නොහැකිවාක් මෙනි.

ප්‍රශ්නය වන්නේ කුමක්ද? අර්බුදයට ගිය ධනවාදය තම නොහැකියාව පිළිගනිමින් ඉතිහාසයේ වේදිකාවෙන් බැස නොයාමය. එය ඒ වෙනුවට විවිධ උපක්‍රම උප්පරවැට්ටි යොදමින් ජනතාව මුලා කරමින් තවත් දිනක් හෝ බලයේ සිටීමට වෙර දරයි. ධනවාදයේ උපක්‍රම උප්පරවැට්ටිවලට ජනතාවද නිතර මුලාවෙති. ඛේදවාචකය එයයි.

අපේ රටේ දේශපාලනය දෙස දැන් බැලූ විට පෙනෙන්නේ කුමක්ද? වසර 70කට වඩා පැරණි අසමත්කම පෙන්වූ ධනවාදී ක්‍රමය වෙනස්කර නව සමාජ ක්‍රමයක් වෙත පිවිසීමට උත්සාහ කරනවා වෙනුවට ජනතාව නව පාලකයෙක් සෙවීමට උත්සාහ කරමින් සිටී. ධනවාදයේ අර්බුදයට සමාජ පරිවර්තනයකින් සැබෑ විසඳුම සොයා ගන්නවා වෙනුවට, ධනවාදය එසේම තිබියදී අලුත් මුහුණක් (අලුත් හොරෙක්) සොයා ගැනීමට උත්සාහ කරමින් සිටී. වෙනස් ලෙසකින් පවසන්නේ නම් ධනවාදය ධනපති පක්ෂ හා ධනපති ක්‍රමය සඟවාගෙන පුද්ගල චරිත මතින් තව කලක් තම පැවැත්ම ගෙනයාමට උත්සාහ කරමින් සිටී. රට ඉදිරියේ දැන් ඇති සැබෑ දේශපාලන අභියෝගය වන්නේ එයයි.

ධනවාදය තුළ, ධනපති මතවාදය හා ඉගැන්වීම් තුළ හැම විටකම එහි අසාර්ථකත්වය හා අර්බුදය, ක්‍රමය විසින් බාර ගන්නවා වෙනුවට දේශපාලන පක්ෂවලට හෝ පුද්ගලයින්ට බැර කර ක්‍රමය රැක ගැනීමේ උත්සාහයක් පවතී. එවිට ජනතාව ප්‍රතික්ෂේප කරන්නේ පුද්ගලයන්ය. ධනපති පක්ෂය, ධනපති ක්‍රමය නොවේ. එය ආරක්ෂා වෙයි.

1947න් පසු මැත දක්වා ගෙවුණු ඉතිහාසය තුළ ලංකාවේ ධනවාදය පෙරට ආවේ ධනපති පක්ෂ හා පුද්ගලයා යන සාධක දෙකම මගිනි. ආරම්භක කාලයේ රට හදන්න පුළුවන් එ.ජා.ප.යට පමණක් බව පැවසූ එ.ජා.ප.ය



එහි ප්‍රථම නායකයා වූ ඩී.එස්. සේනානායක ජාතියේ පියා ලෙස අර්ථ ගන්වා ඔහුගේ අභාවයෙන් පසු ඔහුගේ පුත් ඩඩ්ලි සේනානායක අගමැති කරවීමට පාර කපා ගන්නා ලදී. ඉන්පසු එ.ජා.ප.යෙන් බිඳී ගිය ශ්‍රීල.නි.ප.ය, ප්‍රගතිශීලී හා වමේ පෙනුමක් පෙන්වමින් බලයට ආ අතර බණ්ඩාරනායක පවුල එහි මූලිකත්වය දැරීය.

1970 වනවිට එ.ජා.ප.ය පක්ෂයක් ලෙස අසමත්කම පෙන්වා එය දුර්වල වන විට ධනවාදයේ අර්බුදයත්, පක්ෂයේ නොහැකියාවත් පුද්ගල සාධකයකින් යටපත් කරන ලදී. 1977දී ජේ.ආර්. ජයවර්ධනගේ නායකත්වයෙන් (නව නායකත්වයක්!) පරණ පක්ෂයම බලයට පත්විය. ඒ සමඟ ශ්‍රීල.නි.ප.ය පරාජය විය. ජනතාවගෙන් ප්‍රතික්ෂේප විය. එවිට වසර 14ක එ.ජා.ප. පාලනයේ විනාශකාරිත්වයද උපයෝගී කරගෙන ශ්‍රීල.නි.ප.ය පොදුජන එක්සත් පෙරමුණ ලෙස හෞතීස්ම ලබා අලුත්වූ අතර ඊට චන්ද්‍රිකා කුමාරතුංගගේ 'නව' නායකත්වය ලැබුණි. ඉන් පසු එහි නායකත්වයට මහින්ද පත්විය. චන්ද්‍රිකා එපා විය.

මෙම දේශපාලන ක්‍රියාවලිය අධ්‍යයනය කරන විට පැරණි හා අසමත් සමාජ ක්‍රමයක් පැරණි හා අසමත් පක්ෂවල පෙනුම හා නායක චරිත අලුත් කරමින් හැම විටම අතීත පව් අතීත පාලකයන්ට පවරා සමාජ ක්‍රමය රැක ගැනීමට කටයුතු කර තිබෙන ආකාරය තේරුම් ගැනීමට අපහසු නැත. මෙහි ලොකුම ඛේදවාචකය වන්නේ බහුතර ජනතාවක් මෙම දේශපාලන සූදුවට, දේශපාලන උප්පරවැට්ටියට අවිඥානිකව ගොදුරු වීමය. පැරණි සමාජය වෙනුවට අලුත් සමාජයක් ගොඩනගන, තරමක් දුෂ්කර එහෙත් ප්‍රතිඵලදායක කාර්යය වෙනුවට ජනතාව නිතරම ඒ වෙනුවට අලුත් නායකයන් සොයන කිසිදු ප්‍රතිඵලයක් නැති එහෙත් පහසු කාර්යයන්ට ගොදුරු වී තිබේ. දැනුදු ගොදුරු වෙමින් තිබේ.

මේ වනවිට ධනවාදය යළි ගොඩගත නොහැකි ලෙස අර්බුදයට පත්ව ආගාධයට වැටී අවසන්ය. ධනපති පක්ෂ දෙකද අර්බුදයට පත්ව, අසාර්ථකත්වයට පත්ව සිය නිරුවත පෙන්වමින් සිටී. පක්ෂ මාරුකිරීම්, පක්ෂ බෙදීම්, කල්ලි හැදීම්, හවුල් පාලනයන් ආදිය නිසා ධනපති පක්ෂ දෙකම දැන් ජනතාව ඉදිරියේ සිය ගරුත්වය හා විශ්වාසය කෙළෙසාගෙන ගරාවැටීමට ලක්ව සිටී. දැන් ධනවාදය ඉදිරියට ගෙනයාමට ජනතා විශ්වාසය දිනාගත් ධනපති පක්ෂයක් නැත. ධනපති පක්ෂ දෙකම ජරාජීර්ණ වී තිබේ. එසේනම් ජනතාව සෙවිය යුත්තේ විකල්ප ක්‍රමයකි. එහෙත් ඒ වෙනුවට සුපුරුදු නාඩගම අලුත් ආකාරයකින් කරළිගත කිරීමට කටයුතු සූදානම් වෙමින් තිබේ.

අතීතයේ ධනවාදය පවත්වාගෙන ආවේ ධනපති පක්ෂ මූලික කරගත් ධනපති නායකයන් විසිනි. දැන් පක්ෂ බංකොලොත්වී ඇති තත්වය තුළ පක්ෂ පසුපසට දමා පුද්ගල සාධක පමණක් මතුකරමින් සිටී. සමාජයේ කිසියම් පිරිසක් රටේ ඊළඟ නායකත්වයට ගෝඨාභය 'වියතෙක්' ලෙස හෞතීස්ම කරමින් තිබෙන්නේ මේ සඳහාය. මහින්ද පිල තුළ සිටින බලය අහිමිවීමෙන් වේදනාවට පත්ව සිටින අය හා අපරාධ හා වංචා දූෂණවලට චෝදනා ලැබූවන් ඉක්මනින්ම බලය ලබාගැනීම සඳහා රට රැවටිය හැකි අලුත් නායකයෙක් නිර්මාණය කිරීමට දඟලති. ගෝඨාභය කරළිගත වන්නේ, එම වුවමනාව මහින්දට සැපිරිය නොහැකි නිසාය. ඒ අතර එ.ජා.ප.යට රනිල් වෙනුවට වෙනත් ප්‍රධාන නළුවෙක් සොයයි. ධනවාදයේ අර්බුදය විසින් නිර්මාණය කෙරෙමින් තිබෙන විගඩම් හා හාස්‍යජනකයන් එසේය.

ලොව එකම දේ දෙවරක් සිදුවන්නේ යයි ජර්මන් දාර්ශනික හෙගල් වරක් පැවසූ විට මාක්ස් එයට ඌණ පූරණයක් එක් කරමින් පැවසුවේ, එය එසේ වන්නේ නම් එය පළමුව ඛේදජනකයක් ලෙසද දෙවනුව විගඩමක් ලෙසද සිදුවන බවය. දැන් අපේ රටේ දේශපාලනයේද එකම දේ නැවත නැවත සිදුවේ. එම දේශපාලන ඛේදජනකයන් දේශපාලන විගඩම් බවට පත්වන බව පැහැදිලිය. අප පරාජය කළ යුත්තේ එයය.

ලොව පුරා මෙන්ම ලංකාවේද මතුව තිබෙන අර්බුදය ධනපති ක්‍රමයේ අර්බුදය මිස පුද්ගල සාධකවල අර්බුදයක් පමණක් නොවේ. එසේම ධනවාදයේ අර්බුදයට 'මුහුණු මාරුකර' 'අලුත් ලෙස පෙනෙන පුද්ගලයන්ට විසඳුම් සෙවිය නොහැක. සිදුවිය හැක්කේ අර්බුදයන් ඛේදවාචක බවට පත්වීම පමණි. එබැවින් දියසෙන් කුමාරවරු ලෙස පෙනී සිටීමට 15 වැනි පිටුවට

> ලොව පුරා මෙන්ම ලංකාවේද මතුව තිබෙන අර්බුදය ධනපති ක්‍රමයේ අර්බුදය මිස පුද්ගල සාධකවල අර්බුදයක් පමණක් නොවේ. එසේම ධනවාදයේ අර්බුදයට 'මුහුණු මාරුකර' 'අලුත් ලෙස පෙනෙන පුද්ගලයන්ට විසඳුම් සෙවිය නොහැක. සිදුවිය හැක්කේ අර්බුදයන් ඛේදවාචක බවට පත්වීම පමණි. එබැවින් දියසෙන් කුමාරවරු ලෙස පෙනී සිටීමට උත්සාහ දරන පරණ, බොල්, දුෂ්ට හා මුග්ධ චරිත උත්කර්ෂයට නැංවීමේ මුග්ධ දේශපාලනය වෙනුවට නව දැක්මක්, නව වැඩපිළිවෙළක් සහිත නව දේශපාලන බලයක් සඳහා නව දේශපාලන මධ්‍යස්ථානයක් නිර්මාණය කිරීමේ සැබෑ හා ජයග්‍රාහී දේශපාලනයට ජනතාව දැනුවත් කොට ඒකරාශී කළ යුතුය.



"සූරාකනු ලබන හා පීඩිත ජනතාව තමන්ට පැරණි ක්‍රමයට ජීවත්විය නොහැකි බව අවබෝධ කර ගැනීම සහ වෙනස් කිරීම ඉල්ලීම විප්ලවයක් සිදුවීම සඳහා ප්‍රමාණවත් නොවේ. විප්ලවයක් සිදුවීම සඳහා සූරාකන්නන්ට පැරණි ක්‍රමයෙන් ජීවත් වීමට සහ පාලනය කිරීමට නොහැකි තත්වයක් ඇතිවීම අත්‍යාවශ්‍යය. විප්ලවය විජයග්‍රහණයට පත්විය හැක්කේ 'පහළ පංතිවලට' පැරණි ක්‍රමයෙන් ජීවත්වීම එපා වූ විට සහ 'ඉහළ පංතිවලට' පැරණි ක්‍රමයෙන් කටයුතු කරගෙන යාමට බැරිව ගිය විටය."

**ලෙනින්**
**තෝරා ගත් කෘති,**
**10 වැනි වෙළුම,**
**204-205 පිටු**

# ශිෂ්ටත්වය උදෙසා '20'

"අපේ ජීවිත , අපේ රට, අපේ පරිසරය මේ සියල්ල තනි පුද්ගලයෙකු යටතට පත් කරන්න ඕනෑද? ඒ නිසා අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී ශිෂ්ට සම්පන්න පාලනයක් තහවුරු කරන්න ඕනෑ. අද අශිෂ්ටත්වය වෙනුවෙන් පෙනී ඉන්න පිරිසක් ජනමතය වෙනස් කරන්න හදනවා. 20ට එරෙහි සටන් පාඨය නියෝජනය කරන්නේ ජාතිවාදීන්. ජාතිවාදය කියන්නේ ගෝත්‍රවාදයක්. ඒ නිසා අපට ශිෂ්ටත්වය පිළිබඳව, මනුෂත්වය පිළිබඳව අරගලයක් තිබෙනවා. ඒ වෙනුවෙන් සියලු දෙනාට එකතු වෙන්න කියල අපි ආරාධනා කරනවා." - අනුර දිසානායක

ජනතා විමුක්ති පෙරමුණ විසින් 20වැනි ව්‍යවස්ථා සංශෝධනය ලෙස විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමේ යෝජනාව පාර්ලිමේන්තුවට ගෙන එමට පෙර සිටම ඇතැම් පිරිස් කලබල වී සිටියේ බෙලි ගෙඩියක් වැටුණු ශබ්දය අසා ලෝකය පෙරළෙනවා යැයි කියා දිවූ හාවා සේය.

විවිධාකාර බලලෝභීන් ව්‍යාජ මත වපුරවා ජනතාව නොමඟ යැවීමට උත්සාහ කරමින් සිටියදී 'වෙනසක ඇරඹුම' සංවිධානය විසින් "ශිෂ්ටත්වය වෙනුවෙන් සම්මත කළ යුතු 20" යන තේමාව යටතේ පසුගිය මැයි 16වැනිදා කොළඹ පදනම් ආයතනයේ සම්මන්ත්‍රණයක් සූදානම් කර තිබුණේ ජ.වි.පෙ. විසින් යෝජනා කළ 20වැනි සංශෝධනය පිළිබඳ සමාජ කතිකාවක් ඇති කිරීමේ අරමුණෙනි.

මේ සම්මන්ත්‍රණයේ ප්‍රධාන දේශනය ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා විසින් පවත්වන ලද අතර සෙසු දේශනයන් නීතිඥ සංගමයේ හිටපු සභාපති නීතිඥ ජෙෆ්රි අලගරත්නම්, ප්‍රවීණ සාහිත්‍යවේදී ගුණසේන විතාන, හිටපු අමාත්‍යංශ ලේකම් අශෝක පීරිස් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අතුල සමරකෝන් යන මහත්වරුන් විසින් පවත්වන ලදී. මේ අවස්ථාව සඳහා විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, විද්වතුන්, කලාකරුවන් ආදී සමාජයට මතවාදී ලෙස බලපෑම් කළ හැකි විශාල පිරිසක් සහභාගි වී සිටිනු දක්නට ලැබුණි.




# විදෙස් වම සහ ජ.වි.පෙ. අතර සාකච්ඡා



ජ.වි.පෙ. රතු මැයි පෙළපාලිය සහ රැලියට ජාත්‍යන්තර සහයෝගය පළකරනු වස් විදෙස් වාමාංශික පක්ෂ නියෝජනය කරමින් නියෝජිතයෝ කිහිප දෙනෙක් සහභාගි වූහ. මොවුහු ග්‍රීසිය, ස්වීඩනය, ඉන්දියාව සහ නේපාලය යන රටවල් නියෝජනය කළහ.

රටේ ප්‍රධාන යැයි කියා ගන්නා දේශපාලන පක්ෂ මැයි දිනය සැමරීමට ගොස් තම නොහැකියාව ප්‍රදර්ශනය කරද්දී එනම් එ.ජා.ප.ය සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනයට කොටු වෙමින්ද, ශ්‍රීල.නි.ප.ය මඩකලපුවට පලාගොසින්ද, මහින්ද රාජපක්ෂගේ පොහොට්ටු පක්ෂය අගනුවරින් බැහැරව ගාල්ලේදීද සමුළු සහ රැස්වීම් පවත්වද්දී විදෙස් නියෝජිතයින්ගේද සහභාගිත්වය ඇතිව ආකර්ෂණීය පෙළපාලියක් සහ දැවැන්ත රැලියක් පැවැත්වීමට ජ.වි.පෙ. සමත් විය.

එසේම මැයි 08වැනිදා බත්තරමුල්ල, පැලවත්ත පිහිටි ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයට පැමිණි විදෙස් නියෝජිතයින් සහ පක්ෂයේ නියෝජිතයින් අතර සාකච්ඡා කිහිපයක්ද පැවැත්විණි. මේ සාකච්ඡා සඳහා ජ.වි.පෙ. නියෝජනය කරමින් ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා, ප්‍රචාරක ලේකම් විජිත හේරත්, දේශපාලන මණ්ඩල සභිකයින් වන ලාල් කාන්ත, බිමල් රත්නායක, මධ්‍යම කමිටු සාමාජිකයින් වන වෛද්‍ය නලින්ද ජයතිස්ස, වසන්ත සමරසිංහ, වෛද්‍ය එච්.පී. ධම්මික, රාමලිංගම් චන්ද්‍රසේකර් යන සහෝදරවරුන්ද, ග්‍රීසියේ කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරක සභික නිකලොස් සෙරටකිස්, ස්වීඩනයේ කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරක සභික ඔගස්ටස් එමානුවෙල් එලිසැසන්, ඕල් ඉන්ඩියා ෆෝවර්ඩ් බ්ලොක් පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ උප සභාපති කදිරවන් විරුමාණ්ඩි, නේපාල කොමියුනිස්ට් පක්ෂයේ (එක්සත් මාක්ස් ලෙනින්වාදී) දේශපාලන මණ්ඩල සභික පශුපති චෞලගේන් සහ එම පක්ෂයේ මධ්‍යම කාරක සභික රබීන්ද්‍ර අධිකාරි යන සහෝදරුන් සමග මේ සාකච්ඡා වට පැවැත්විණි.

# කාල් මාක්ස්ට 200යි

"විද්‍යාඥයකු, විප්ලවවාදියකු සහ නිර්ධන පංති නායකයකු හැටියට ඔහුගේ ජීවිතය උදාරශීලී සහ පරිත්‍යාගශීලී ලෙසත් පොදු ජනතාවට කැප විය. මාක්ස් කිට්ටුවෙන් දැන සිටි මිනිසුන්ගේ කතා අනුව, යෞවන කාලයේදීත්, පශ්චාත් කාලයේදීත් මාක්ස්ගේ ප්‍රියතම ප්‍රකාශනයක් වූයේ, 'පොදු ජනතාව සඳහා වැඩ කිරීමය'." - (කාල් මාක්ස් ජීවන චරිතය යෙව්ජිනියා ස්තෙපානොවා)

විද්‍යාත්මක කොමියුනිස්ට්වාදයේ ආදී කර්තෘවරයා වන කාල් මාක්ස් සහෝදරයා වර්ෂ 1818 මැයි 05දා ජර්මනියේ ට්‍රියර් නගරයේදී උපත ලැබීය. පොදු ජනතාව වෙනුවෙන් තම ජීවිතය කාලයම කැප කරමින් දයලෙක්තික භෞතිකවාදී දර්ශනය ලොවට දායද කළ මාක්ස් සහෝදරයාගේ 200වැනි ජන්ම සංවත්සරය 2018 මැයි 05 වෙනිදාට යෙදී තිබුණි.

මෙය පදනම් කර ගනිමින් ලෝකයේ බොහෝ රටවල වාමාංශික ව්‍යාපාර සැමරුම් උත්කර්ෂවත් අන්දමින් සමරන ලද අතර චීන කොමියුනිස්ට් පක්ෂයේ මෙම උත්සවය සඳහා ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයාද, නේපාලයේ කොමියුනිස්ට් පක්ෂයේ සැමරුම සඳහා ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහ පාර්ලිමේන්තු මන්ත්‍රී නලින්ද ජයතිස්ස යන සහෝදරවරුද සහභාගි වූහ.

තවද පසුගිය මැයි 11වැනිදා කොළඹ මහවැලි කේන්ද්‍රයේදී කාල් මාක්ස්ගේ 200වැනි ජන්ම දිනය නිමිත්තෙන් ප්‍රාග්ධනය 03වැනි වෙළුමේ සිංහල පරිවර්තනය ජනගත කිරීමේ උත්සවයේ විශේෂ දේශනයක් ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා විසින් පවත්වන ලදී.

මෙහි ප්‍රධාන දේශනය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දර්ශනය පිළිබඳ සම්මානනීය මහාචාර්ය ඩෙස්මන් මල්ලිකාරච්චි මහතා විසින් පැවැත්වූ අතර ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධාන ලේකම්




ඩිව් ගුණසේකර සහ දාස් කැපිටාල් කෘතියෙහි සිංහල පරිවර්තක ජයතිලක සිල්වා මහතාද මෙහි දේශන ඉදිරිපත් කළහ.

කොළඹ දිස්ත්‍රික් විද්වත් සංසදය මගින් මෙම සැමරුම සංවිධානය ගත කර තිබුණි.

# විධායකය අහෝසි කරන '20' භාරදෙයි



ජනතා විමුක්ති පෙරමුණ විධායක ජනාධිපති ක්‍රමට එරෙහි වූයේ ජේ.ආර්. විසින් එය මෙරට ස්ථාපිත කරන ලද 1978 අවධියේ සිටය. විටෙක ජනාධිපති අපේක්ෂකයන් ලවා පොරොන්දු ලබා ගනිමින්ද, තවත් විටෙක පොරොන්දු කඩකිරීමට එරෙහිව උද්ඝෝෂණ ව්‍යාපාර දියත් කරමින්ද විධායක ජනාධිපති ධුරය එරෙහිව කටයුතු කළ ඉතිහාසයක් ජ.වි.පෙ.ට ඇත.

ධනපති ආණ්ඩු දුර්වල වූ සෑම අවස්ථාවකම ජ.වි.පෙ. ජනතාවට කිසියම් ප්‍රජාතන්ත්‍රවාදී ඉඩකඩක් විවෘත කරගැනීමට එය අවස්ථාව කරගෙන තිබේ. ජ.වි.පෙ. මේ මෙහොතේද උත්සාහ කරමින් සිටින්නේ, දුර්වල ධනපති කණ්ඩායම්වල අර්බුද යොදා ගනිමින් ඒකාධිපති විධායක ජනාධිපති ධුරය අහෝසි කර රටේ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී ඉඩකඩ පුළුල් කරගැනීමටය.

ඒ අනුව පසුගිය මැයි 25වැනිදා ජ.වි.පෙ. පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත් සහෝදරයාගේ පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ලෙස විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙන එනු ලබන 20වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත පාර්ලිමේන්තු මහ ලේකම් ධම්මික දසනායක මහතා වෙත බාර දෙන ලදී. ජ.වි.පෙ. නායක අනුර දිසානායක, නිහාල් ගලප්පත්ති, වෛද්‍ය නලින්ද ජයතිස්ස යන සහෝදරවරු සහ කථානායකවරයා මේ අවස්ථාවට සහභාගි වී සිටියහ.


# ප්‍රාග්ධනයේ සූරාකෑම හඳුනා ගැනීමට 'ප්‍රාග්ධනය' කියවීම

අද ලාංකේය ධනවාදී පාලනය දිනෙන් දින අර්බුදයේ ගිලෙන බව නොරහසකි. ධනවාදී ආණ්ඩුව එකිනෙකාගේ පාලන සමයන්ට විවේචන එල්ල කර ගනිමින් සිටී. වර්තමාන පාලකයෝ අතීත පාලකයින් විවේචනය කරති. අතීත පාලකයෝ වර්තමානයට දොස් කියති. එකම ධනවාදී ආර්ථික ක්‍රමයක් පාලනය කරන දෙපිරිස එකිනෙකා විවේචනය කරගනිමින් එකම පාරක ගමන් කරති. ආර්ථික අර්බුදයේ ප්‍රකාශනය ලෙස ණය අර්බුදය, බඩු මිල, ඉන්ධන මිල, උද්ධමනය, විරැකියාව, බදු පිට බදු පැනවීම මතුපිට තලයේ ප්‍රකාශනයක් ලෙස ජනතාවට ප්‍රදර්ශනය වෙයි. නමුත් පාලකයින් සේම ජනතාවද ඇත්ත අර්බුදයත්, අර්බුදයේ ඇත්ත හේතුවත් හඳුනාගත නොහැකිව අතරමංව සිටී. රාජිත සේනාරත්නගේ ජාතිවාදී ප්‍රකාශයකට ප්‍රහාර එල්ල කිරීම මගින් බඩු මිල හා ඉන්ධන මිල යට කර දැමීමට පාලකයිනුත් ජනමාධ්‍යත් සමත් විය. රාජිතගේ ප්‍රකාශයත්, බඩු මිල, ඉන්ධන මිලත් තවත් බොහෝ අර්බුදයනුත් ගංවතුර විසින් දැන් තාවකාලිකව යටපත් කර ඇත. ඒ නිසා අපි හැම අර්බුදයේ කරවටක් ගිලී එහෙත් අර්බුදයක් නැති ගාණට දෛනික ජීවිතයට මුහුණ දෙමින් සිටිමු. නමුත් හෙට හිරු පායන සේම අර්බුදයද අලුත් වටවලින් තවත් තීව්‍ර වන බව පැහැදිලිය.

මෙවැනි වටපිටාවක් තුළ මෙම ධනවාදයේ පොදු අර්බුදයේ සූත්‍රය කියවා ගැනීමට අපට මහඟු උපකාරයක් ලෙස ශ්‍රේෂ්ඨ ගුරුවර කාල් මාක්ස්ගේ 200වැනි ජන්ම සංවත්සරය වෙනුවෙන් මාක්ස් විසින් රචිත ප්‍රාග්ධනය කෘතියේ 3වැනි වෙළුමේ සිංහල පරිවර්තනය ජනගත කිරීම පසුගියදා සිදු කෙරිණි. එම අවස්ථාවේදී ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා විසින් සිදු කළ දෙසුම ධනවාදයේ වත්මන් අපේ සමාජයේ අර්බුදය පොදු ඇසකින් දැකීමටත් ඒ සඳහා 'ප්‍රාග්ධනය' ජනගත කිරීම මගින් කාල්මාක්ස් සහෝදරයා සිදු කළ මෙහෙවර තේරුම් ගැනීමටත් වඩා ඉවහල් වේ යැයි නියමුවා අපි අදහස් කළෙමු. ඒ නිසා එම දේශනය ඇසුරින් මෙම ලිපිය සකස් කෙරිණි.

අප ජීවත්වනුයේ, ධනවාදය තම යෞවන අවධිය අවසන් කර මහලු, මරණාසන්න අවධියට පැමිණි අවස්ථාවේය. ධනවාදය තම නිදහස් අවධිය පසු කර ඒකාධිකාරී, අධිරාජ්‍යවාදී අවධියට පැමිණ එහි අගභාගයේ ගත කරන බැවින් ධනවාදයේ සියලු දුෂ්ටකම්, කුරිරුකම් අපට පෙනෙන අතරම ඒවා නොපෙනෙන ලෙස වසා ගැනීමටද ධනවාදය උත්සාහ දරයි. මාක්ස්වාදය විසින් සිදුකර ඇත්තේ ධනවාදයේ මෙම දුෂ්ට කෲරකම හෙළිදරව් කිරීමය. 'ප්‍රාග්ධනය' කෘතිය මගින් මාක්ස් සිදු කළේ ධනේශ්වර සූරාකෑමේ යාන්ත්‍රණය ලොවට හෙළිකිරීමය. ලාභය යනු වැටුප් ශ්‍රමිකයාට නොගෙවන ලද ශ්‍රමයේ සූරාකන ලද කොටස බව හෙළිකළේ 'ප්‍රාග්ධනය' කෘතිය මගිනි. මාක්ස්වාදය සමාජය තේරුම් ගැනීමටත් සමාජය වෙනස් කිරීමටත් මඟ පෙන්වන දර්ශනයක් වන්නේ මෙම තත්වය තුළය.

මාක්ස් ඉපදී සියවස් දෙකකි. 'ප්‍රාග්ධනය' කෘතිය බිහිකර සියවස් එකහමාරකි. එතරම් කාලයක් ගතවී ඇතත් අදටද එම කෘතියේ අඩංගුව අභියෝගට ලක්වී නැත. එපමණක් නොව යළි යළිත් එහි නිරවද්‍යතාව තහවුරු වෙමින් තිබේ.



## මාක්ස් කවුද?

කාල් මාක්ස් 1818 මැයි මස 05වැනි දින ජර්මනියේදී (එවකට ප්‍රසියාවේ) උපත ලදී. බර්ලින් හ බොන් සරසවිවල උපාධි හැදෑරූ මාක්ස් මුලින් නීති විෂයටත් පසුව ඉතිහාසය හා දර්ශනවාදයටත් යොමු විය. වයස අවුරුදු 23දී (1841) "එපියුරස්ගේ දර්ශනය" පිළිබඳව තම ආචාර්ය නිබන්ධනය සම්පාදනය කරමින් මාක්ස් සරසවි අධ්‍යාපනයට සමු දුන්නේය. පසුව එවකට දාර්ශනිකයින් වූ හෙගල්, ෆොයබාග් වැනි දාර්ශනිකයින්ගේ දර්ශනවාදයන් හදාරමින් "දයලෙක්තික භෞතිකවාදය" නිර්මාණය කිරීමේලා පුරෝගාමී වූයේ ඔහුය. මාක්ස් විසින් විශාල කාලයක් වැය කර එතෙක් ආධිපත්‍යය දරමින් සිටි නිල ආර්ථික විද්‍යාවේ සැඟවූ සත්‍යය හෙළිකිරීමට 'ප්‍රාග්ධනය' කෘතිය රචනා කරන ලදී.

වමේ ව්‍යාපාරයට මාක්ස් වැදගත් වන්නේ ඇයි? ඔහු දාර්ශනිකයෙකි. එපමණක් නොව ඔහු වමේ ව්‍යාපාරයේ ක්‍රියාශීලී නායකයෙකි. විප්ලවාදියෙකි. ඔහුගේ විශේෂත්වය වූයේ, ඔහු සොයාගත් දර්ශනය දර්ශනවාදී විෂය පථයට සීමා නොකර එය පීඩිත පංතිය වෙත ගෙන ඒමයි.

මාක්ස්වාදය කම්කරු පංතිය තුළින් තමන්ගේ ද්‍රව්‍යමය බලවේගය සොයාගත්තේය. කම්කරු පංතිය මාක්ස්වාදය තුළින් තමන්ගේ අධ්‍යාත්මික අවිය සොයාගනු ලැබීය. එනම් මාක්ස් විසින් තම දර්ශනය ක්‍රියාවට නැගීමට අවශ්‍ය ද්‍රව්‍යමය බලය කම්කරු පංතිය තුළින් සොයාගනු ලැබීමය. එසේම කම්කරු පංතිය විසින් සිය අධ්‍යාත්මික අවිය බවට මාක්ස්වාදය පත්කර ගැනීමය. ප්‍රතිඵලය වූයේ මාක්ස්වාදය හුදකලා වියුක්ත දර්ශනයක් වීම වෙනුවට සමාජය වෙනස් කරන දර්ශනයක් වීමය.

පීඩිත පංතිය වෙනුවෙන් හඬ නැගූ දර්ශනය වූ නිසාම මාක්ස්වාදය බොහෝ විවේචනයන්ට ලක්විය. ප්‍රෑදොන් විසින් මාක්ස්වාදය විවේචනය කරමින් "දුගී බවේ දර්ශනය" ලියන ලදී. මාක්ස් එයට පිළිතුරු සැපයුවේ, "දර්ශනයේ දුගීභාවය" නම් කෘතියෙනි. එමගින් ප්‍රෑදොන්වාදයේ බොහෝ මිත්‍යා කරුණු බිඳ දමන ලදී. මාක්ස් පීඩිත පංතියට දර්ශනයක් බිහි කළ විශිෂ්ට දාර්ශනියකි.

## ඉතිහාසය ද්‍රව්‍යමය පදනමින් දැකීම

බොහෝ විට අප ඉතිහාසය හදාරා ඇත්තේ විඥානවාදී පදනමිනි. නමුත් කාල් මාක්ස් විසින් පළමු වරට ඉතිහාසය ද්‍රව්‍යමය පදනමින් විග්‍රහ කරන ලදී. අප ධනවාදී අධ්‍යාපනය තුළ ඉගෙන ගන්නා ඉතිහාසය එකිනෙකට අසම්බන්ධිත සිදුවීම වැලකී. එය රජවරුන්ගෙන් සිටුවරුන්ගෙන් වීරයින්ගෙන් පිරී ඇත. එම ඉතිහාසයේ සාමාන්‍ය මිනිසුන් නොමැත. ධනේශ්වර ක්‍රමය විසින් ඉතිහාසය ලියා උගන්වා ඇත්තේ මිනිසුන් විසින් නිර්මිත මහා දැවැන්ත දේ කාගේ හෝ රජකුගේ නමටය. අප රටේ වැව්වලට අයිති රජවරු සිටියහ. දාගැබ් හැදූ රජවරු සිටියහ. චීනයෙන් ණය ගෙන හම්බන්තොට වරාය හැදූ, රටම ණය කළ රජවරු වර්තමානයේද සිටිති. බර්ටෝල් බ්‍රෙෂ්ට්, මේ පිළිබඳව වරෙක විවේචනය කරමින් විමසා සිටියේ, 'අධිරාජ්‍යයින් යුද්ධ කරන විට ඔවුන් සමග කෝකියකුවත් නොසිටියේද' කියාය.

මාක්ස් එම ධනවාදී මතයට පටහැණිව "ඉතිහාසය ගොඩ නගන්නේ මිනිසුන් බව පැහැදිලිව කියා සිටියේය. මාක්ස් තමන්ගේ **"ලුවී බොනපාට්ගේ බෲමර් 18" ලිපියේ මෙසේ සඳහන් කරයි. "මිනිස්සු ඉතිහාස නිර්මාණය කරති. ඔවුන් එසේ කරන්නේ තමන්ට රිසි පරිදි නොව ඉතිහාසය විසින් ලබා දී ඇති තත්වයන් යටතේය."** මාක්ස් විසින් ඉතිහාසය ගොඩනැගීමේ දයලෙක්තිකය මනාව විග්‍රහකර ඇත.

## ලාභය හා ප්‍රාග්ධනය

මාක්ස්වාදී දෘෂ්ටියකින් ලෝකය දෙස බලන අයකුට වැරදීමට ඉඩක් නොමැතිවීමට හේතුව එය අසම්බන්ධිත එකතුවක් ලෙස නොව එය ආරම්භයේ සිට අග දක්වා ධාරාවක් ලෙස තේරුම් යාමය. ලෝකයේ සිදු වූ සෑම වෙනස්කමක්ම නිෂ්පාදනය මත පදනම් වී ඇත. වර්තමානයේ අප ජීවත්වන ධනවාදයේ ඇති පැටලිල්ලද ඔවුන් මෙම අර්බුදය හුදකලා සිදුවීම් ලෙස දැකීමය. අප ජීවත් වන සමාජයේ ඇති ආර්ථික අර්බුදය, සමාජ අර්බුදය, සංස්කෘතික අර්බුදය මේ සියල්ල නිෂ්පාදන ක්‍රියාකාරිත්වය හා බැඳී ඇති ගැටලු ලෙස මාක්ස් දුටුවේය. වත්මන් පරිභෝජනවාදී සමාජය ගොඩනගා ඇත්තේ ධනවාදය විසිනි. ධනවාදයේ පැවැත්ම ඇත්තේ ප්‍රාග්ධනය තුළය. ප්‍රාග්ධනයේ පැවැත්ම ඇත්තේ ලාභය මතය. ලාභය නැතිනම් ප්‍රාග්ධනයක් නැත. ප්‍රාග්ධනයක් නැතිනම් ධනවාදයේ පැවැත්මක් නොමැත. ප්‍රාග්ධනය පැවැතීමට වැඩිපුර ලාභ අවශ්‍යය. ඒ සඳහා අවශ්‍ය මෙන්ම අනවශ්‍ය භාණ්ඩද විකිණිය යුතුය. ඒ සඳහා ඔවුහු වෙළඳපොළක් හදති. වෙළඳපොළ ප්‍රාග්ධන හිමියන් හා වෙළෙන්දන් විසින් මෙහෙය වනු ලබයි. ප්‍රාග්ධන හිමියා භාණ්ඩ පමණක් නොව එම භාණ්ඩ මිලදී ගන්නා මිනිසෙකුද නිපදවයි. අපේ සමාජයේ බොහෝ දෙනා ප්‍රාග්ධනය විසින් නිපදවන ලද පාරිභෝගිකයින්ය. අප පරිභෝජනය කරන දේ කවරාකාරද යන්න තීරණය කරන්නේද ප්‍රාග්ධන හිමියා විසින්මය. අප සමාජයේ ඇත්තේ ප්‍රාග්ධනය විසින්, වෙළඳපොළ විසින් හසුරුවන සමාජයකි. එය ප්‍රාග්ධනය කෘතියේ මාක්ස් විසින් නිවැරදිව විග්‍රහ කර ඇත.


## ප්‍රාග්ධනයේ හරය අතිරික්ත වටිනාකම

ප්‍රාග්ධනය කෘතියේ වටිනාම සොයාගැනීම වන්නේ, අතිරික්ත වටිනාකම පිළිබඳ න්‍යායයි. ලෙනින් මෙය පැහැදිලි කළේ, "මාක්ස්ගේ ආර්ථික න්‍යායේ මුල්ගල අතිරික්ත වටිනාකම පිළිබඳ න්‍යාය" ලෙසය. ප්‍රාග්ධන හිමියාගේ ලාභය යනු ඔහුට අයිති දෙයක් නොව වැටුප් ශ්‍රමිකයින් සූරාකෑම මගින් එකතු කර ගන්නා වැටුප් ශ්‍රමයට නොගෙවන ලද එකතුව බව මාක්ස් මෙහිදී නිවැරදිව හෙළිදරව් කළේය.

ප්‍රාග්ධන හිමියා අපට වැටුප් දී මිලදී ගනු ලබන්නේ අපගේ ශ්‍රම ශක්තියයි. ශ්‍රමය ධනවාදය තුළ වෙළඳ භාණ්ඩයකි. ශ්‍රමිකයා කෑ ගසමින් තමන්ගේ වෙළඳ භාණ්ඩ වන ශ්‍රමය මිලදී ගන්නා ලෙස ඉල්ලා සිටී. ශ්‍රම වෙළඳපොළක් ඇත. ශ්‍රම අතිරික්තයක් ඇත. එම ශ්‍රමය මිලදී ගැනීමේදී විශේෂයක් ඇත. එනම් ධනවාදය තුළ ඕනෑම භාණ්ඩයක් මිලදී ගන්නා විට මුදල් දී භාණ්ඩය මිලදී ගනී. භාණ්ඩය ලබා ගන්නා විට මුලින් මුදල් ගෙවයි. නමුත් ශ්‍රමය මිලදී ගැනීමේදී එසේ නොවේ. ශ්‍රමය භාවිතා කර පසුව මිල ගෙවයි. දෛනික වැටුප් ශ්‍රමිකයාටද ශ්‍රමයේ මිල ගෙවන්නේ දිනය අවසානයේදීය. මිලදී ගැනීමට කලින් ශ්‍රමයට මිල නොගෙවයි. ශ්‍රමය නැමැති භාණ්ඩය පරිභෝජනය කල පසු මුදල් ගෙවයි. හැම භාණ්ඩයක්ම මුදල් ගෙවා මිලදී ගන්නා නමුත් ශ්‍රමය ලබාගෙන පරිහරණය කර පසුව මුදල් ගෙවයි. අප භාවිතා කරන හැම භාණ්ඩයක්ම භාවිතයේදී ගෙවී යයි. ක්ෂය වේ. නමුත් ශ්‍රමය එසේ නොවේ. භාවිතයේදී ගෙවීයනු වෙනුවට නව වටිනාකම නිපදවයි. මෙම නව වටිනාකම ප්‍රමාණය ධනපතියා ලාභය ලෙස උදුරා ගනී.

## මිත්‍යා ප්‍රාග්ධනය

වර්තමාන අධිරාජ්‍යවාදයේ ඇති ගැටලුද මාක්ස් ප්‍රාග්ධනය කෘතියේදී 15 වැනි පිටුවට



"ඉතිහාසය පිළිබඳ ද්‍රව්‍යවාදී සංකල්පය හා අතිරික්ත වටිනාකම මගින් ධනපති ක්‍රමයේ නිෂ්පාදනයේ රහස හෙළිදරව් කිරීම යන මේ සොයා ගැනීම් දෙක අප හමුවේ තැබුවේ මාක්ස්ය. මෙම සොයාගැනීම් සමගම සමාජවාදය විද්‍යාවක් බවට පත්විය. ඊළඟට කළ යුතු වූයේ එහි විස්තර හා සම්බන්ධකම් සියල්ල පැහැදිලි කිරීමය.."

**ෆෙඩ්‍රික් එංගල්ස්**
**සමාජවාදය මනෝ රාජ්‍යයෙන් විද්‍යාවට,**
**61 පිටුව**

# රතු මැයි දිනයේ ජාත

ජනතා විමුක්ති පෙරමුණ විසින් යාපනයේදී සහ කොළඹදී පවත්වන ලද මැයි දින සමරු රැලි සඳහා සුභපැ
අදහස්වල ලිඛිත සටහනක් කාලීන වැ



## කම්කරු පංතියේ සමගිය අපේ අපේක්ෂාවයි

ග්‍රීක කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරක සභික
නිකොලොස් සෙරටකිස් සහෝදරයා

ග්‍රීක කොමියුනිට් පක්ෂය ඔබගේත් ජාත්‍යන්තරයේත් අරගලවලට සහයෝගීතාව පළකිරීමට සූදානම්. චිකාගෝ අරගලයේ සිට අද දක්වා අපේ සියලු නිර්ධන පංතික අරගලවල ප්‍රධානතම අවියක් වන්නේ ජාත්‍යන්තරවාදයයි. මේ ස්ථාවරයට සහය දක්වන ග්‍රීක කොමියුනිස්ට් පක්ෂය, අපේ රට තුළ සිටින ශ්‍රී ලාංකිකයන්ද ඇතුළු සංක්‍රමිකයින්ගේ අරගලයට සහය දෙනවා. සියලු විදේශීය කම්කරුවන්ගේ සටන්වලදී අප උරෙන්උර ගැටී සටන් වදිනවා. කම්කරු අයිතීන් වෙනුවෙන්, ළමුන්ගේ අධ්‍යාපන අයිතීන් වෙනුවෙන්, හාම්පුතුන්ගේ සූරාකෑමට එරෙහිව, පැසිස්ට්වාදී වර්ගවාදී කණ්ඩායම්වල තර්ජනයන්ට එරෙහිව අප සංක්‍රමණිකයන්ට සහය දෙනවා. ඔවුන් සහ අපේ රටේ කම්කරුවන් සංවිධානය කිරීමටත් එක්සත් කිරීමටත් අපි වෙහෙස වෙනවා. ඔවුන් පැමිණියේ කුමන රටෙන්ද, ඔවුන් කුමන ජාතියට අයත්ද කුමන ආගමක් අදහන්නේද යන්න නොසලකා ධනේශ්වර බලවේගවලට එරෙහිව සටන් වැදීමට අප ඔවුනට සහය පළකරනවා. එසේම කම්කරුවන් බෙදීමටත් නොමඟ යැවීමටත් ජාතිවාදය අනුව සිදුකරන සංස්කෘතික ප්‍රතිවිරෝධයටත් කොන්කිරීමටත් අප විරෝධය පළකරනවා.

අද වන විට ධනවාදය ඉහළ යන ආක්‍රමණශීලීත්වයකින් ලොව පුරා ක්‍රියාත්මක වෙනවා. එය සුවිශේෂී ලක්ෂණයක් ලෙස පැහැදිලිව දැකිය හැකියි. එහෙත් කම්කරු ජනතාවටත් නව උපක්‍රමයන් තුළ අරගල කිරීමට සිදුව තිබෙනවා. ඔවුන් ධනවාදයේ ගොදුරු බවට පත්විය යුතු නැහැ. දරිද්‍රතාවය, විරැකියාව, සරණාගතභාවය තුළ මිය යා යුතු නැහැ. ධනවාදය තමන්ගේ ආක්‍රමණශීලීත්වය තීව්‍ර කර තිබෙන්නේ ධනවාදී ආර්ථිකයන් මුහුණදී සිටින අර්බුදය නිසයි. ඔවුන් මුහුණ දෙන තරගය තුළ ඒකාධිකාරයන් ගොඩනැගෙමින් තිබෙනවා. අධිරාජ්‍යවාදී සන්ධානයන් නිර්මාණය වෙමින් තිබෙනවා. වෙළඳපොළවල්, ස්වාභාවික සම්පත්, බලශක්ති මාර්ග, පාරිභෝගික ද්‍රව්‍ය තමන් යටතට ගැනීම තීව්‍ර කරමින් සිටිනවා.

අතරමැද සමාදානයකට පැමිණිය නොහැක්කේ මන්ද? අධිරාජ්‍යවාදයට නිමාවක් නැහැ. එය විසින් ඇති කරනු ලබන විනාශය ඉවසීමට නොහැකියි. අද ධනවාදී සමාජ හැඩගැස්ම වෙනස් කිරීම සඳහා අරගලයක් අවශ්‍ය වන්නේ මේ නිසයි. සූරාකෑමෙන් තොර, මර්දනයෙන් තොර සමාජවාදී සමාජයක් අන් කවරදාකටත් වඩා අද අපට අවශ්‍ය වී තිබෙනවා. ප්‍රතිවිප්ලවයට සමාජ සංවර්ධනය නතර කළ නොහැකියි. කෙසේ වුවද එය අපට පාඩම් උගන්වනවා. සමාජවාදී විප්ලවයේ නියාමයන් අප විසින් අනුගමනය කිරීමේ අවශ්‍යතාවය අපට කියා දෙන්නේ එයයි.

සෝවියට් සංගමයේ වේදනා සහගත අත්දැකීම් සහ සමාජවාදී සමාජ සංවිධානයේ බිඳවැටීම සමාජවාදී වෙළඳපොළත් පෞද්ගලික හිමිකාරිත්වයත් සූරාකන සමාජ සංවිධානයත් සමග වැඩකරන ජනතා බලයක් එකට ගමන් නොකරන බව අපට පෙන්වා දෙයි. කම්කරුවන්ට සූරාකන්නන් සමග පොදු වුවමනා එපාකම් ඇත්තේ නැහැ. ඔවුන් අතර ඒකමතියක් සමගියක් නැහැ. අපේ රටේ සමාජ ප්‍රජන්ත්‍රවාදී සයිරිසා සහ අනෙල් දක්ෂිණාංශික ජාතිකවාදී පක්ෂයේ සන්ධාන ආණ්ඩුව ප්‍රාග්ධනය සහ ධනවාදයේ ලාභය වෙනුවෙන් ජනතාවගේ ආදායම් බිඳදමමින් සිටිනවා. විශ්‍රාම වැටුප් කපා දමමින් සිටිනවා. වැඩවර්ජනය කිරීමේ අයිතිය පාගා දමනවා. එක්සත් ජනපදයේත් ඕනෑම අධිරාජ්‍යවාදී බලවේගයකත් වුවමනාකම් වෙනුවෙන් පෙනී සිටිනවා.

ඊට එරෙහිව අපි වැඩකරන ජනතාව සහ අන් සියලු ජනතාව සමග ඒකාබද්ධව කොමියුනිස්ට් අරගලය තුළ සිටිනවා. කම්කරු පංතියේ සමගිය අපේ අපේක්ෂාවයි. කම්කරු ජනතාව, කුඩා සහ මධ්‍යම පරිමාණ ගොවීන්, අඩු ආදායම් ලබන මධ්‍යම සමාජ ස්ථරයන් අතර සමාජ සන්ධානයක් වෙනුවෙන් අපි පෙනී සිටිනවා.

මෙම අදහස් ලංකාවේ කම්කරු ජනතාව සමග බෙදා ගැනීමට අවස්ථාව ලබාදීම ගැන ජනතා විමුක්ති පෙරමුණට ස්තුතිවන්ත වෙනවා. ලෝකයේ සියලු කම්කරුවනි එක්වව්!

## ලෝකය වමේ හා ප්‍රගතිශීලී බලවේගවල පුළුල් සමගියක් ඉල්ලා සිටිනවා

නේපාල එක්සත් මාක්ස් ලෙනින්වාදී කොමියුනිස්ට් පක්ෂයේ
දේශපාලන මණ්ඩල සභික හා පාර්ලිමේන්තු මන්ත්‍රී
පසුපති චෞලගේන් සහෝදරයා



නේපාලයේ මාක්ස් ලෙනින්වාදී කොමියුනිට් පක්ෂය වෙනුවෙනුත් නේපාල ආණ්ඩුව වෙනුවෙනුත් නේපාල ජනතාව වෙනුවෙනුත් ඔබ සැමට සුභපැතුම් එක්කිරීමට කැමතියි.

පසුගියදා නේපාලයේ මාක්ස් ලෙනින්වාදී කොමියුනිට් පක්ෂයත් මාඕවාදී කොමියුනිස්ට් පක්ෂයත් සන්ධානයක් නිර්මාණය කරගනිමින් මැතිවරණයට මුහුණ දුන්නා. ජනතාව ඉතා ඉහළ ප්‍රතිචාරයක් අප වෙත ලබා දුන්නා. ප්‍රතිඵලය වුණේ පාර්ලිමේනතුව තුළ අප සන්ධානයට තුනෙන් දෙකකට ආසන්න ආසන ප්‍රමාණයක් ජයග්‍රහණය කරගැනීමට හැකිවීමයි. දේශපාලන ස්ථාවරත්වය, යහපාලනය, සංවර්ධනය වෙනුවෙන් ජනතාව අපට සහය දුන්නා. නේපාලයට ස්ථාවර ආණ්ඩුවක් ලබාදීමට කොමියුනිස්ට් පක්ෂවලට හැකියාව ලැබුණා. ඒ, 'සෞභාග්‍යමත් නේපාලයක්! ප්‍රීතිමත් නේපාල ජනතාවක්!' යන සටන්පාඨය යටතේයි. ජනතාවගේ බලාපොරොත්තුවත් විශ්වාසයත් යටතේ බලයට පත් අපේ ආණ්ඩුව ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදයන් තුළින් ජනතාවට සහන සලසන්නේ අපේම පක්ෂවල අත්දැකීම් සහ දැක්ම අනුවයි. අපි අපේ පක්ෂවල වෙනස් ප්‍රතිපත්තිමය ස්ථාවරයන්හි වෙනස්කම් එක්සත්වීමට බාධාවක් කරගන්නේ නැහැ. අපි පක්ෂ දෙකෙහි එකතුවෙන් සංසදයක් නිර්මාණය කරගත්තා. එක්සත් දේශපාලන ව්‍යාපාරයක් ලෙස අපි කටයුතු කරගෙන යනවා.

ලොව පුරා අධිරාජ්‍යවාදීන්ගේ විවිධ ක්‍රියාකාරකම් විසින් ජනතාවගේ සතුට විනාශ කරනු ලැබ තිබෙනවා. ගෝලීය මූල්‍ය ධනවාදයේ වර්ධනය විසින් ලොව පුරා බරපතළ ඇති නැති පරතරයක් වර්ධනය කර තිබෙනවා. මේ තත්වය තුළ සූරාකෑමට ලක්වන ජනතාව ඉන් මුදාගැනීමට නායකත්වය දීම සියලු ප්‍රගතිශීලී බලවේගවල අත්‍යවශ්‍ය වගකීමක් වී තිබෙනවා. එසේම ලෝකයේ අනාගතය නිර්මාණය කිරීම වෙනුවෙන් වමේ හා ප්‍රගතිශීලී බලවේගවල පුළුල් සමගියක් ඉල්ලා සිටිනවා.

## අසාධාරණ ...
## කිරීමට හැම...
## යොදා ගත ...



ස්වීඩන් කොමියුනිස්ට් පක්ෂ
මධ්‍යම කාරක සභික
ඔගස්ට් එමානුවෙල් එලි
සහෝදරයා

මේ මොහොතට සම්බන්ධ වීමට ලැබීම අප පක්ෂයටත් මටත් ඔබ පක්ෂය සමගත් ඔබේ රට සමගත් සබඳතා ශක්තිමත් කරගැනීම සඳහා ලැබුණු වටිනා අවස්ථාවක් ලෙස දකිනවා. පළමුවෙන්ම ඒ වෙනුවෙන් ජනතා විමුක්ති පෙරමුණට ස්තූතිය පළ කර සිටිනවා. දැනට මම ලංකාවට පැමිණ දින දෙකක් වෙනවා. මම දැනටමත් ලංකාවේ තත්වය පිළිබඳව බොහෝ දේ අවබෝධ කරගෙන සිටිනවා. කම්කරු පංතියට එරෙහි බදු පිළිබඳවත් ආණ්ඩුවේ නව ලිබරල් ආර්ථික න්‍යාය පත්‍රය පිළිබඳවත් මා දැනගෙන සිටිනවා. මට අයිතීන් වෙනුවෙන් අරගල කරමින් සිටින කම්කරුවන් සහ ශිෂ්‍යයින් මුණගැසීමට අවස්ථාව ලැබුණා.

ශ්‍රී ලංකාවේ සහ ස්වීඩනයේ තත්වයන් අසමාන විය හැකියි. එහෙත් අප දෙරටම ධනවාදී අධිරාජ්‍යවාදී ක්‍රමයක කොටසක්. අප මුහුණ දී සිටින්නේ එකම ගැටලුවලට. විරැකියාවට, වෘත්තීය අයිතීන් කප්පාදු කිරීම්වලට, සහන කප්පාදුවට, පෞද්ගලීකරණයට. අපට සිටින්නේ එකම සතුරෙක්. ඒ, ධනවාදීන්,

අධිරාජ්‍යවාදීන්. අ
ලෝකය පුරාම ධ
වැටුප් හා සුභසා
කප්පාදු කරමින්
සොයමින් සිටින
වහල් ජීවන කො
යටතේ මානව ශ්‍ර
ආනයනය සහ අ
කරමින් සිටිනවා.
අධිරාජ්‍යවාදීන් ර
ආක්‍රමණය කරමි
මත බෝම්බ හෙ
ත්‍රස්තවාදීන්ට උද
ලොව පුරා තව
සම්පත් සොයමි

සතුරා බලවත
පෙනිය හැකියි.
අපට එරෙහි ඔවු
උපක්‍රම ධනවාදී
අර්බුදයේ ඇති බ
ප්‍රකාශනයක්. ධන
දුප්පත්කම, යුද්ධ,
ත්‍රස්තවාදය, දේශ
වෙනස්වීම් වැනි
අර්බුදවලට විසඳ
නොහැකියි. ඉති
අන් කවරදාකටත
එක්සත්ව සතුරා
නව සමාජ ක්‍රමය
වෙනුවෙන්, සමා
වෙනුවෙන් සටන
අපට බලකෙරී ති
මා මෙහි සිටින්
ජාත්‍යන්තර සහ
වෙනුවෙනුයි.

සහෝදරවරු
ඔබට මගේ රට -
- පිළිබඳව තොර

# ...යන්තර සහෝදරත්වය

...තුම් රැගෙන රටවල් ගණනාවක වමේ නියෝජිතයෝ පැමිණ සිටියහ. ඔවුන් විසින් වේදිකාවේදී පළ කරන ලද ...දගත්කම සලකා මෙසේ ඉදිරිපත් කරමු.

## ...ක්‍රමය හෙළිදරව් ... අවස්ථාවක්ම ...යුතුයි



...යේ

...යසන්

...දැන් ...නවාදීන් ...ධන ...ඉහළ ලාභ ...වා. ඔවුන් ...න්දේසි ...මය ...පනයනය ... එසේම ...ටවල් ...න්ද ඒවා ...ළමින්ද ...ව් කරමින්ද ...තවත් ...ත් සිටිනවා. ...ත් ලෙස ... එහෙත් ...න්ගේ ...ක්‍රමය ...වට ...වාදීන්ට ...ගුණ ... ගෝලීය ...ම් සෙවිය ...හාසයේ ...ත් වඩා ...ට එරෙහිව ...ක් ...ජවාදය ...ත් වැදීමට ...තිබෙනවා. ...න් ඒ ...යෝගීතාව ...ති, මා ... ස්වීඩනය ...තුරු

ස්වල්පයක් කිව යුතුයි. ඔබ බොහෝ දෙනෙක් දන්නවා ඇත්තේ ස්වීඩනය සමාජ ප්‍රජාතන්ත්‍රවාදී සුභසාධන රාජ්‍යයක් ලෙසයි. යම් කාලයක ස්වීඩනය සමාජවාදී රටක් ලෙස වරදවා වටහා ගෙනද තිබුණා. නැතහොත් ධනවාදයේ පරමාදර්ශයක් ලෙස හඳුනාගෙන තිබුණා. එහෙත් මෙම චිත්‍රය ව්‍යාජයක්.

ස්වීඩනය අනෙක් ධනේශ්වර රටවල්වලට සාපෙක්ෂව ධනවත් රටක්. එයට විශාල රාජ්‍ය අංශයක් තිබෙනවා. සාපේක්ෂව වඩා හොඳ ජීවන තත්වයක් තිබෙනවා. එය සත්‍යයක්. එහෙත් එසේ වී ඇත්තේ ධනවාදීන් නිසා නෙමෙයි. කම්කරුවන්ගේ අරගල හේතුවෙනුයි. ස්වීඩන් කම්කරු පංතිය නිසාවෙනුයි. අනෙක සෝවියට් සංගමය පැවතීම හේතුවෙනුයි. මේ ද්විත්වයේ බලපෑම නිසා සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය සමග සහයෝග-යෙන් කටයුතු කිරීමටත් දෙවන ලෝක යුද්ධයෙන් පසු සුභසාධන රාජ්‍යයක් නිර්මාණය කිරීමටත් ධනවාදීන්ට සිදුවුණා.

එහෙත් මේ සියල්ල 1980 ගණන්වල නව ලිබරල්වාදය සමගත් සෝවියට් සංගමයේ බිඳවැටීමත් සමග වෙනස් වුණා. අද අපි භුක්ති විඳිමින් සිටි සියල්ල තර්ජනයට ලක්වෙලා. එසේම අතිශය කණගාටුදායක තත්වයට පත්වෙලා. ස්වීඩනයේ කම්කරු ව්‍යාපාරය දුර්වල වී තිබෙනවා. සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය ධනවතුන් විසින් අත්පත් කරගෙන. පංති සහයෝගීතාව, වෘත්තීය සමිති දූෂිත වීම ස්වීඩන කම්කරු ව්‍යාපාරය විනාශ කර දමලා. ඒ වෘත්තීය සමිති තීරණ ගන්නේ හාම්පුතුන්, ධනවතුන් සමගයි. පාසල්, රෝහල්, අනෙකුත් යටිතල පහසුකම් පෞද්ගලීකරණය කෙරෙනවා. අප කලක දුටු සුභසාධන රාජ්‍යය බිඳවැටෙමින් තිබෙනවා. එය රැකගැනීමට කම්කරු ව්‍යාපාරය අසමත්.

අන් කවරදාකටත් වඩා ස්වීඩනය යුරෝපයේ අධිරාජ්‍යවාදයේ ග්‍රහණයට හසුවී තිබෙනවා. ස්වීඩන යුද ගුවන්යානා ලිබියාවට බෝම්බ දැමීමට සම්බන්ධ වුණා. ස්වීඩනයේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුව සිරියාවේ ත්‍රස්තවාදී කණ්ඩායම්වලට මුදල් ලබාදෙනවා. ස්වීඩනය අධිරාජ්‍යවාදී නේටෝ සංවිධානයට වඩ වඩාත් සමීප වෙමින් තිබෙනවා.

ස්වීඩන කොමියුනිස්ට් පක්ෂය ලෙස අප විශ්වාස කරන්නේ මේ සියල්ලට පිළිතුර විය යුත්තේ පංති අරගලය බවයි; සමාජ ආර්ථික සාධාරණත්වය පමණක් බවයි. විප්ලවීය කම්කරු ව්‍යාපාරය පමණක් බවයි. පංතිය පදනම් කරගත් වෘත්තීය සමිති ව්‍යාපාරයක් බවයි. ඒ වෙනුවෙන් අපට ලංකාවෙන් ඉගෙන ගත හැකි දේ තිබෙනවා. ඔබේ කම්කරු ව්‍යාපාරයෙන්, ඔබේ පක්ෂයේ සාමාජිකයන්ගෙන් උගත හැකි දේ තිබෙනවා. අපට ස්වීඩනය තුළ 'ලංකාවවල්' හුඟක් අවශ්‍යයි. ස්වීඩන කම්කරුවන් සමගින් වඩා රැඩිකල් කම්කරු ව්‍යාපාරයක් ගොඩනැගීමට අප තීරණය කර තිබෙනවා. සම්ප්‍රදායික පක්ෂ සහ දක්ෂිණාංශික ජනමාධ්‍ය අපව නිහඬ කිරීමට උත්සාහ කරනවා. ඔවුන් අපව තහනම් කිරීමට පවා තැත් කරනවා. කොමියුනිස්ට් විරෝධීන් අපට එරෙහිව මෙහෙයවනවා.

එහෙත් කොමියුනිස්ට්වාදීන් ලෙස අපට වඩා හොඳ කාලයක් ලැබෙන තෙක් වාඩි වී බලා සිටිය නොහැකියි. මේ අසාධාරණ සමාජ ක්‍රමය හෙළිදරව් කිරීම සඳහා ලැබෙන හැම අවස්ථාවක්ම අපි පාවිච්චි කරගත යුතුයි. ජර්මනියේ බර්ටෝල්ඩ් බ්‍රෙෂ්ට් කී ලෙස 'අද දවසේ පරාජිතයන් හෙට දවසේ ජයග්‍රාහකයන් වනු ඇත.' වඩා හොඳ හෙටක් වෙනුවෙන් එක්සත්ව සටන් වදිමු. ජාත්‍යන්තර සහයෝගීතාව දිගුකල් දිනේවා!

## සමගි වී සටන් කළහොත් අසාධාරණය අවසන් කරගත හැකියි



### ඉන්දියානු මාක්ස් ලෙනින්වාදී කොමියුනිස්ට් පක්ෂයේ තමිල්නාඩු පාර්ලිමේන්තු මන්ත්‍රී සෞන්ද්‍රරාජන් සහෝදරයා

අද ජනතා විමුක්ති පෙරමුණ ජාති, ආගම්, භාෂා බේද නැති, සියලු දෙනා සමගියෙන් සිටින, බලයක් ගොඩනැගිය යුතු යැයි යෝජනාව ඉදිරිපත් කර තිබෙනවා. කිසිදු ජාතියක් පීඩාවෙන්, මර්දනයෙන්, නසන්න බැහැ. මෙහි පැවති අරගලයන් අවසන් වී තිබෙනවා. නමුත් ජනතාවගේ ප්‍රශ්නවලට අවසන් උත්තර ලැබී නැහැ. ඔවුන්ගේ ඉඩම් අයිතිය, ජීවත්වීමේ අයිතිය, ප්‍රතික්ෂේප කළොත් නැවතත් අරගලයක් ඇති වෙන්න පුළුවන්. එය සන්නද්ධ අරගලයක්ම විය යුතු නැහැ. සටන් ක්‍රමය වෙනස් වෙන්න පුළුවන්. නමුත් සටන් අවසන් වන්නේ නැහැ. සටන් දිගටම පැවැත්වේවි යන ඇත්ත පාලක පන්තියත්, ධනපති පන්තියත් මතක තබා ගත යුතුයි. ජනතාවගේ පීඩාව වැඩිවෙලා. යුද්ධය පෙන්වා පසුගිය කාලයේ ජනතාවගේ ප්‍රශ්න ධනපති පංතිය විසින් යටපත් කළා.

අද ඉන්දියාවේ නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්තිය විසින් සිදුවන අපරාධයන් කියා අවසන් කළ නොහැකි තරම්. අපගේ සම්පත් සියල්ල බහු ජාතික සමාගම් විසින් සූරාකමින් සිටිනවා. ඉන්දියාවේ ජනතාවගේ මුදල් කොල්ලකමින් ධනපතියන් තරවී තිබෙනවා. අද වන විට කෝටි ලක්ෂ 8 බැංකුවෙන් මුදල් රැගෙන ගොස් තිබෙනවා. ඔවුන් ඒක නැවත ලබාදෙන්නේ නැහැ. මෙහිද මෙම තත්තවය තිබේ යැයි විශ්වාස කරනවා. ජනතාවගේ මුදල් කොල්ලකන ආණ්ඩුව ජනතාව විසින් අද නැත්නම් හෙට කුණු කූඩයට යවන ඒක වළක්වන්න බැහැ.

අද වනවිට ජනතාව මුහුණ දෙන සමාජ ප්‍රශ්න වේවා, දැවැදි ප්‍රශ්න වේවා, නැතිනම් කුල ප්‍රශ්න වේවා, අපි පළමුවෙන්ම මිනිසුන් ලෙස සමගි විය යුතුයි. මේ රැඳී සිටින ජනතාව සහෝදරත්වයෙන් සාමකාමීව ඉන්නවා. ඔවුන්ට ජාති, ආගම්, වෙනත් බේද නැහැ. ආගම්, ජාති වැනි ප්‍රශ්න ජනතාවට එපා. අද ජනතාව බේද කරමින් වෙන් කරන්න උත්සාහ කරමින් ඉන්නවා. ඉන්දියාවේත් වැඩකරන ජනතාව බෙදන උත්සාහයන්හි ධනපති පංතිය නිරත වෙනවා.

මේ ප්‍රශ්නවලට හේතුව බලය හොබවන අය, ධනපති පංතිය, ධනපති ආණ්ඩුක්‍රම. තවද ඔවුන්ට පක්ෂපාතීව තිබෙන නීතිය ඇතුළු සියල්ල අපිව පීඩාවට පත්කරනවා. එමනිසා අපි කුල භේදයෙන් තොර, ආගම්, භාෂා, ජාති භේදයෙන් තොර සමගි වී සටන් කළ යුතුයි.

ජාත්‍යන්තරවාදී පදනමින් අපි සමගි වෙමු! සිංහල වේවා, දෙමළ වේවා, මුස්ලිම් වේවා, ලංකාවේ ඕනෑම ප්‍රශ්නයක් වේවා, ඒ සඳහා අපගේ ඉන්දියානු සහෝදරත්වය අපි පළ කරනවා.

## පාලකයන් ජනතාව අතහැර අධිරාජ්‍යවාදීන් පිටුපස දුවමින් ඉන්නවා



### ඉන්දීය ෆෝවර්ඩ් බ්ලොක් පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ උප සභාපති කදිරමන් විරුමාණ්ඩි සහෝදරයා

ධනපති පංතිය සහ ඊට සහයෝගය දෙන ධනපති ආණ්ඩු එක හා සමානව වැඩකරන ජනතාව අත්හරිමින් සිටිනවා. ඔවුන් අත්තනෝමතිකව කම්කරු නීති වෙනස් කරමින් යනවා. අඩුම තරමින් වෘත්තීය සමිති නායකයින් එක්ක හෝ සාකච්ඡා නොකර නීති සංශෝධනය කර අලුතින් එකතු කිරීම් හෝ කප්පාදු කිරීම් කරනවා. ආණ්ඩු සහ ධනපති පංතිය විතරක් නොවෙයි, සමහර වෘත්තීය සමිති නායකයන් පවා ධනපති පංතියත්, ආණ්ඩුත් වෙනුවෙන් පෙනී සිටිනවා. ඔවුන් තමයි වැඩකරන ජනතාව විමසීමකින් තොරව කම්කරු නීති වෙනස් කරන්නේ. කම්කරු, ගොවි, ධීවර ආදී සමස්ත වැඩකරන ජනතාව වෙනුවෙන් ක්‍රියාකරන ජනතා විමුක්ති පෙරමුණ නම් විශාල පක්ෂය ලංකාවේ තිබීම ගැන අපි ආඩම්බර වෙනවා. ඒ වගේම ඔවුන්ට අපි සුබපතනවා.

ධනපති පංතිය යටතේ විශාල ජනතාවක් වැඩකළාට ඔවුන්ගේ අයිතිවාසිකම් වන බෝනස් විශ්‍රාම වැටුප්, පාරිතෝෂික දීමනා වගේ අයිතීන් දැන් ලබා දෙනවාද? මිය යනතුරු අන්ත පීඩනයෙන් ශ්‍රමය වගුරා කිසිම ආරක්ෂාවක් නැතිව සිටින වැඩකරන පංතිය ගැන අපිට වේදනාවක් තියෙනවා. ඉන්දීය ෆෝවර්ඩ් බ්ලොක් පක්ෂයේ වෘත්තීය සමිතිය වන PUCC ඉන්දීය වෘත්තීය සමිති ව්‍යාපාරයේ හයවෙනි විශාලතම වෘත්තීය සමිතියයි. ජනතාව වෙනුවෙන් අයිතීන් දිනාගන්න සහ දැනට පවතින අයිතීන් ආරක්ෂා කර ගැනීමේ අඛණ්ඩ සටනක අපි නියැලී ඉන්නවා. පසුගිය අවුරුද්දේ මෝදි ඉදිරිපත් කළ අයවැය ලේඛනයේ එක වචනයක්වත් කම්කරුවන් ගැන සඳහන් කර නැහැ. කිසිම මුදලක් වෙන්කර තිබුණේ නැහැ. මෙයට විරුද්ධව ඉන්දීය සියලුම වෘත්තීය සමිති එක්කරගෙන රට පුරා මහා විරෝධතාවක් දැක්වූවා. මේ නිසා ආණ්ඩුවට අප සමග සාකච්ඡා කරන්න සිද්ධවුණා.

මෝදි අගමැතිවීමට පෙර ඉන්දීය වැඩකරන ජනතාවට දෙන්න පුළුවන් පොරොන්දු හැමදෙයක්ම දුන්නා. නමුත් දැන් ධනපති පංතියේ ලිබරල්වාදී ක්‍රියාමාර්ග ඉන්දියාව තුළ දියත්කර ලෝකයේ ලිබරල්වාදී අධිරාජ්‍යවාදීන් එක්ක එකතුවෙමින් ඔවුන් වෙනුවෙන් ක්‍රියාකරමින් ඉන්නවා. ලංකාවේ තියෙන්නෙත් මේ තත්වයමයි. මේ පාලකයන් රටේ ජනතාව වෙනුවෙන් කිසිවක් නොකර අධිරාජ්‍යවාදී රටවල් පිටුපස දුවමින් ඉන්නවා.

ලිබරල්වාදී ක්‍රියාමාර්ග නිසා විදේශීය කම්කරුවන් ඉන්දියාවට එනවා. මේ නිසා ඉන්දීය උපාධිධාරීන් පවා දස ලක්ෂ ගණනක් රස්සා නැතිව ඉන්නවා. ඉන්දීය කම්කරුවන්ට රස්සා නැතිව ඉන්නවා. තාක්ෂණයේ දියුණුවත් එක්ක කම්කරු ජනතාව විරැකියාවට පත්වෙලා. ඉන්දීය වැඩකරන පංතිය දියුණු නොකර විදේශිකයන් ගෙන්වා රැකියා ලබාදී ආරක්ෂාවත් ලබා දෙනවා. ඒවගේම GST නමින් බද්දක් ගෙනත් සුළු ව්‍යාපාරිකයන්, සුළු කර්මාන්තරකරුවන් බිඳවට්ටා තිබෙනවා. අනික් පැත්තෙන් බහුජාතික සමාගම් නිසාත් කුඩා පරිමාණ කර්මාන්ත බිඳ වැටිලා. මෙයට වගකිවයුත්තේ අගමැති මෝදි ආණ්ඩුවයි.

ලංකාවේ උතුරේ තිබුණු යුද්ධ අවසන්වී අවුරුදු නවයක් පසුකළා. නමුත් ජනතාවගේ මූලිකම ප්‍රශ්නයක් වන නිවාස, ඉඩම් ප්‍රශ්නවත් විසඳා නැහැ. තවමත් මූලික ජීවන අවශ්‍යතා කිසිවක් ලබාදී නැහැ. සමස්ත ජනතාව වෙනුවෙන් කිසිදු භේදයකින් තොරව සටන් කරන ලංකාවේ එකම වමේ ව්‍යාපාරය ජනතා විමුක්ති පෙරමුණ පමණක් බව මම අවධාරණය කරනවා.

# එක්සත් ජනපදය: ඉරානයට එරෙහිව අසාර්ථක වටලෑමක




පසුගිය මැයි 08 වන දා එක්සත් ජනපද ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් තමන් ඉරානය සමග අත්සන් කළ න්‍යෂ්ටික ගිවිසුමෙන් ඉවත් වන බවටත්, ඉදිරියේ දී ඉරානයට එරෙහිව දැඩි සම්බාධක පනවන බවටත් ප්‍රකාශයක් කළේය.

එක්සත් ජනපදයේ මෙම තීරණය මැදපෙරදිග කලාපය තුළ තිගැස්මක් ඇති කළ අතර ලෝකයේ බොහෝ රටවල් විසින් එය හෙළා දකින ලදී. මැදපෙරදිග කලාපය තුළ එක්සත් ජනපදයේ මෙම තීරණය අනුමත කරනු ලැබුවේ ඊශ්‍රායලයත්, එක්සත් අරාබි එමීර් රාජ්‍යයත්, බහරේනයත්, සෞදි අරාබියත් පමණි. එක්සත් ජනපදයේ මෙම තීරණය හෙළා දකිමින් ප්‍රකාශයක් නිකුත් කළ කියුබානු විදේශ අමාත්‍යංශය පැවසුවේ, මෙය රාජ්‍යයන් අතර සහජීවනය පිළිබඳ ජාත්‍යන්තර කොන්දේසි කඩ කිරීමක් වන බවත් මෙම තීරණය හේතුවෙන් මැද පෙරදිග කලාපය තුළ දේශපාලන ස්ථාවරත්වය නැති වී අනාරක්ෂිත තත්වයක් ඇති වන බවත් එක්සත් ජනපදයේ මෙම තීරණය එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය විසින් සම්මත කළ 2231 (2015) යෝජනාව කඩ කිරීමක් වන බවත්ය.

ඉරාන න්‍යෂ්ටික ගිවිසුම අත්සන් කරනු ලැබුවේ 2015 වර්ෂයේදීය. ඉරානය සමග වන ගිවිසුමට එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, රුසියාව, චීනය, ප්‍රංශය හා ජර්මනිය යන රටවල්ද අත්සන් තැබීය. මෙම ගිවිසුම අත්සන් කිරීමෙන් පසුව ඉරානයේ න්‍යෂ්ටික වැඩසටහන මුළුමනින්ම පාහේ නතර කෙරිණි. මේ වන විටත් ඉරානය එකී ගිවිසුම කඩ නොකරමින් පිළිපදින බව ජාත්‍යන්තර පරමාණු බලශක්ති අධිකාරිය පවා සහතික කර තිබේ. එබැවින් එක්සත් ජනපදය මෙම තීරණයට ඒකපාර්ශවිකව එළඹෙන්නේ කිසිදු පදනමකින් තොරවය. ගිවිසුමට අත්සන් තැබූ අනෙක් සියලුම රටවල් තවදුරටත් ගිවිසුම සමග රැඳී සිටින බව ප්‍රකාශ කර තිබේ.

මේ අතර එක්සත් ජනපදය පවසන්නේ, ඉරානය සිය බැලස්ටික් මිසයිල වැඩපිළිවෙළ හා හිස්බුල්ලා ගරිල්ලන්ට දෙන සහාය නැවැත්විය යුතු බවය. එහෙත් බැලූ බැල්මටම මෙම චෝදනාව ඉරානයේ න්‍යෂ්ටික ගිවිසුම හා සම්බන්ධ නොවන බව පෙනේ.

කෙසේ වෙතත් එක්සත් ජනපදයේ මෙම තීරණය මැදපෙරදිග කලාපයේත් ජාත්‍යන්තර දේශපාලනයේත් බරපතළ නව වෙනස්කම් ඇති කරලීමට හේතු විය හැකිය. එක්සත් ජනපදයේ මෙම තීරණයත් සමඟ මැදපෙරදිග කලාපය තුළ යුද උණුසුම තව තවත් වර්ධනය වනු ඇත. විශේෂයෙන් ම ඉරානය හා ඊශ්‍රායලය අතර ඕනෑම මොහොතක යුද්ධයක් ඇති වීමේ අවදානම ඉහළ ගොස් තිබේ.

මැදපෙරදිග කලාපය තුළදී එක්සත් ජනපදයේත් ඊශ්‍රායලයේත් සෞදි අරාබියේත් ප්‍රධාන සතුරා වන්නේ ඉරානයයි. මේ නිසා ඉරානය දුර්වල කිරීම, ඉරානය තුළ පාලන වෙනසක් ඇති කිරීම ඔවුන්ගේ ප්‍රධාන අරමුණුවලින් එකකි. සිරියානු අර්බුදයේදීත් ඉරාක අර්බුදයේදීත් ඉරානයේ මැදිහත් වීම එක්සත් ජනපදයටත්, ඊශ්‍රායලයටත් අවාසි සහගත විය. මේ නිසා කුමන හෝ ආකාරයකින් ඉරානය දුර්වල කිරීම ඔවුන්ගේ අරමුණය.

මේ නිසා කලාපය තුළ යුද උණුසුම වර්ධනය වෙද්දී කලාපයේ සෑම රටක්ම සිය යුද වියදම් ඉහළ දැමීමට ඉඩ තිබේ. එසේ වුවහොත් එහි වාසිය හිමි වන්නේද එක්සත් ජනපදයටය. මන්ද මෙම තීරණය එක්සත් ජනපදයේ යුද්ධායුද සඳහා ඇති ඉල්ලුම ඉහළ දැමීමට හේතුවන්නක් වන බැවිනි.

එක්සත් ජනපදයේ මෙම තීරණය ඉරානය සමඟ වෙළෙඳ ගනුදෙනුවල නිරත වී සිටින ජර්මනිය, ප්‍රංශය ප්‍රමුඛ යුරෝපා රටවලට ආර්ථිකමය වශයෙන් පාඩු ගෙන දේ. මේ හේතුව නිසා එක්සත් ජනපදයත් යුරෝපා සංගමයේ ජර්මනිය, ප්‍රංශය වැනි රටවල් අතරත් ප්‍රතිවිරෝධතා වර්ධනය වීමේ ඉඩ කඩ වැඩිය. ප්‍රංශ ජනාධිපති එම්මානුවෙල් මෙම තීරණය යළි සලකා බලන ලෙසට එක්සත් ජනපදයෙන් ඉල්ලා තිබේ. පශ්චාත් සීතල යුද වකවානුව තුළ එක්සත් ජනපදයේත් යුරෝපයේත් වුවමනාවන් හැම විටම සමපාත වූයේ නැත.

ඉරානය සමග න්‍යෂ්ටික ගිවිසුමට එළඹීමෙන් පසු යුරෝපා රටවල් ගණනාවක්ම ඉරානය සමඟ වෙළෙඳ ගනුදෙනු ආරම්භ කළේය. ප්‍රංශය ඉරානයේ ස්වභාවික ගෑස් ගවේෂණය ආරම්භ කළාය. ජර්මනියේ සීමන් සමාගම ඉරානය සමග මෝටර් රථ ගිවිසුමකට එළඹුණි. ප්‍රංශයේ එයාර් බස් සමාගම ඉරානයේ පැරණි ගුවන් යානා වෙනුවට නව ගුවන් යානා 100කට වැඩි ප්‍රමාණයක් සැපයීමට ගිවිසුම් අත්සන් කර තිබේ. ඉතාලියානු සමාගම් කිහිපයක්ද ඉරානය තුළ විශාල ආයෝජන ප්‍රමාණයක් සිදු කර තිබේ. 2017 වසරේදී පමණක් යුරෝපා සංගමය සමග ඉරාන වෙළෙඳ ගනුදෙනු පසුගිය වසරට වඩා 1/3 ගුණයකින් එනම් ඩොලර් බිලියන 12.8 කින් වර්ධනය වී තිබේ. ඇමෙරිකානු සම්බාධක ක්‍රියාත්මක වුවහොත් යුරෝපයට සිදුවන්නේ මේ සියලු ගනුදෙනු නවතා දැමීමටය.

එබැවින් එක්සත් ජනපදයේ මෙම පියවර අන්තර් අධිරාජ්‍ය ප්‍රතිවිරෝධතාද වර්ධනය කරනු ඇත. ඒ අනුව එක්සත් ජනපදයේ නව තීරණය ඔවුන් අපේක්ෂා කරන ප්‍රතිඵලයම ගෙන දේද යන්න සැක සහිතය. එය ජාත්‍යන්තර ගැටුම් උත්සන්න කරන අතරම එක්සත් ජනපදයටත්, කලාපය තුළ ඔවුන්ගේ නියෝජිතයා වන ඊශ්‍රායලයටත් අවාසි සහගත දේශපාලන පෙළගැස්මක් ඇති කරලීමට බොහෝ දුරට ඉඩ තිබේ.

## එක්සත් ජනපදය: මැදපෙරදිග ගින්නට තවත් පිදුරු දමමින්




එක්සත් ජනපදයේ ඊශ්‍රායල තානාපති කාර්යාලය මැයි 15 වැනි සඳුදා ජෙරුසලමේදී විවෘත කළේ ජාත්‍යන්තර වශයෙන් නැගුණ දැඩි විරෝධය මධ්‍යයේය. ඊට විරෝධය දක්වමින් ගාසා තීරයේදී උද්ඝෝෂණය කළ පලස්තීනුවන්ට ඊශ්‍රායල් හමුදා විසින් වෙඩි තබනු ලැබිණි. එහි දී ඇති වූ ගැටුම්වලින් පලස්තීනුවෝ 61 දෙනෙක් ජීවිතක්ෂයට පත් වූහ. පුද්ගලයෝ 2800කට අධික පිරිසක් තුවාල ලැබූහ.

මෙතෙක් එක්සත් ජනපදයේ ඊශ්‍රායල තානාපති කාර්යාලය පිහිටා තිබුණේ අනෙකුත් රටවල ඊශ්‍රායල තානාපති කාර්යාලයන් පිහිටා තිබෙන ටෙල් අවීව් නුවරය. එතෙක් අනුගමනය කළ ස්ථාවරය වෙනස් කරමින් තමන් ඊශ්‍රායලයේ ජෙරුසලමට තානාපති කාර්යාලය ගෙන යන බව එක්සත් ජනපද නව ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් පසුගිය දෙසැම්බර් 06වැනි දින ප්‍රකාශ කළේය. එක්සත් ජනපද තානාපති කාර්යාලය ජෙරුසලමට ගෙන ඒම ඊශ්‍රායලයේ 70වැනි ජාතික දින සැමරුමට සමගාමීව සිදු විය.

යුරෝපා සංගමයේ ඊශ්‍රායල තානාපතිවරයා එක්සත් ජනපදයේ මෙම ක්‍රියාවට විරෝධය පළ කරමින් එම අවස්ථාවට සහභාගී වීම වර්ජනය කර සිටියේය. කෙසේ වෙතත් මෙය ඊශ්‍රායල් පලස්තීන ප්‍රශ්නයේ තවත් එක් සන්ධිස්ථානයක් වන බවට විචාරකයෝ මත පළ කරති.

## නේපාලය: වම එක පෙළට සිටගෙන




නේපාලයේ ප්‍රධාන වාමාංශික පක්ෂ වන නේපාලයේ එක්සත් මාක්ස් ලෙනින්වාදී කොමියුනිස්ට් පක්ෂයත්, නේපාලයේ මාවෝවාදී කොමියුනිස්ට් පක්ෂයත් පසුගිය මැයි 17වැනිදා එක් පක්ෂයක් බවට පත් විය. එය දැන් නේපාල කොමියුනිස්ට් පක්ෂය ලෙස හැඳින්වේ. මෙම එක් එක් පක්ෂයේ මධ්‍යම කාරක සභාවන් විසුරුවා හැරීමෙන් අනතුරුව නේපාලයේ එක්සත් මාක්ස් ලෙනින්වාදී කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයින් 241ක්ද, මාවෝවාදී කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයන් 200ක්ද ඇතුළත් සාමාජිකයන් 441 දෙනෙකුගේ මධ්‍යම කාරක සභාවක් තෝරාපත් කර ගැනුණි.

මෙලෙස නේපාලයේ ප්‍රධාන වාමාංශික පක්ෂ දෙක එක් පක්ෂයක් බවට පත් වීමෙන් පසු නේපාල පාර්ලිමේන්තුවේ 2/3ක බලයක් එම පක්ෂයට හිමි වේ. එය නේපාල වමේ ව්‍යාපාරයට පමණක් නොව දකුණු ආසියානු කලාපයේ වමේ ව්‍යාපාරයටද වැදගත් සිදු වීමක් වී තිබේ.

## වෙනිසියුලාව: අධිරාජ්‍යවාදයට එරෙහිව ජන පවුරු බැඳ



වෙනිසියුලාවේ ජනාධිපති නිකොලොස් මධුරෝ යළිත් වරක් එරට ජනාධිපති වරයා ලෙස තෝරාපත් කර ගැනුණි. මැයි 19වැනිදා පැවති ජනාධිපතිවරණයෙන් ඡන්ද මිලියන 5.8ක් ලබා ගනිමින් (67.7%) ඔහු 2019 - 2025 කාලය සඳහා යළිත් තේරීපත් විය.


ඔහුගේ ප්‍රතිවාදියා වූ හෙන්රි ෆෝල්කන්ට ලබා ගත හැකි වූයේ ඡන්ද මිලියන 1.9ක් (21.1%) පමණි.

වෙනිසියුලානු විපක්ෂය මෙම මැතිවරණ ප්‍රතිඵලය ප්‍රතික්ෂේප කළද ලෝකයේ බොහෝ රටවල නායකයන් නිකොලොස් මධුරෝගේ ජයග්‍රහණයට සුබපැතුම් එක් කර තිබේ.

ජනාධිපති මධුරෝ මෙම ජයග්‍රහණය ලබා ගත්තේ එක්සත් ජනපදය විසින් වෙනිසියුලාවට සම්බාධක පනවමින්, එරට දක්ෂිණාංශික විපක්ෂය මගින් රට තුළ භාණ්ඩ හිඟයක් ඇති කරමින්, කැරලි කෝලාහල ඇති කරමින්, චාවේස්වාදී පාලනය පෙරළා දැමීමට උත්සාහ දරන තත්වයක් තුළදීය. එබැවින් මෙම ජයග්‍රහණය එක් අතකින් ලතින් ඇමෙරිකානු කලාපය තුළ ප්‍රගතිශීලී, අධිරාජ්‍ය විරෝධී ජනතාව ලැබූ ජයග්‍රහණයක් පමණක් නොව එක්සත් ජනපද අධිරාජ්‍යවාදයට පරාජයක්ද වී තිබේ.

# බල අරගලයට ජාතිවාදය

ජාතිවාදය හා ආගමික අන්තවාදය මානව සමාජයේ ඓතිහාසික ගමන්මගේ එක්තරා වකවානුවක බිහිව පරපුරෙන් පරපුරට පැවත එන මනෝභාවයක්ය යන්න අපි මීට පෙර කථා කළෙමු. ජාතිවාදී මනෝභාවයන් යමෙකු තුළ තිබූ පමණින් මිනිසුන් තමන් කිසියම් ආගමකට අයිති, ජාතියකට අයිති, ගෝත්‍රයකට අයිති ලෙස සැලකූ පමණින්, එය සමාජයට හානිකර ගැටුමක් බවට පත්වන්නේ නැත. මිනිසා තුළ ඓතිහාසිකව නිර්මාණය කර ඇති මෙම ජාතිවාදී හා ආගමික අන්තවාදී මනෝභාවයන් සමාජය තුළ ලේ වැගිරෙන ගැටුම් දක්වා, යුද්ධ දක්වා වාර්ධනය කරනු ලබන්නේ වෙනත් බලවේග යන් විසිනි. එම බලවේග අතර ඉදිරියෙන්ම සිටින්නේ ධනේශ්වර පංතියේ දේශපාලන බලවේගයන්ය.



### ජාතිවාදය බලයේ අවියක් ලෙස

නූතන ධනපති ක්‍රමය තුළ, එහි ඊනියා ප්‍රජාතන්ත්‍රවාදය තුළ බලය සඳහා එක් එක් ධනේශ්වර පංති කණ්ඩයම් අතර, පක්ෂ අතර, පුද්ගලයන් අතර තරගයක් තිබේ. පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය පවතින තත්වයන් තුළ මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය අභිබවා ඒකාධිපති පාලනයක් බිහිකිරීමේදීද බලය සඳහා තමා වටා පොදු ජනතාව ඒකරාශි කර ගැනීම අත්‍යවශ්‍ය බව ධනපති නායකයෝ දනිති. අර්බුදයට ගිය ධනවාදී සමාජය තුළ, බංකොළොත් දේශපාලන පක්ෂවලට හෝ නායකයන්ට ප්‍රතිපත්ති මගින් ජනතා අපේක්ෂා ඉටුකර ජනතාවගේ ප්‍රසාදය ලබා ගැනීම මගින් බලයට පැමිණිය නොහැක. එවැනි කරුණු මගින් ජනතාව මුලාකරගත නොහැක. එවැනි අතිශය අර්බුදකාරී අවස්ථාවල බලයට ඒම සඳහාත් ජනතාව තමන් වටා එක්කර ගැනීමටත් ධනපති පාලකයන් හා ධනපති දේශපාලන නායකයන් ජාතිවාදය හා ආගමික අන්තවාදය අවියක් කොට ගනිති. අදාළ රට කුමක් වුවත් එම රටේ සුළු ජන කණ්ඩායම්වලට හා සුළු ආගමික කණ්ඩායම්වලට එරෙහිව මහ ජාතියේ ජාතිවාදයත් ප්‍රධාන ආගමේ ආගමික අන්තවාදයත් යොදා ගනිති. ජන කණ්ඩායම් අතර සැකය, බිය වර්ධනය කොට එක් කණ්ඩායමකට එරෙහිව අනෙක් කණ්ඩායම් මෙහෙයවීම මගින් ධනවාදයේ පොදු අර්බුදය යටත්කර තැබීමටත් ජාතිවාදී උමතුවට පත්කරනු ලැබූ ජනතාව මගින් තම බලය තහවුරු කර ගැනීමටත් ඔවුහු කටයුතු කරති.

### ජාතිවාදයට එරෙහිව ජාතිවාදයම

මෙහිදී ඕනෑම රටක සුළු ජාතික කණ්ඩායම් හා බහුතර ජනතාවගේ ආගමේ නොවන අනෙක් ආගමික කණ්ඩායම්ද තම පැවැත්ම වෙනුවෙන් ජාතිවාදය හා ආගමික අන්තවාදයම උපයෝගී කර ගනියි. එවිට සිදුවන්නේ දෙතුන් පැත්තෙන්ම ජාතිවාදයන් වර්ධනය වීමය. එක් ජාතිවාදයක ක්‍රියාකාරිත්වය විසින් අනෙක් ජාතිවාදය පෝෂණය කරන අතර මෙම ජාතිවාදයන් එකිනෙකින් පෝෂණය වෙමින් ජාතිවාදී ගැටුම් දක්වා වර්ධනය වෙයි. ලංකාවේ අප දකිමින් සිටින්නේ එයයි. ලංකාවේ සියලුම ජාතිවාදයන් පිටුපස සිටින්නේ, ඒ ඒ ජාතිවාදයේ පිහිටෙන් දේශපාලන බලය තහවුරු කර ගැනීමට මාන බලන ධනවාදී දේශපාලන නායකයින් මිස අන් කවරෙක්වත් නොවේ. මෙලෙස එකිනෙකාට සේවය කරමින් වර්ධනය වන ජාතිවාදය හා ආගමික අන්තවාදය එහි ප්‍රමාණාත්මක වර්ධනයේ එක් අවස්ථාවකදී ඉතාම කුඩා ආසන්න සිදුවීමකින් පුපුරා යන අතර එය ලේ වැගිරෙන ගැටුම් දක්වා කැරලි කෝලාහල දක්වා සිවිල් යුද්ධ දක්වා, බෙදුම්වාදී යුද්ධ දක්වා, වර්ධනය වේ. එවැනි ගැටුම්වලින් යුද්ධවලින් අවසානයේ ජය ගන්නේ එම ගැටුම්වලට දායක වූ ඉන් හානිකරගත් ජනතාව නොව ඊට පිටුපසින් සිටි දේශපාලන නායකයන්ය. සත්‍යය එයයි.

### ලෝක අත්දැකීම් තුළින්

ජාතිවාදය විසින් ලොවට, මනුෂ්‍යය සංහතියට සිදුකර තිබෙන විනාශය ඉමහත්ය. එය හොඳින් අධ්‍යයනය කරන්නේ නම් කිසිවෙකුත් ජාතිවාදී ගැටුම්වලට නොයනු ඇත. 1930 දශකය වනවිට ඉතාලියේ ධනවාදය මුහුණ දුන් බරපතළ අර්බුදයට පිළියමක් ලෙස බලයට ආ මුසලෝනිගේ ෆැසිස්ට්වාදය බලය සඳහා පාර කපාගත්තේ ජාතිකවාදය උපයෝගී කර ගනිමිනි. ඉතාලි ජනතාවගේ ජාතිවාදී මනෝභාවයට ආමන්ත්‍රණය කළ ෆැසිස්ට්වාදී නායකයෝ ඉතාලි ජාතිකවාදයේ නාමයෙන් ප්‍රජාතන්ත්‍රවාදය අහෝසි කළ මර්දනකාරී ඒකාධිපති පාලනයකට පාර කැපූහ. එය දෙවන ලෝක යුද්ධය දක්වාම ගිය ක්‍රියාවලියක් විය.

ඉතාලියෙන් ඇරඹි ෆැසිස්ට් පන්නයේ පාලනය ජර්මනියේදී මතුවූයේ නාසිවාදය ලෙසය. ඊට නායකත්වය දෙනු ලැබුවේ ඇඩොල්ෆ් හිට්ලර් විසිනි. ජර්මනිය තුළ නාසිවාදී බලය තහවුරු කර ගැනීම සඳහා හිට්ලර් විසින් යොදාගනු ලැබුවේද ජාතිවාදයමය. ආර්යයන් (ජර්මන්වරු) උතුම් ප්‍රජාවක් ලෙස අර්ථකථනය කළ ඔහු ආර්යයන් විසින් ලොව පාලනය කළ යුතු යැයි ජර්මන් ජනතාවගේ මනස තුළ තහවුරු කළේය. යුදෙව්වන්ට එරෙහි සටනක් ලෙස ආරම්භ වූ එය යුදෙව් සංහාරයකින් නතර නොවී දෙවන ලෝක යුද්ධයටද මඟ පෑදුවේය. ජර්මානුවන් ලොව උතුම් ජාතියය යන හිට්ලර්ගේ ජාතිවාදී උමතුව අධිරාජ්‍යවාදීන් අතර වූ තරගයේදී ලොව අනෙක් රටවල් ආක්‍රමණය කිරීමට ජර්මන්වරුන්ට පහසුවක් හා ආවරණයක් සැපයීය. එම උමතුව නතර වූයේ ලොව ජනතාව කෝටි පහක් මරා දමමිනි.

ඕනෑම රටක සුළු ජාතික කණ්ඩායම් හා බහුතර ජනතාවගේ ආගමේ නොවන අනෙක් ආගමික කණ්ඩායම්ද තම පැවැත්ම වෙනුවෙන් ජාතිවාදය හා ආගමික අන්තවාදයම උපයෝගී කර ගනියි. එවිට සිදුවන්නේ දෙතුන් පැත්තෙන්ම ජාතිවාදයන් වර්ධනය වීමය. එක් ජාතිවාදයක ක්‍රියාකාරිත්වය විසින් අනෙක් ජාතිවාදය පෝෂණය කරන අතර මෙම ජාතිවාදයන් එකිනෙකින් පෝෂණය වෙමින් ජාතිවාදී ගැටුම් දක්වා වර්ධනය වෙයි. ලංකාවේ අප දකිමින් සිටින්නේ එයයි.

මැදපෙරදිග කලාපයේ ෂියා හා සුන්නි ඉස්ලාම් නිකායන් අතර ගැටුමද මෙවැනිමය. ඒවා පිටුපස සිටන්නේද බලලෝභී දේශපාලන නායකයන් හා අධිරාජ්‍යවාදීන්ගේ වුවමනාවන්ය. බලයට ඒම සඳහා වර්ගවාදය යොදා ගැනීම ගැන මෑත තිබූ බේදජනකම උදාහරණය වූයේ අප්‍රිකානු රටක් වන රුවන්ඩාවේ ඇතිවූ හුටු හා ටුට්සි ගෝත්‍රික ගැටුමය. එය මිනිසුන් දස දහස් ගණනික් මරා දැමීය. ඉන්දියාවේ විටින් විට මතුවන හින්දු මුස්ලිම් ගැටුම්ද, ඉන්දු පාකිස්ථාන ගැටුම්ද මේ සඳහා තවත් උදාහරණ වේ.

### වෙළඳ ව්‍යාපාර හා ජාතිවාදය

ජාතිවාදී ගැටුම් ඇවිළවීමේදී ඒ පිටුපස වන බලවේග අතර ධනේශ්වර දේශපාලන නායකයින්ට අමතරව සමහර වෙළඳ ව්‍යාපාරිකයෝද සිටිති. ධනවාදය තුළ ලාභ ලැබීම සඳහා වෙළඳ ව්‍යාපාර අතර අනවරත තරගයක් පවතී. එසේම ධනවාදය අර්බුදයට යත්ම වෙළඳ ව්‍යාපාර අර්බුදයට පත්වේ. ලාභ ඉපයීම දුර්වල වන අතර සමහර වෙළඳ ව්‍යාපාර කඩා වැටී බංකොලොත් වේ. මෙහිදී මෙම වෙළඳ ව්‍යාපාර කඩා වැටීම හෝ පාඩු ලැබීම ධනපති ක්‍රමයේ අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස තේරුම් ගන්නවා වෙනුවට මෙය ජාතිවාදී ලෙස තේරුම් ගැනීමට සමහර වෙළඳ ව්‍යාපාරිකයෝ පෙළඹෙති. ධනපති නායකයෝද ඊට උදව් කරති. තමන්ගේ ව්‍යාපාර පාඩු ලබන්නේ ධනවාදයේ අර්බුද නිසා යයි වෙළඳ ව්‍යාපාරවල අය තේරුම් ගන්නේ නම් එය ධනවාදයේ පැවැත්මට හානිකරය. ඒ නිසාම ධනවාදී මත නිපදවන්නෝ එම කඩා වැටීම් ජාතිවාදී ලෙස විග්‍රහ කරති.

ලංකාවේ සිංහල ව්‍යාපාර හා මුස්ලිම් ව්‍යාපාර අතර මේ ප්‍රතිවිරෝධය තිබේ. අතීතයේ 1983ට පෙර බොහෝ නගරවල සිංහල හා දෙමළ ව්‍යාපාර අතරද මෙම ගැටුම තිබුණි. ඒ නිසා ව්‍යාපාරිකයෝ ව්‍යාපාරික අර්ථයෙන් ජාතිවාදය ඇවිළවීමට දායක වෙති. ජාතිවාදී ගැටුම්වලදී මුලින්ම පහරදී ගිනි තබා විනාශ කරනු ලබන්නේ කඩ සාප්පු හා ව්‍යාපාරික ස්ථානය. ඒ, වෙළඳ තරගය ජාතිවාදය හරහා පුපුරා යන නිසාය. 1983 ජූලි ජාතිවාදී කෝලාහලවලදී දෙමළ ජනතාවගේ කඩ සාප්පු හා ව්‍යාපාරික ස්ථාන රැසක් ගිනි තබා විනාශ කරන ලදී. චිත්‍රපට ශාලා පවා ගිනි තබන ලදී, ඒ පිටුපස සිංහල ව්‍යාපාරික වුවමනා තිබූ බවත් ඊට බලයේ සිටි දේශපාලන නායකයින් නායකත්වය දුන් බවත් පැහැදිලිය. මෑත කාලයේ මුස්ලිම් කඩ සාප්පු ගිනි තැබීම් තුළ මෙන්ම 'වඳ බෙහෙත්' පිළිබඳ පතුරුවන මිත්‍යා මත පිටුපස සිටින්නේද ජාතිවාදීන් මෙන්ම ජාතිවාදී ව්‍යාපාරිකයන්ද බව බැහැර කළ නොහැක.

මෙය ලොව පුරාවටද දැකිය හැක. යුරෝපා රටවල මෙය යුදෙව් විරෝධී ලෙස පැවතිණි. බොහෝ යුරෝපා රටවල හා රුසියාවේ පවා යුදෙව්වෝ හැම විටම නගරවල ව්‍යාපාර කරන අය බවට පත්ව සිටයහ. ඒ නිසා එම රටවල වරින්වර යුදෙව් විරෝධී කොලාහල ඇතිවූ අතර එහිදී යුදෙව්වන්ගේ කඩ සාප්පු විනාශ කරන ලදී. ඉන්දියාවේ හින්දු මුස්ලිම් ගැටුම්වලදීද මෙම තත්වය දැකිය හැක.

ඒ අනුව ජාතිවාදය ඇවිළවීමේදී එය ගැටුම් බවට පත්කිරීමේදී බලය වෙනුවෙන් ධනපති දේශපාලන නායකයින් ජාතිවාදය අවුළුවන අතර වෙළඳ ව්‍යාපාරික තරගයේ ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ද ජාතිවාදය ඇවිළවීමට කටයුතු කරන බව පැහැදිලිය. ජාතිවාදය ඇවිළවීමේදී ඊට අමතර සාධකද තිබේ. ඒ ගැන මීළඟට කථා කරමු.



"ධනවාදය යටතේ ජාතීන් අතර සම්බන්ධතාවන්ගේ ලක්ෂණ පරාවර්තනය කරමින් ජාතිවාදය ආකාර දෙකකින් ප්‍රකාශිත වේ. වෙනත් ජාතීන් සඳහා කරනු ලබන නිග්‍රහවලින් සලකුණු වන ආධිපත්‍ය දරන ජාතියේ මහ ජාතික ජාතිවාදය හා ජාතික හුදකලාභාවය හා සෙසු ජාතීන් කෙරෙහි අවිශ්වාසය සඳහා මහත් පරිශ්‍රම දැරීම මගින් සනිටුහන් වන පීඩිත ජාතියේ ප්‍රාදේශීය ජාතිවාදයයි ඒ."

**දර්ශනයේ ශබ්දකෝෂය**

# උපාධි විකිණීමට බලය පැවරෙන කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල පනත

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට අනුව පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) මෙතෙක් අපේ රටේ ආරම්භ කරන ලද විධිමත් විශ්වවිද්‍යාලයක් සම්බන්ධයෙන් (රාජ්‍ය සහ පෞද්ගලික) නියාමන කාර්යභාරය සිදු කරන ලදී. ඒ නිසාම අපේ රටේ අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සම්බන්ධයන් යම් ඉහළ ප්‍රමිතියක් පවත්වාගෙන යෑමේ ඉඩකඩ විවර වී තිබුණි. ලෝකයේ අනෙකුත් සෑම විශ්වවිද්‍යාලයකටම වඩා අපේ රටේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය සම්බන්ධයෙන් ඉහළ පිළිගැනීමක්ද පැවතීමට එයද හේතුවක් විය.

මෙකී තත්වය අත්පත් කර ගැනීම සඳහා දියුණු යැයි සම්මත බොහෝ රටවල්වලට පවා නොහැකි වූ නිසාම අපේ රටේ අධ්‍යාපනය බටහිර උගතුන්ගේ සහ සංවිධානවලත් නිරතුරු වෛරයට භාජනය විය. ඒ සඳහා ලංකාවේ පාලකයන්ගේ සහයෝගය සහ දායකත්වය නොඅඩුව ලැබුණි. පෞද්ගලික අධ්‍යාපනය අප රට තුළ කරළිගත වන්නේ එවැනි පසුබිමක් තුළය. වර්තමානයේ අපේ රටේ දුවා දරුවන් භුක්ති විඳින නිදහස් අධ්‍යාපන අයිතිය අහෝසි කිරීම සඳහා පාලකයන් දරන ලද බොහෝ උත්සාහයන් තවමත් සම්පූර්ණයෙන් සාර්ථක කර ගැනීමට ඔවුන්ට හැකි වී නැත. එසේ වුවද තම වුවමනාව සාර්ථක කරගැනීම සඳහා වන සැලසුම් සකස් කිරීමට සහ ඒවා ක්‍රියාත්මක කිරීමට පාලකයෝ නිරතුරු කටයුතු කරමින් සිටිති.

**උසස් අධ්‍යාපන ප්‍රමිතිය අහෝසි කිරීම**

පෞද්ගලික විශ්වවිද්‍යාල ආරම්භ කිරීම සම්බන්ධයෙන් මෙතෙක් කලක් තිබූ ප්‍රතිපත්තිය වූයේ එම විශ්වවිද්‍යාල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් එහි අනුමැතියට යටත්ව ආරම්භ කළ යුතු බවය. නමුත් කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාල පනත මගින් එම තත්වය සම්පූර්ණයෙන්ම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ඉවත් කර තිබේ. ඒ අනුව 2018 දරන කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාල පනත මගින් විශ්වවිද්‍යාල ආරම්භ කිරීමේ හා නියාමන අයිතිය මෙකී පනතට අනුව පිහිටුවන පාලක මණ්ඩලයකට පැවරෙනු ඇත. ඒ අනුව එකී පාලක මණ්ඩලය සමන්විත වන්නේ, ආරක්ෂක ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම්, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, යුධ, ගුවන්, නාවුක හමුදාපතිවරු, කොතලාවල විශ්වවිද්‍යාලයේ උප කුලපති, මහා භාණ්ඩාගාර ලේකම් පත්කරන නියෝජිතයකු, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සාමාජිකයකු යන පිරිසගෙනි.



මෙහි විශේෂත්වය වන්නේ, පාලක මණ්ඩල සාමාජිකයන් කිසිවකුගේවත් (UGC සාමාජික හා භාණ්ඩාගාර නියෝජිත හැර) ඉහළ අධ්‍යාපන සුදුසුකමක් මූලික වශයෙන් නොමැති වීමය. එසේ වුවද ඒ ඒ විශ්වවිද්‍යාලය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම සඳහා වන නිර්නායක සකස් කිරීම සඳහාත් උසස්පෙළ ප්‍රතිඵල අනුව z score සැලකිල්ලට ගෙන සිසුන් ඇතුළත් කර ගැනීම සඳහාත් ඉහත පාලක මණ්ඩලය බලය සහිත ආයතනය ලෙස ක්‍රියාත්මක වනු ඇත. ඒ අනුව අධ්‍යාපනය සම්බන්ධයෙන් තීරණ ගැනීම ආරක්ෂක ප්‍රධානීන්ට පැවරීම අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සම්බන්ධයෙන් කොපමණ ගැටලුකාරී වනු ඇත්ද යන්න වටහා ගැනීම අපහසු නැත. එසේම මෙකී පාලක මණ්ඩලය මගින් ගනු ලබන තීරණය ආරක්ෂක ඇමතිවරයාට අවශ්‍ය නම් වෙනස් කිරීමේ බලයක්ද ඇති බව පනතේ සඳහන් වේ. ඒ අනුව ජාතික උසස් අධ්‍යාපන ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන් මේ පනත මගින් උල්ලංඝනය කරනු ලැබ ඇත.

**විශ්වවිද්‍යාල පිහිටුවීමේ අත්තනෝමතික බලය**

දේශීය මෙන්ම විදේශීය උපාධි සහ ඩිප්ලෝමා සහතික ලබාදෙන පෞද්ගලික ආයතන අනුබද්ධ කර ගැනීමටත්, අලුතිනේ පිහිටුවීමටත් මෙම පනත මගින් බලයක් අදාල පාලක මණ්ඩලය වෙත ලබා දී ඇත. එසේම ශිෂ්‍යයන්ගේ මුදල් අයකිරීම පිළිබඳ තීරණ ගැනීමේ සම්පූර්ණ අයිතිය එකී පාලක මණ්ඩලය සතු වන අතර එයට අදාළ කිසිදු සීමා කිරීමක් එහි සඳහන් නොවේ. ඒ අනුව උසස් අධ්‍යාපනය සම්බන්ධයෙන් රාජ්‍ය විශ්වවිද්‍යාලවලට පැවරී ඇති වගකීමේ ක්‍රියාවලිය සම්පූර්ණයෙන් විකෘති තත්වයකට මෙම පනත මගින් පත්වන අතර අදාළ පාලක මණ්ඩලය එහි සියලු බලතල සහිත ආයතනය වනු ඇත.

අපේ රටේ වෛද්‍ය අධ්‍යාපනය සම්බන්ධයෙන් පූර්ණ වගකීම දරන්නේ, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවය. එහි අනුමැතියට යටත් නැති කිසිදු ආයතනයකට වෛද්‍ය අධ්‍යාපනය සම්බන්ධයෙන් උපාධි පිරිනැමිය නොහැකි බව පසුගිය කාලයේ සයිටම් ගැටලුව මගින් මනාව තහවුරු විය. වෛද්‍යවරයකු වීමේ වුවමනාව සහිත ඕනෑම කෙනෙකු වෛද්‍ය සභාවේ නියාමනය සහිත ආයතනයක තම උපාධිය සම්පූර්ණ කළ යුතුව ඇත. නමුත් මෙකී පනත මගින් සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ කාර්ය භාරය නොසලකා හැර ඇත. එපමණක් නොව ඉංජිනේරු, නීති, පරිපාලන යන ක්ෂේත්‍රවලට අදාළවද උපාධි හෝ ඩිප්ලෝමා ලබාදීමේදී එකී උපාධිවලට අදාළ නියාමන ආයතනික ක්‍රියාවලිය සම්පූර්ණයෙන් නොසලකා හැර එහි පූර්ව වගකීම ඉහත පාලක මණ්ඩලය සතු කර ඇත. එපමණක් නොව ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාල පනත මගින් පිහිටුවන ආයතනවලින් ලබා ගන්නා මුදල් සම්බන්ධයෙන් වගකීම පැවරී ඇත්තේ රාජ්‍යයේ කුමන ක්‍රියාවලියකටද යන්න මෙම පනත මගින් පැහැදිලි කර නැත. ඒ හේතුවෙන් ඊට අදාළ විගණන ක්‍රියාවලියක් සිදු වීමට ඉඩ නැති අතර සයිටම් ආයතනයට ඇතුළත් වූ සිසුන්ගෙන් අයකරගන්නා ලද මුදල් පිළිබඳව පසුගිය කාලයේ ඇති වූ ආන්දෝලනය මේ මගින් තව තවත් තහවුරු වනු ඇත.

කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලයට සයිටම් ආයතනය අනුබද්ධ කිරීම සඳහා පසුගියදා ආණ්ඩුව ගත් තීරණයද මෙකී ක්‍රියාවලිය හා සමපාත වී ඇත. ඒ අනුව සයිටම් ආයතනයේ අධ්‍යාපනය ලද සිසුන් ඉහත සඳහන් පාලක මණ්ඩලය මගින් සුදුසුකම් සහිත සිසුන් බවට අනුමැතිය ලබාදීම ඒකාන්තයෙන් සිදුවනු ඇති අතර එයට අභියෝග කිරීමේ බලයක් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට නොමැති වනු ඇත. වෛද්‍ය අධ්‍යාපනය සම්බන්ධයෙන් මෙතෙක් කලක් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් පාඨමාලා අනුමත කිරීමත් සායනික පුහුණුව ලබාදීම පිළිබඳ නිර්ණායකත් තහවුරු කර තිබූ නිසාම අපේ රටේ ආරම්භ කරන ඕනෑම පෞද්ගලික වෛද්‍යවිද්‍යාලයක් ඉහත නිර්ණායකයන්ට යටත්ව එහි අනුමැතියට අනුව ක්‍රියාත්මක කළ යුතුව පැවතුණි. නමුත් කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාල පනත මගින් පිහිටුවන ලබන පාලක මණ්ඩලයට ඉහත කාරණා සම්බන්ධයෙන් තීරණ ගැනීමේ පූර්ණ බලයක් හිමිවන අතර එය අභියෝගයට ලක් කිරීමේ හැකියාවක් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට නොමැත. එපමණක් නොව මෙම පනත මගින් දේශීය මෙන්ම විදේශීය වශයෙන්ද ආයතනවලින් සහ පුද්ගලයන්ගෙන්ද ලැබෙන ඕනෑම මුදල් පරිත්‍යාගයක් ලබා ගැනීමේ අයිතියද පාලක මණ්ඩලයට පවරා ඇත.


**නව පනත සහ අධ්‍යාපනයේ අනාගත අඳුර**

මෙකී සියලු තත්වයන් යටතේ පැහැදිලි වන්නේ, අපේ රටේ අධ්‍යාපනය සම්බන්ධයෙන් තිබූ මූලික ප්‍රතිපත්තිය මෙම නව පනත මගින් විශාල වශයෙන් උල්ලංඝනය කර තිබීමය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව මෙම පනත මගින් බල රහිත අක්‍රීය තත්වයකට පත්කර ඇත. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ක්‍රියාකාරීත්වයද රාජ්‍ය වෛද්‍යවිද්‍යාලවලට පමණක් සීමා කර ඇති අතර වෛද්‍යවරුන් සම්බන්ධයෙන් මෙතෙක් වෛද්‍ය සභාවට තිබූ බලය සම්පූර්ණයෙන් ඉවත් කර ඇත. වෛද්‍ය අධ්‍යාපනය සම්බන්ධයෙන් මෙන්ම එහි ගුණාත්මකභාවය සම්බන්ධයෙන්ද මෙතෙක් තිබූ පූර්ණ වගකීම ඉවත් කිරීමත් සමග බිහිවනු ඇත්තේ වෛද්‍ය සභාවේ අනුමැතියට යටත් නොවන වෛද්‍යවරුන්ය. ඒ මගින් අපේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඇති විය හැකි බිඳවැටීමද වටහාගැනීම අපහසු නැත.

වසර ගණනාවක් පුරා අපේ රටේ අධ්‍යාපනය සම්බන්ධයෙන් තිබූ ජාතික නියාමන ක්‍රියාවලිය නිසාම රාජ්‍ය අධ්‍යාපනය අපේ රටේ දුවා දරුවන්ගේ අයිතියක් ලෙස යම් පමණකට හෝ ආරක්ෂා විය. එහෙත් එකී අයිතිය අහෝසි කිරීම සඳහා පාලකයන් විසින් විවිධ අවස්ථාවලදී ගන්නා ලද උත්සාහයන් පරාජය කිරීමට සිසුන් දෙමව්පියන් සහ ප්‍රගතිශීලී ජනතා ව්‍යාපාර මෙන්ම වෘත්තීය සමිති ව්‍යාපාරයද සක්‍රීය දායකත්වයක් සපයන ලදී. නමුත් පාලකයින් තම උත්සාහය අත්හැර නැත. ඒ නිසාම විවිධ අනපනත් මගින් තම උත්සාහය යථාර්ථයක් කර ගැනීමට ඔවුන් නිරතුරු කටයුතු කරමින් සිටී. 2018/18 දරන කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාල පනත පාලකයන්ගේ ඉහත වුවමනාව සම්පූර්ණ කර ගැනීම සඳහා දරන ලද නවතම උත්සාහයයි. මෙකී උත්සාහය පරාජයට පත්කිරීමේ වගකීම අපේ රටේ සිසුන් පමණක් නොව වෘත්තීය සමිති මෙන්ම ප්‍රගතිශීලී ජනතාවද භාරගත යුතුව ඇත. එසේ නොවන්නේ නම් අපේ රටේ දුවා දරුවන්ගේ අධ්‍යාපන අයිතිය වරප්‍රසාද අහිමි දරුවන්ට සිහිනයක් වනු ඇත.

> "වෛද්‍යවරයකු වීමේ වුවමනාව සහිත ඕනෑම කෙනෙකු වෛද්‍ය සභාවේ නියාමනය සහිත ආයතනයක තම උපාධිය සම්පූර්ණ කළ යුතුව ඇත. නමුත් මෙකී පනත මගින් සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ කාර්ය භාරය නොසලකා හැර ඇත. එපමණක් නොව ඉංජිනේරු, නීති, පරිපාලන යන ක්ෂේත්‍රවලට අදාළවද උපාධි හෝ ඩිප්ලෝමා ලබාදීමේදී එකී උපාධිවලට අදාළ නියාමන ආයතනික ක්‍රියාවලිය සම්පූර්ණයෙන් නොසලකා හැර එහි පූර්ව වගකීම ඉහත පාලක මණ්ඩලය සතු කර ඇත."

ජනතා විමුක්ති පෙරමුණේ මහජන නියෝජිතයින් විසින් පළ කළ අදහස් වෙනුවෙන් නියමුවා වේදිකාව වෙන්වෙයි.



2018 මැයි 09

# හොරුන්ට දඬුවම් දෙන බවට වූ ජනතාවගේ විශ්වාසය බිඳ වැටිලා!

(අධිකරණ සංවිධාන සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳ විවාදයට සහභාගි වෙමින්)

## පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත් සහෝදරයා



අවුරුදු තුනක් ගත වී ඇති නමුත් ආණ්ඩුවක් විදියට ඔබතුමන්ලාට තවමත් බැරි වෙලා තිබෙනවා, මේ රටේ ජනතාව තුළ නීතිය ගැන විශ්වාසයක් ඇති කරන්න. වංචාව හා දූෂණය නතර කරන්න, නීතිය ක්‍රියාත්මක කර හොරුන්ට දඬුවම් දෙන්න ඔබතුමන්ලාට තවමත් බැරි වෙලා තිබෙනවා. ඒ කිසිවක් ප්‍රායෝගිකව කරන්න පුළුවන් කියලා ඔබතුමන්ලා ඔප්පු කරලා නැහැ. අවුරුදු තුනක් ගත වෙලත් මේවා කර ගන්න බැරි වුණ තත්වයක තමයි මේ ආණ්ඩුව ඉන්නේ. එම නිසා දැන් ජනතාවට ඒ පිළිබඳව තවදුරටත් විශ්වාසයක් නැහැ; විශ්වාසය බිඳ වැටිලා තිබෙන්නේ. එවැනි අවස්ථාවක තමයි මේ අලුත් අධිකරණ පද්ධතිය හඳුන්වා දීම සිද්ධ වෙන්නේ.

දැන් ජනප්‍රිය මාතෘකාවක් බවට පත් වෙලා තිබෙන්නේ, හොරකම හා දූෂණවලට සම්බන්ධ වෙච්ච දේශපාලඥයන් පිළිබඳ මාතෘකාවයි. හැබැයි, අපි දන්නවා, අපේ රටේ, අපේ සමාජයේ දූෂණ හා වංචාවලට සම්බන්ධ වෙලා තිබෙන්නේ, හොරකම්වලට සම්බන්ධ වෙලා තිබෙන්නේ දේශපාලඥයන් පමණක් නොවන බව. රජයේ නිලධාරීන් සහ සේවකයන්, ඒ වාගේම පොලිසියේ සමහර නිලධාරීන්, විවිධ ක්ෂේත්‍රවල නිලධාරීන් වංචා හා දූෂණවලට සම්බන්ධයි කියලා අද වන කොට ප්‍රායෝගිකව ඔප්පු වෙලා තිබෙනවා. එම නිසි හුදෙක් ජනප්‍රිය මාතෘකාව දේශපාලඥයන් වුණාට, සමාජයක් වෙලාගෙන, සමාජයක් පුරාවට ගිලා බැස තිබෙන දෙයක් තමයි, වංචාව හා දූෂණය.

දැන් ජනතාවට ඕනෑ වෙලා තිබෙන්නේ, මේ හොරකම්වල ප්‍රමාණය නොවෙයි; මේ හොරු අල්ලන ක්‍රමයක්; මේ හොරුන්ට දඬුවම් දෙන ක්‍රමයක්. ඒ නීතිමය ක්‍රියාමාර්ග නැතුව හොරකම නතර කරන්න බැහැ. ඒ නීතිමය ක්‍රියාමාර්ග තමයි ජනතාවගේ පැත්තෙන් ඉල්ලන්නේ. ඔබතුමන්ලා එවැනි පොරොන්දු දුන්නාට, ජනතාවට එහෙම කිවුවාට, මේ හොරකම් නතර කරන්න, හොරුන් අල්ලන්න, හොරුන්ට දඬුවම් දීම සඳහා නීතිය ක්‍රියාත්මක කරන්න පසුගිය අවුරුදු තුනේම ඔබතුමන්ලා අසමත් වුණා. අද ඔබතුමන්ලාගේ ආණ්ඩුවේත් අලුතින් හොරකම් පටන් ගෙන තිබෙනවා. පසුගිය ඉතිහාසයේ වාගේම දේශපාලඥයින්, නිලධාරීන්, ආණ්ඩුවට සම්බන්ධ විවිධ කොටස් නැවත හොරකම් කරන්න පටන් ගෙන තිබෙනවා; කෝටි ප්‍රකෝටි ප්‍රමාණයේ වංචා දූෂණවලට හවුල් වෙලා තිබෙනවා. ඒවා පිළිබඳව තමයි සමාජයේ නැවතත් සාකච්ඡාවක් ඇති වෙලා තිබෙන්නේ. ඒ නිසා දැන් ජනතාවට මතුවෙලා තිබෙන ප්‍රශ්නයක් තමයි, "මේ ගෙනෙන අධිකරණ පද්ධතිය හරහා මෙය නවත්වන්න පුළුවන් වෙයිද?" කියන එක. ඒ සැකය ජනතාවට තිබෙනවා.

අද මේ පනත් කෙටුම්පත සම්මත කරලා හෙට පුළුවන්ද, මේ හොරු ටික අල්ලන්න; ලබන මාසය වන විට පුළුවන්ද, හොරුන්ට දඬුවම් දෙන්න; අවුරුද්දකින් පුළුවන්ද, හොරුන්ට දඬුවම් දෙන්න කියලා ජනතාව බලාගෙන ඉන්නවා. ජනතාවට තිබෙන ප්‍රශ්න ඒවායි. ජනතාවගේ පැත්තෙන් ජනතාව බලාගෙන ඉන්නේ, මෙපමණ කල් බලාගෙන හිටියා වාගේ මේ පනත මඟින්වත් හොරෙක්, දෙන්නෙක් අල්ලයිද, නීතිය ක්‍රියාත්මක කරයිද කියන එකයි. අපි දන්නවා, ඇත්තටම දැන් ඒ විශ්වාසය බිඳ වැටිලායි තිබෙන්නේ කියලා. දැන් හොඳටම ප්‍රමාද වැඩියි. ඇත්තටම මේ නීති ගෙනෙන්න හොඳටම ප්‍රමාද වැඩියි. මෙය කළ යුතුව තිබුණේ මීට

> "මේ නීතියෙන් නිලධාරින්ට, ඒ ආයතනවලට යම් ප්‍රමාණයක හයියක් ලැබෙනවා, නීතිය ක්‍රියාත්මක කරන්න. හැබැයි, ඒ විතරක් බැහැ. එම අවස්ථාවල දේශපාලන තීන්දු තීරණ ගන්නවා නම්, දේශපාලන මැදිහත්වීම් කරනවා නම් අන්න ඒවා වහාම නතර වෙන්න ඕනෑ. පසුගිය කාලයේ නීතිය ඉදිරියට ගෙන ආ යුතු වංචා දූෂණ බොහොමයක් යට ගැහුවා හැංගුවා; 'ඩීල්' වලින් වෙනස් කළා. "

බොහෝ කාලයකට කලිනුයි. ඒ අවශ්‍ය වෙලාවේ, අවශ්‍ය මොහොතේ එය කළේ නැහැ. අද ඒ හොරකම්වලට එරෙහිව නීතිය ක්‍රියාත්මක වෙන්න පටන් ගන්නකොට " දේශපාලන පළිගැනීම් කරනවා" කියලා කියන්න හොරුන්ට පුළුවන් වෙලා තිබෙන්නේ ඒ නිසා තමයි. ඒ හොරකම් පිළිබඳව නිකම් කථා බහක් විතරක්, නිකම් පූච්චානම් කථා විතරක් මාධ්‍යවල කරනකොට, පාර්ලිමේන්තුවේ කරනකොට හොරකමට භාජන වුණු කෙනාට පුළුවන්කම ලැබෙනවා, "මෙය පළිගැනීමක්. මෙය අපට එරෙහිව කරන හතුරුකමක්" කියලා කියන්න.

මේ නීතියෙන් නිලධාරින්ට, ඒ ආයතනවලට යම් ප්‍රමාණයක හයියක් ලැබෙනවා, නීතිය ක්‍රියාත්මක කරන්න. හැබැයි, ඒ විතරක් බැහැ. එම අවස්ථාවල දේශපාලන තීන්දු තීරණ ගන්නවා නම්, දේශපාලන මැදිහත්වීම් කරනවා නම් අන්න ඒවා වහාම නතර වෙන්න ඕනෑ. පසුගිය කාලයේ නීතිය ඉදිරියට ගෙන ආ යුතු වංචා දූෂණ බොහොමයක් යට ගැහුවා හැංගුවා; 'ඩීල්' වලින් වෙනස් කළා. ඒ නිසා තමයි අද පසුගිය කාලයේ චෝදනා තිබුණු ප්‍රධාන දේශපාලඥයන් වන ඇමතිවරුන්, නියෝජ්‍ය ඇමතිවරුන් කිසි කෙනෙකුට එරෙහිව ඇති චෝදනා නීතිය ඉදිරියේ හරියට විභාග වෙන්නේ නැත්තේ. ඒ ෆයිල් වෙනස් වන විධිය, ඒ ෆයිල් යට ගහන විධිය, ඒවා පස්සට අරගෙන වෙන වෙන ඒවායින් යටපත් කරන විධිය මේ රටේ ජනතාවට දැන් රහසක් නොවෙයි.

අපේ රටේ පසුගිය කාලයේ ඇති වෙච්ච විවිධ සිදුවීම්, අදත් ඇති වෙන සිදුවීම් පිළිබඳව සමහර අවස්ථාවලදී අග්‍රවිනිශ්චයකාරවරයා විසින් මෙවැනි ත්‍රිපුද්ගල අධිකරණ පිහිටුවලා ඉක්මනින් නඩු අහලා තීන්දු තීරණ දීලා තිබෙනවා. ඒ අනුව ජනතාවට ඒ සිදුවීම් පිළිබඳ සාධාරණය ඉෂ්ට වුණා කියන හැඟීමක් තිබෙනවා. හැබැයි, තවමත් දේශපාලඥයන්ට විරුද්ධව එල්ල වන චෝදනාවලට අදාළ නීතිමය ක්‍රියාමාර්ග අරගෙන ජනතාවට

15වැනි පිටුවට

2018 මැයි 22

# ගංවතුරෙන් සහ ආණ්ඩුවෙන් දෙකෙන්ම පරිස්සම් වෙන්න

(ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ විවාදයට සහභාගි වෙමින්)

## පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා



අද දිනයේ පාර්ලිමේන්තුව ආරම්භයේදී අපි දැක්කා, ගංවතුර ද, බඩු මිලද, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත ගැනද අද විවාදය විය යුත්තේ කියන කාරණය ගැන අද සැලකිය යුතු කාලයක් ගත කළ බව. ඇත්තටම අපේ රටේ ගංවතුර හා නායයෑම් පිළිබඳ අත්දැකීම් ගණනාවක් පසුගිය මෑත ඉතිහාසයේ අපට තිබෙනවා. ඒ ගැන මේ පාර්ලිමේන්තුව ඇතුළේ කොච්චර බෙරිහන් දුන්නත් වැඩක් නැහැ. ඒ විපතට පත්වෙන ජනතාවට සේවයක් සලසන්න, ඒ වෙනුවෙන් මැදිහත් වෙන්න ඕනෑ නම්, මහජන නියෝජිතයන් හැටියට ඔබතුමන්ලාට පුළුවන් පාර්ලිමේන්තුවෙන් එළියට ගිහිල්ලා ඕනෑ තරම් ඒ වෙනුවෙන් දායකත්වය දක්වන්න. ඒ එක් කාරණයක්. දෙවැනි කාරණය තමයි, අපි පාර්ලිමේන්තුවේ ඉඳගෙන කෑ ගහන මේ වෙලාවේත් ජනමාධ්‍ය සහ මාධ්‍ය ආයතන යම් යම් මෙහෙවරයන් විපතට පත් අසරණ ජනතාව වෙනුවෙන් ආරම්භ කරලා තිබෙන බව කියන්න ඕනෑ. ඒක නිසා මෙවැනි කටයුතුවලදී ඉතා දුප්පත්ම, දුර්වලම ක්‍රියාකාරිත්වය තිබෙන්නේ රජයෙයි. ආණ්ඩුවේ යාන්ත්‍රණය තමයි සියල්ලට පසුව පැමිණෙන යන්ත්‍රණය. ඒක ඉතින් ගංවතුරට අහුවෙන එක ගැන වගේම ජනතාවත් දන්නවා. සහන සලසන්න ආණ්ඩුව එන්නේ පස්සෙයි කියන එක, නාය යන තරමටම ජනතාවට ෂුවර්.

ගියවර දකුණු පළාතේ ඇති වූ ගංවතුර සහ නාය යෑම්වලින් පස්සේ අගමැතිතුමා ඇවිල්ලා කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රැස්වීමක් තියලා ඇහුවා, "මේ ආපදා වෙනුවෙන් සල්ලි හෙලිකොප්ටර්වලින් ගෙනැල්ලා හැලුවේ නැත්තේ මොකද?" කියලා. ඒ තරම් දෙන්න බලාපොරොත්තුවෙන් තමයි හිටියේ. හැබැයි, කිසිවක් දුන්නේ නැහැ. ඒ නිසා මේ පාර්ලිමේන්තුවේ ඉඳගෙන කෑ ගහන එක නොවෙයි මෙතුමන්ලාට කරන්න තිබෙන්නේ. මෙවරත් ජනතාවගෙන් අපිට ඉල්ලන්න තිබෙන්නේ, "ගංවතුරෙන් සහ ආණ්ඩුවෙන් දෙකෙන්ම පරෙස්සම් වෙන්න" කියලායි. ගංවතුරෙන් පරිස්සම් වෙනවා වාගේම ආණ්ඩුවේ බොරු පොරොන්දුවලිනුයි, බඩු බෙදන්න එන කට්ටියගෙනුයි, ආණ්ඩුවේ ආයතනවලින් දෙන ආධාර මලුවල තමන්ගේ නම ගහගෙන බෙදන කට්ටියගෙනුයි පරිස්සම් වෙන්න කියලා තමයි අපට ජනතාවගෙන් ඉල්ලන්න තිබෙන්නේ.

ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත ගැනත් මට එක ගැටලුවයි තිබෙන්නේ. මේ විවාදයට සම්බන්ධ වෙනකොටත් ඒක හෘදය සාක්ෂියේ ප්‍රශ්නයක් හැටියට තිබුණු දෙයක්. ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ පනත මහින්ද රාජපක්ෂ ආණ්ඩුවෙන් ගෙනැත් ක්‍රියාත්මක කරනකොට, ඒකට බරපතළම විවේචන ඉදිරිපත්

> "මෙවරත් ජනතාවගෙන් අපිට ඉල්ලන්න තිබෙන්නේ, "ගංවතුරෙන් සහ ආණ්ඩුවෙන් දෙකෙන්ම පරෙස්සම් වෙන්න" කියලයි. ගංවතුරෙන් පරිස්සම් වෙනවා වාගේම ආණ්ඩුවේ බොරු පොරොන්දුවලිනුයි, බඩු බෙදන්න එන කට්ටියගෙනුයි, ආණ්ඩුවේ ආයතනවලින් දෙන ආධාර මලුවල තමන්ගේ නම ගහගෙන බෙදන කට්ටියගෙනුයි පරිස්සම් වෙන්න කියලා තමයි අපට ජනතාවගෙන් ඉල්ලන්න තිබෙන්නේ."

කරපු කණ්ඩායමක් තමයි අපි. ඒ වාගේම එක්සත් ජාතික පක්ෂයත් බරපතළ විවේචන ඉදිරිපත් කළා. එක්සත් ජාතික පක්ෂය මේ පැත්තේ ඉඳගෙන ඉදිරිපත් කරපු විවේචන තිබුණා. ඒ ව්‍යාපෘතිවල තිබුණ අසාර්ථකභාවය, ඒ ව්‍යාපෘතිවලින් ආයෝජකයන්ට දීපු සහන ගැන කිවුවා. මට මතකයි, ජේම්ස් පැකර් ගැන ගොඩක් කථා කළ බව. මේ පාර්ලිමේන්තුවේ ජේම්ස් පැකර්ගේ ව්‍යාපෘතිය ගැන කථා කළා.

ඊළඟට, මත්තල ගැන කථා කළා. ඒ වාගේ හුඟක් ව්‍යාපෘති තිබුණා. ඒ ව්‍යාපෘතිවල අයෝජන සම්බන්ධයෙන් ලබා දුන් සහනවලට තිබුණු විවේචනය ගැන දැන් එක්සත් ජාතික පක්ෂයට තිබෙන්නේ මොන වාගේ අදහසක්ද? එක්සත් ජාතික පක්ෂය දැන් ඒ පනතම ක්‍රියාත්මක කරනකොට, ඒ විවේචන තමන්ගේ දේශපාලන දර්ශනය හැටියට පදනම් කර ගන්නේ නැද්ද? එහෙම නැත්නම් ඒක විපක්ෂයේ සිට ආණ්ඩුව පැත්තට ඉදිරිපත් කරපු හුදු විවේචනයක් විතරද? ඒකයි බේරා ගන්න ඕනෑ. එදා විවේචනය කරනකොට බැසිල් රාජපක්ෂගේ commission ගැනයි කථා කළේ. මම කියන්නේ ඒක වුණේ නැහැ කියලා නොවෙයි. ඒක වුණාද, නැද්ද කියලා ඔප්පු කර ගන්න බැරුව නේ තවම ඉන්නේ. දැන් ඊට වැඩිය සහන දෙනකොට මලික් සමරවික්‍රමට commission එන්නේ නැද්ද කියලයි අපට අහන්න තිබෙන්නේ. එච්චරයි.

ඊළඟට, මම අහන ප්‍රශ්නය මේකයි. දැන් කියනවා "පටන් ගත්ත එක ඉවර කරන්න යනවා" කියලා. ඔය කියන පදනමින්ම "පටන් ගත්ත ඒවා ඉවර කරන්න යනවා" කියලා මේගොල්ලෝත් ඔය පැත්තට ගියාම කිවුවොත් මොකද වෙන්නේ? අපට ඊළඟට බලන්න වෙන චිත්‍රපටය ඒකයි. මේගොල්ලෝ මේ පැත්තෙන් ඔය පැත්තට ගියාම කියනවා "ඔව්, විවේචනයක් තිබුණා තමයි, අපිත් විවේචනය කළා තමයි, හැබැයි මේ පටන් ගත්ත ඒවා ඉවර කරන්න තිබෙනවානේ" කියලා. එතකොට ආයෙත් ඒකම නේ, වෙන්නේ. මේ නාඩගම ගංවතුර වාගේම තමයි. මේ රටේ ජනතාව හැමදාම මේ නාඩගම බලාගෙන ඉන්නවා.

ඊළඟට, ඔබතුමා ඉන්න නිසා මේ කාරණාව පැහැදිලි කර ගන්න ඕනෑ. දැන් කියනවා, සිංගප්පූරු ගිවිසුම කැබිනට් එක අනුමත කළාලු. ගිවිසුම අත්සන් කළා. දැන් විවේචනයක් තිබෙනවා. වෘත්තිකයෝ, ඉංජිනේරු සංගම්, දොස්තර මහත්වරු හැම දෙනාටම තමන්ගේ වෘත්තීමයභාවය පිළිබඳ ප්‍රශ්නයක්; වෘත්තීයමය භාවය නැති වෙයිද කියලා ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමා කියනවා "සාකච්ඡා කරමු" කියලා. ජනාධිපති

15වැනි පිටුවට

කවුළුව හැරගිම තබමි

# ඒ කැට පිරී තිබුණේ කාසිවලින් නොවේ...




වසරක් පුරා කාසි දමා කැට පුරවන පිරිසකි. ඔවුහු සෑම වසරකම ඒ කැට තම හද පිරි සොම්නසින් යුතුව තම පංතියේ පක්ෂය වෙත පරිත්‍යාග කරති. ඒ, සමාජවාදී කම්කරු සංගමයේ සාමාජිකයෝය. එම කටයුත්ත සිය ශ්‍රමයෙන්, දහඩියෙන් ඉපැයූ සොච්චමින් පක්ෂයට කරනු ලබන විශිෂ්ටම පරිත්‍යාගය ලෙස ඔවුහු සලකති.

වසරක් පාසාම අඛණ්ඩව කරන එම උත්තුංග පරිත්‍යාගය පසුගිය දිනකත් ඔවුහු සිදුකළහ. ඒ වෙනුවෙන් පුංචි උත්සවයක්ද සංවිධානය කර තිබුණි. පංතියේ පක්ෂය තරම් තවත් උතුම් දෙවොලක් ඔවුන්ට නැත. පක්ෂයේ උන්නතිය ඉදිරි ගමන ගොඩනැගීම් සඳහා ඔවුන් කරන මෙම කැපකිරීම කිසිසේත්ම මුදලින් මැනිය නොහැක. එම කැට පිරී ඇත්තේ තනිකරම මිනිස්කමෙනි. ඒ, මෙරට පීඩාවට පත් ජනතාවගේ සටන් අරගල සඳහාම එය යොදවන්නේය යන දැඩි විශ්වාසය නිසාමය. එනිසාම ඒවායේ බහා ඇත්තේ මුදල් නොව මනුෂ්‍යත්වය, විශ්වාසය, ආදරය, සටන්කාමීත්වය වැනි දෑ පමණි. ඒවා මුදල මෙන් දස දහස් ගුණයක් උස්ය. මහ මෙරකටත් වඩා බරය. එසේ වන්නේ, එය සියලු බර උසුලා දරා සිටින මිනිසුන් උදෙසාම පමණක් වෙන්වී ඇති නිසාය. ඔවුන් කාසි බවට පත්කර ලබා දෙන්නේ මිනිස් ගුණයේ සාරයයි. එහි ජීවන සුවඳයි. එම ආදර්ශය මේ සමාජයට දෙන්නේ වෙන කුමන පක්ෂයකින්ද? ගිජුලිහිණියන් සේ මුදල පසුපසම හඹායාමට මිනිසුන් පොළඹවා තිබෙන සමාජයක මෙවැනි වෙනසක් දැකිය හැක්කේ සමාජ වෙනසක් සඳහා අරගල කරන පක්ෂයකින්ම පමණක් නොවේද?

# පෙරමඟ සටන්කරුගේ මැයි රැලිය



මෙවර මැයි දිනය ජ.වි.පෙ. සම්බන්ධයෙන් ගත්කළ ඉතා සුවිශේෂීය. ප්‍රධාන ධාරාවේ පක්ෂ සියල්ල අග නගරයෙන් ඈතට විසිවෙද්දී ජ.වි.පෙ. සිය මැයි දින සැමරුම අති උත්කර්ෂවත් ලෙස කොළඹදී පවත්වන ලදී. ප්‍රධාන ධාරාවේ එක් කණ්ඩායමක් ගාල්ල සමනල ක්‍රීඩාංගණයට විසිවී ගියේය. තවත් කණ්ඩායමක් මඩකලපුවටද තවත් කල්ලියක් සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණනයටද කොටුවූහ. ඔවුහු සුපුරුදු පරිදි නායකයන් පුම්බාගනිමින් තම පරිවාර ජනයාට සුරංග නා කතා කියමින් සුපුරුදු පරිදි වැඩකරන ජනතාවගේ මැයි දිනය කෙළසුවෝය. මැයි දිනයේ සැබෑ අරුත පිළිඹිබු කරමින් මෙවරද මැයි දිනය සැමරුවේ ජ.වි.පෙ. පමණක් බව විචාරකයන්ගේ මතයද විය. ජ.වි.පෙ. මැයි දින සැමරුම්වලට සහභාගි වූ විදෙස් වමේ නියෝජිතයෝද ඒ බව තහවුරු කළහ.

වැඩකරන ජනතාවගේ සමගියේ සැබෑ පණිවුඩය උතුරට ගෙනයමින් යාපනය නගරයේදී මැයි 01 දින කම්කරු දින සැමරුම සිදු කළ ජ.වි.පෙ. මැයි 07 කොළඹදී අති විශාල ජන ගඟකින් නගරය පුරවා මැයි දිනය සමරන ලදී.

කොළඹ නගරය තුළ එළිමහනේ මැයි දිනය පැවැත්වීමේ අභියෝගය සෙසු පක්ෂ හකුළා ගනිද්දී එම අභියෝගය ජ.වි.පෙ. ඉහළින්ම ජයගත්තේය. එය මෙවර මැයි දිනයේදී ජ.වි.පෙ. ලද දේශපාලන ජයග්‍රහණයකි. මැයි දිනය කම්කරුවන් ජෝගි නටවන දිනයක් නොව ඔවුන් අනාගත පාලක පංතිය බවට උසස් කරන, සංවිධානය කරන, සටන් කරන දිනයක්ම පමණක් බව මෙවරද ඔප්පු කළේ ජ.වි.පෙ. පමණි.

# ඔවුහු උදා සූර්යයා මෙන් ආලෝකය දුන්නෝය

*"ලෝකය අපගේ මෙන්ම ඔබගේය. එහෙත් අවසාන ජයග්‍රහණයේදී එය ඔබගේය. කාය ශක්තියෙන් හා ජීව බලයෙන් පිරිපුන් තරුණ ජනයා වන ඔබ උදා සූර්යයා මෙන් ජීවිතයේ පුෂ්ප සමයෙහි පසුවන්නාහුය. අපේ බලාපොරොත්තුව ඔබ මත තබා ඇත. ලෝකය ඔබට අයත්ය. චීනයේ අනාගතය ඔබට අයත්ය."*

ඉහත සඳහන් කළේ චීන ශිෂ්‍යයන් හා පුහුණු වන්නන් සමඟ රැස්වීමකදී 1957 දෙසැම්බර් 17 දින චීන විප්ලවීය නායක මාඕ සේතුං විසින් කළ කථාවෙන් කොටසකි.

උදා සූර්යයා මෙන් මිනිස් වර්ගයාට ආලෝකය ලබාදීමට සටන්කළ ශිෂ්‍ය පරපුරකට අපද උරුමකරුවෝය. ඔවුහු ඉගෙනගත්හ. සටන් කළහ. සටන් කරමින් ඉගෙනගත්හ. ඉගෙනගනිමින් සටන් කළහ; සටන වෙනුවෙන් තම ජීවිත පුද කළහ. ශිෂ්‍ය වීර දිනය එළඹෙන සෑම ජූනි 20වැනිදාම අපේ හිස් නැමෙනුයේ ඔවුන් හමුවේය. ඔවුන් අපේ වීරු සිසුවන්ය. ඔවුන් ඉගෙන ගත්තේ ස්වයං උන්නතිය සඳහා නොවේ. ඔවුන් සටන් කළේද පටු අරමුණු වෙනුවෙන් නොවේ. මෙරට පීඩිත ජනයාට විමුක්තියේ සූර්යාලෝකය ලබාදීම සඳහාය. ඒ වෙනුවෙන් ඔවුහු තම සොඳුරු තරුණ දිවිය දෙවෙනි තැනට දැම්මෝය.

ඔවුහු සිහින සාප්පුවල රස්තියාදු ගැසුවෝ නොවූහ. ඔවුන් දුක්ඛිත ජනයාගේ යහපත වෙනුවෙන් ඉතා දුෂ්කර කටුක මාවත්වල පිය මැන්නෝය. දෙපතුල්වල මඩ තවරා ගත්තෝය. එහෙත් ඔවුන්ගේ හදවත් පිරිසිදු හිම කැට මෙන් පවිත්‍ර විය. ඒවා හැමවිටම මානව දයාවෙන් පිරී ඉතිරී තිබිණි. ඔවුහු මෙරට දුක් විඳින මිනිසුන් වෙනුවෙන් කළ හැකි සෑම දෙයක්ම කළහ.



අද කළ යුත්තේ හුදු ඔවුනගේ ගුණ වයමින් සිටීම නොව ඔවුන්ගේ කැපකිරීම සහ ඔවුන් ගත් මඟ අධ්‍යයනය කිරීමය. ඔවුන්ගේ උත්තුංග අරමුණ ඉටු කිරීම මතු පරපුරට භාර නොකර එය සාක්ෂාත් කිරීමට සටන් වැදීමය.

# පොලිටිකල් පංතිය

පොලිටික්ක සෑහෙන දවසක් පංතියට ආවෙ නැති හින්ද හුඟ දෙනෙකුට පීරියඩ් එක අමතක වෙලත් ගියා. හැමෝටම වගේ වැදගත් වැඩ - ඕපදූප කියන අහන එක - තිබුණ නිසා අඩුවක් දැනුණෙ නෑ.

"ඈ මංජු, අපේ සර් සෑහෙන දවසකින් දැක්කෙ නෑනෙ. මොකද එයා මිසිං... ඇත්තටම මිසිං ඉන් ඇක්ෂන්ද?" කනිය ඇහුවට ඒකෙ තේරුම හරියටම දැනගෙන හිටියෙත් නෑ.

"ඇක්ෂන් නෑ මිසිං විතරයි." මංජුව ප්‍රශ්නෙ බාර ගත්තෙ අපභ්‍රංශ විදිහකට. "ඇක්ෂන් කවදත් තිබුණෙ නෑනෙ."

"මට මිනිහගෙ මූණත් දැන් මතක නෑ... මතක නෑ වගේ." චමිය වටපිට බැලුවෙ පොටෝ එකක් හොයන්න වගෙ.

"මතක නෑ. ඇත්තටම මතක නැද්ද?" සමන ඇහුවෙ පොටක් පාදගන්න.

"ඔව් මතක නෑ." චමිය කතාව එළියට ගන්න බලාගෙනම උත්තර බැන්ද.

"කාටද ළමයිනේ දැන් වෙන හැම බහුබූතෙම මතක තියෙන්නෙ?" ඔන්න පොලිටික්ක දොරෙන් මතුවුණා.

"ආ සර් දන්නවද? දැන් මතක නැතිවෙන එක මනින්න පුළුවන්." සමන අලුත් සොයාගැනීමක් කළා. "සර්ට මතක නැත්තෙ මොන මට්ටමටද?"

"අනේ මං දන්නෑ ළමයිනේ ඔය මතක මට්ටම්. මං දන්නෙ තම්මැට්ටම් විතරයි." පොලිටික්ක අභිනයෙන් තට්ටු කළා.

"අපි දන්නෙත් නෑනෙ... මම දන්නෙත් නෑ." කීප පොළකින් ඇහුණා.

"දැනුම අප්ඩේට් කරගන්න එපෑයෑ." සමන අගේ වැඩුව. "දැන් මතක මට්ටම් කියල එකක් තියෙනව. සර්ට මතක නැත්තෙ දුමින්ද මතක නෑ වගේද දයාසිරිට මතක නෑ වගේද?"

"මොකක්ද සමන් ඒකෙ වෙනස?" පොලිටික්ක අහුවෙලා ඉවරයි.

"වෙනසක් තියෙනව සර්. මතක නැති වෙන එකේ උපරිමයයි අවමයයි. මට්ටම් දෙකක්. අනිත් හැම එකක්ම ඒ අතර."

"දුමින්ද ගත්තොත් මුකුත්ම මතක නෑ. ඒ කියන්නෙ මේ වෙඩි තිබ්බා, මැරුවා, මේ මතක නෑ. උපරිමේ. දයාසිරි ගත්තොත් චෙක් එකක් ලැබුණා මතකයි. මාරු කරලා ලක්ෂ දහයක් ලැබුණා මතකයි. චෙක් එක අස්සන් කරලා තිබුණේ කවුද කියලා මතක නෑ. ඒක අවම අමතක වීම."

"ඒක මරු අමතක මීටරේ" පොලික්කට කියවුණේ දිග පළල ගැන අදහසක් නැතුව.

"ඔව් සර්. එතකොට මිග් කේස් එකෙන් ඩොලර් මිලියන 7ක් ගැහුව කියල මතක නැති අය ඉන්නව. ඒක හෙළිදරව් කරයි කියල ලසන්ත වික්‍රමතුංගව බැටලුවො මරන පිහියෙන් ඇනල මැරුව කියල මතක නැති අය ඉන්නව. තාජුඩීන් මැරුව කියල මතක නැති අය ඉන්නව. ඒ විතරක් නෙමෙයි, මහ බැංකු බැඳුම්කරේදි මිලියන දාහ පැනල ගැහුව කියල මතක නැති අය ඉන්නව." සමන එක හුස්මට කියල දැම්ම.

"එතකොට විමල්ටත් අමතක වුණා නේද කෝටි හතක් හොයපු විදිය." මංජුව අත්වැල් ඇල්ලුව. "පොල්ගම්පළටත් අමතක වුණා, පෙරවැරදි."

"ඔය රෝගෙ තදටම එන්නෙ ලොකු අයට. ජනාධිපති පුටුවෙ ඉඳගත්තට පස්සෙ කී දෙනෙකුට අමතක වුණාද විධායකේ අහෝසි කරන්න තමන් පොරොන්දු වුණා කියල?" සමන ඩෙස් එකේ හරිබැරි ගැහුණා.

"ඒක ඇත්ත. චන්ද්‍රිකා, මහින්ද, මෛත්‍රී තුන්දෙනාටම අමතක වුණානෙ... අනෙක මෛත්‍රීට රෝගෙ බරපතළයි. එයාට ඊයෙ පෙරෙයිදා කියපු දේවල් අමතක වුණානෙ." කනියත් දන්න දේවල්.

"ඕක මොකද්ද? මහින්ද මහත්තයට අමතක වුණානෙ තමන් දෙපාරක් ජනාධිපති වුණා කියලත්. 2009 යුද්ධෙ ඉවර වුණා කියලත් එයාටයි එයත් එක්ක ඉන්න හුඟ දෙනෙකුටයි අමතක වුණානෙ." මංජුව පොලිටික්ක පැත්තට නියෙච්ච.

"දැන්නම් මට හිතෙන්නෙ ලොකුම අමතක වීම වෙලා තියෙන්නෙ මිනිස්සුන්ට කියල. කට්ටියක් තමන් තාමත් ජීවත් වෙන්නෙ වහල් යුගේ කියල හිතනව. එයාලා තමන්ව පාලනේ කරන කසේ අතට දෙන්න වහල් හිමියෙක් හොයනව. ඒකාධිපතියො පස්සෙ යන්නෙ ඒකනෙ." සමන කියද්දි පොලිටික්කට මතක මීටරේ ගැන ඇහුව මෝඩකම කියල හිතුණා.

**පසුගිය මැයි 14වැනි දින කොළඹ පලස්තීන තානාපති කාර්යාලය විසින් 'අල් නක්බාර් දිනය' ස්මරණය කිරීම වෙනුවෙන් ලක්ෂමන් කදිරගාමර් මධ්‍යස්ථානයේ පවත්වන ලද සමරු වැඩසටහනේ ප්‍රධාන දේශනයක් පවත්වන ලද්දේ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයාය. ඔහු විසින් ඉදිරිපත් කරන ලද දේශනයේ ලිඛිත සටහන නියමුවා ඔබ වෙනුවෙන් මෙසේ පළ කරමු.**

අපේ ජීවිතවල බොහෝ සැමරුම් දින හමුවනවා. ඇතැම් ඒවා සතුට උපදවන සැමරුම්. ඇතැම් ඒවා දුක වේදනාව හා බැඳී තිබෙනවා. ඉතිහාසය තුළ ජනතා විමුක්ති පෙරමුණ ලෙස අපේ පක්ෂයට සිදුකරන ලද රාජ්‍ය මර්දනයන් දෙකකදී අපට අහිමි කළ, අපෙන් උදුරාගත් ප්‍රේමණීය සහෝදර සහෝදරියන් සිහිපත් කරන දින දෙකක් අපට තිබෙනවා. ඒ, අප්‍රේල් 05 සහ නොවැම්බර් 13 දිනයන්. අද මේ සිහිපත් කරන අල් - නක්බාර් දිනයත් එබඳු වේදනා සහගත මතකයක් සමග බැඳුණු දිනයක්. අල් - නක්බාර් වචනයේ අර්ථයමත් 'මහා විනාශය' යන්නයි.

1948 මැයි 14 දිනය පලස්තීන ජනතාවට වේදනාත්මක මතකයක්. එතෙක් පැවති නිල පලස්තීන භූමියේ අවසානය සහ ඔවුන් උපන් බිම අහිමි වූ සරණාගත මිනිසුන් බවට පත්වීම ඇරඹෙනුයේ එදින සිටයි. 1948 යුද්ධය තුළ පලස්තීන ජනතාවට තමන්ගේ උපන් ගම් බිම්වලින් පිටුවහල් වීමට සිදුවුණා. සියලු දේ අත්හැරදමා යාමට සිදුවුණා. ඔවුන්ගේ නිවාස විනාශ කෙරුණා. ලක්ෂ 07කට වැඩි පලස්තීනුවන්ට මේ ඉරණම අත්වුණා. උපන් බිම තුළම සරණාගතයින් වීමට සිදු වීම කෙතරම් ඛේදවාචකයක්ද?

ජෝදානය, ලෙබනනය, සිරියාව, බටහිර ඉවුර, ගාසා තීරුවටත් තවත් පිරිසකට වර්තමාන ඊශ්‍රායලය තුළමත් කොටුවීමට සිදුවුණා. අද දක්වාම ඔවුන්ගේ ඉරණමෙහි වැඩි වෙනසක් වී නැහැ. අද වන විට මේ සිදුවීමෙන් වසර 70ක් ගතවී තිබෙනවා. එහෙත් පලස්තීන ජනතාවට අහිමි වූ බොහෝ දේ නැවත ලැබී නැහැ. ඔවුනට අහිමි වූ ගම්බිම් නැවත ලැබී නැහැ. ස්ථිර නිවාස ලැබී නැහැ. ඔවුන් විශාල පිරිසක් තවමත් කඳවුරු ජීවිත ගත කරන සරණාගතයින්.

බොහෝ පලස්තීනුවන්ට අවම වයෙන් අල් - නක්බාර් දිනය සැමරීමට හැකි වුවත් වත්මන් සියොන්වාදී ඊශ්‍රායලය තුළ තමන් මුහුණපෑ මහා විනාශය, ඛේදවාචකය සැමරීමටවත් ඔවුනට නිදහසක් නැහැ. එය දඬුවම් ලැබිය යුතු වරදක් බවට පත් කර තිබෙනවා. එහෙත් ලොව පුරා ලක්ෂ සංඛ්‍යාත පලස්තීන ජනතාවක් අද අල් - නක්බාර් දිනය සිහිපත් කරනවා. එසේම මේ ආකාරයෙන් ඔවුන්ගේ නිදහස් සටනට සහය පළ කරන දහස් සංඛ්‍යාත විදේශීය ජනතාවක්ද මේ සමරුම්වලට එක්වෙනවා.

සැබැවින්ම අපි ඉතිහාසයේ සිදුවීම් සමරන්නේ හුදු එය සිහිපත් කිරීමට පමණක් නෙමෙයි. ඒ පිළිබඳව අලුතින් කියවා ගැනීමටයි; එය අපේ ඉදිරි ගමන්මඟට ආලෝකයක් කරගැනීම සඳහායි. අල් - නක්බාර් සැමරුමේත් අදහස එය විය යුතුයි. පලස්තීන ජනතාවට මීට වසර 70කට පෙර අහිමි වූ දේ මතක් කර ගනිමින් ඔවුන්ට සිදුවූ ඓතිහාසික අසාධාරණය පිටුදැකිය යුතුයි. සාධාරණය ඉටුවිය යුතුයි. ඒ සඳහා ලොව පුරා ප්‍රගතිශීලී ජනතාවගේ සහය ලැබිය යුතුයි.

අද අපි මේ අල් - නක්බාර් සමරන්නේ එක්සත් ජනපදය ප්‍රමුඛ අධිරාජ්‍යවාදීන් තවමත් ලේ සහ තෙල් සොයමින් මැදපෙරදිග කලාපයේ සැරිසරමින් සිටින අවදියකයි. පසුගියදා ඇමරිකානු එක්සත් ජනපද, බ්‍රිතාන්‍ය හා ප්‍රංශ ඒකාබද්ධ හමුදා සිරියාවට ගුවන් ප්‍රහාර එල්ල කළා. සිරියාව ස්වෛරී රටක්. ඒත් අධිරාජ්‍යවාදී රටවල් කල්පනා කරන්නේ රටවල්වල අභ්‍යන්තර කටයුතුවලට -ප්‍රජාතන්ත්‍රවාදයේ නාමයෙන් - මැදිහත්වීමට තමන්ට අයිතියක් ඇති බවටයි.

එදා ඔවුන් ඊශ්‍රායලය නිර්මාණය කිරීමේදීද මෙම තර්කය යොදා ගත්තා. ඇත්තටම ඔවුන් එසේ කළේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන්වත් හිට්ලර්ගේ පලිග ැනීම්වලට ලක්වුණු මිනිස්සුන්ට සාධාරණයක් කරන්නවත් නෙමෙයි; මැදපෙරදිග කලාපයේ තෙල් සම්පත් පාලනය කරන්නයි. අද මැදපෙරදිග ඇමරිකා එක්සත් ජනපදය වෙනුවන් යුද්ධ කිරීම ඔවුන්ට පැවරී තිබෙනවා. ඇමරිකා එක්සත් ජනපදය ඉරාන න්‍යෂ්ටික ගිවිසුමෙන් ඉවත්වීමත් එක්ක ඊශ්‍රායලය සිරියාවේ ඉරාන ඉලක්ක වෙත ප්‍රහාර එල්ල කරන්නේ ඒ නිසයි. මැදපෙරදිග නැවත නැවත දේශසීමා බෙදන්න, දුබල නව රටවල් හදන්න අධිරාජ්‍යවාදීන්ට අවශ්‍යයි. සිරියාව කැබලි කරන්න හදන සැලසුමක් පසුගියදා කියුබාව විසින් අනාවරණය කරගත් පුවතක් මාධ්‍ය වාර්තා කළා.

ප්‍රජාතන්ත්‍රවාදය අධිරාජ්‍යවාදීන්ට තමන්ගේ කැත හැසිරීම වහගන්න පිරුවටයක් විතරයි. පලස්තීන ජනතාවගෙ අයිතීන් සම්බන්ධයෙන් ඔවුන් නිහඬ ඇයි? පලස්තීන ජනතාවගේ දශක හතකට වැඩි කාලයක වේදනා, අයුක්තිය, අසාධාරණය සම්බන්ධයෙන් ඔවුන් නෑසූ කන් ඇතිව ඉන්න එක ඉතිහාසයේ සරදමක්. අධිරාජ්‍යවාදීන්ට තිබෙන්නේ, තමන්ගේම වන බල වුවමනාකම් අනුව සකස් කර ගත් විදෙස් පිළිවෙතක් බව ඉතාම පැහැදිලියි. අනෙක් අතට සැබැවින්ම පලස්තීනුවන්ට සිදුකරන ලද අසාධාරණයේ, අයුක්තියේ නිර්මාතෘවරුන්ද අධිරාජ්‍යවාදීන්මයි.

නැවතත් අපි සිරියාව දෙසට හැරුණොත් ඔවුන් ප්‍රහාරය සඳහා 'නිදහසට කරුණු' ලෙස යොදා ගත්තේ සිරියාව රසායනික අවි භාවිත කළ බවට වන චෝදනාවකුයි. එය තහවුරු කළ චෝදනාවක්ද නෙමෙයි. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අනුමැතියක් ලැබී තිබුණේද නැහැ. අපිට මතකයි ඉරාකය ආක්‍රමණය කිරීම සඳහාද මෙවැනිම ආකාරයේ චෝදනාවක් එකල පදනම් කරගත්තා. ඒ, ඉරාකය සතුව සමූල ඝාතක අවි ඇති බවයි. ඒත් ඉරාකය ආක්‍රමණය කර මිලියනයකට වැඩි ජනතාවක් මරා දැමීමෙන් පසුවද ඔවුන් කිසිදා ඒවැන්නක් ඔප්පු කිරීමට සමත් වුණේ නැහැ.

ඒ අනුව අපට පැහැදිලියි, මෙබඳු චෝදනා පදනම් කරගනිමින් ඍජුවම ප්‍රහාර එල්ල කරන්නේත් තමන්ගේ මැදපෙරදිග උදව්කරුවා වන ඊශ්‍රායලය ලවා ප්‍රහාර එල්ල කරවන්නේත් මැදපෙරදිග කලාපයේ තම දේශපාලන හා යුද ආධිපත්‍යය තහවුරු කර ගැනීම සඳහා බව. එමගින් මෙම කලාපයේ තෙල් සම්පත ඇතුළු ස්වභාවික සම්පත්වල පාලනය තමන් අතට ගැනීම සඳහා බව.

එක් අතකට මෙය අලුත් ක්‍රියාමාර්ගයක්ද නෙමෙයි. පලස්තීනුවන් තමන්ගේ මව්බිමෙන් පලවා හැරීමෙන් මැදපෙරදිග නිර්මාණය කළ නොසන්සුන්කාරීත්වයේම, යුදමය තත්වයේම දිගුවක්. දශක ගණනාවක් තිස්සේ ඇමරිකා එක්සත් ජනපදය ඇතුළු අධිරාජ්‍යවාදී බලවේග ගෙනයන යුදවාදී ප්‍රතිපත්තියේම තවත් එක් අවස්ථාවක්.

මෙවැනි යුදමය මැදිහත්වීම් කිසිදා මැදපෙරදිගට සාමයක් කැඳවන්නේ නැහැ. කලාපය තුළ යුද උණුසුම තව තවත් වැඩිකරනවා පමණයි; තව තවත් රටවල් යුද්ධය වෙත කැඳවීම පමණයි. අප අල් - නක්බාර් පිළිබඳව කතා කරන්නේ මෙබඳු ලෝකයකයි. අවුරුදු හැත්තෑවකට කලින් වුණත් අද වුණත් අධිරාජ්‍යවාදී ආක්‍රමණයේ ස්වරූපය පමණයි වෙනස්. එය කලින් කලට, තැනින් තැනට වෙනස් විය හැකියි. නමුත් අධිරාජ්‍යවාදයේ අරමුණ වෙනස් වී නැහැ.

ඒ නිසා අල් - නක්බාර් දින සැමරුම අපට නැවත නැවතත් ඒත්තු ගන්වන්නේ අපට ඇත්තේ එක සටනක් බවයි. මනුෂ්‍ය සංහාරයන් සිදුවීම වැළැක්වීමේ මුවාවෙන් සිදුකෙරෙන අධිරාජ්‍යවාදී යුදමය ආක්‍රමණයන් පරාජය කළ යුතුයි. රටවල් යටත් කිරීම් මගින් අධිරාජ්‍යගැති රූකඩ පාලනයන් ගොඩනැගීමේ ක්‍රියාදාමය පරාජයට කළ යුතුයි.

අධිරාජ්‍යවාදී මැදිහත්වීම් හුදු එක් රටකට, ප්‍රදේශයකට, කලාපයකට සීමා වන්නේ නැහැ. ඒ නිසා අපේ විරෝධයද සටනද ජාත්‍යන්තර විය යුතුයි. ඒ සඳහා දේශසීමා භේදයකින් තොරව පෙරට එන ලෙස සමස්ත ලෝකවාසී ප්‍රගතිශීලී හා අධිරාජ්‍ය විරෝධී ජනතාවගෙන් ඉල්ලා සිටීමට මෙය අවස්ථාවක් කරගනිමින්ද මෙම අවස්ථාව ලබාදීම පිළිබඳව ස්තුති කරමින්ද මගේ කතාව අවසන් කරනවා.

## අප දෙරටේ...

03 පිටුවෙන්



විඳ ගැනීමට ලැබීම ගැන විශාල සතුටක් තිබෙනවා.
මැයි දින පෙළපාළියට වෘත්තීය සමිති හා කම්කරු සංවිධාන නියෝජනය කරමින් විශාල පිරිසක් සහභාගී වී සිටි අයුරු මා දුටුවා. එය හොඳින් සංවිධානය කර තිබුණා. දැවැන්ත විනයක් තිබුණා.
මැයි දින රැලිය ඉතාම විශාල එකක්. ඒක දැවැන්ත රැලියක් ඊට මම සහභාගී වී සිටියා. මට කථිකයන් පැවසූ දේවල් නොතේරුණත් සහභාගී වී සිටි පිරිස ප්‍රතිචාර දැක්වූ ආකාරයට මට තේරුණා වේදිකාවේ සිදු කළ කථා ඉතාම හොඳ ඒවා කියලා. සහභාගි වූ ජනතාව නැගී සිට ඉතා උණුසුම් ආකාරයෙන් ඒවාට ප්‍රතිචාර දැක්වූවා.
ඒ අත්දැකීම ඉතා වටිනා එකක්, එය මා තුළ, අපේ අරගලයේ ජයග්‍රහණය පිළිබඳව විශාල විශ්වාසයක් ඇති කළා. මා තුළ නව බලාපොරොත්තුවක් ජනිත කළා. ඒ වගේම ඔබේ පක්ෂය පිළිබඳවත් එහි සංවිධාන ශක්තිය, විනය පිළිබඳවත් විශාල වැටහීමක් මට ලැබුණා. මෙවන් අත්දැකීමක් ලබා දීම පිළිබඳ මා ඔබේ පක්ෂයට ස්තුතිවන්ත වෙනවා.

## අලුත් මුහුණු සොයන...

05 පිටුවෙන්

උත්සාහ දරන පරණ, බොල්, දුෂ්ට හා මුග්ධ චරිත උත්කර්ෂයට නැංවීමේ මුද්ධ දේශපාලනය වෙනුවට නව දැක්මක්, නව වැඩපිළිවෙළක් සහිත නව දේශපාලන බලයක් සඳහා නව දේශපාලන මධ්‍යස්ථානයක් නිර්මාණය කිරීමේ සැබෑ හා ජයග්‍රාහී දේශපාලනයට ජනතාව දැනුවත් කොට ඒකරාශී කළ යුතුය. මේ අර්බුදය අවස්ථාවක් කරගෙන ඒ තුළ සැබෑ විසඳුම් අපේක්ෂා කරන හැම දෙනා ඉදිරිපිට ඇති එකම විකල්ප මාවත වන්නේ එයයි.

## ප්‍රාග්ධනයේ සූරාකෑම...

07 පිටුවෙන්


සඳහන් කර ඇත. එනම් මාක්ස් එම යුගයේදීම අනාගතය දැක ඇත. 2008 ලෝක ආර්ථික අර්බුදයේ ස්වභාවය එනම් 'ආර්ථික බුබුල' - අතත්‍ය ප්‍රාග්ධනය, නැතහොත් මිත්‍යා ප්‍රාග්ධනය - මුල් වරට අනාවරණය කරන ලද්දේ මාක්ස් විසිනි. (ප්‍රාග්ධනයක් ලෙස පෙනෙන ප්‍රාග්ධනයක් නොවන මිත්‍යා ප්‍රාග්ධනය)

මෙලෙස සමාජය තේරුම් ගැනීම සඳහා, ආර්ථිකය තේරුම් ගැනීම සඳහා 'ප්‍රාග්ධනය' කෘතිය තුළ දැවැන්ත සත්‍යයන් ගණනාවක් හෙළි කරනු ලැබ ඇත.

මාක්ස් හුදු දාර්ශනවාදියකු පමණක් නොව තමන් හෙළි කළ දර්ශනය ක්‍රියාවට නැගීමට ප්‍රායෝගිකව මැදිහත්වූ ක්‍රියාධරයෙකි. ඔහු ප්‍රාග්ධනය කෘතිය තුළින් වර්තමාන ලාංකේය ධනවාදී දුබල පාලකයින්ට හඳුනාගත නොහැකි ධනවාදී අර්බුදයේ මූලයන් හෙළිකර පැහැදිලි කර දී ඇත. එම නිසා මාක්ස් මෙන්ම 'ප්‍රාග්ධනය' කෘතිය අපට ලෝකය දැකීමට මෙන්ම එය වෙනස් කිරීමට මතවාදී අවියකි.

## සියලු දෙනා එක හඬක්..

අවසන් පිටුවෙන්




සටනේ වාසිය තිබෙන්නේ අපිට. ධනපති පක්ෂ බලයෙන් වැඩියි වගේ පෙණුනට ගුණය තිබෙන්නේ වමේ පක්ෂවලයි. ප්‍රමාණය වැඩිවුණාට සතුරා දුර්වලයි. ඔවුන්ට ප්‍රතිපත්ති නැහැ. විනයක් නැහැ. ඔවුන් අතර සමගියක් නැහැ. පොදු අරමුණක් නැහැ. එනිසා විනයක්, ප්‍රතිපත්තියක්, ඉතිහාසයක් තිබෙන පක්ෂයක් පරාජය කරන්න කුමන්ත්‍රණකාරී කල්ලියකට බැහැ. අපිට තිබෙන වාසිදායක අවස්ථාව අපේ බලවේග හොඳින් තේරුම් ගත යුතුව තිබෙනවා. අපේ රටේ ප්‍රගතිශීලී බලවේග අනිවාර්යයෙන් තීන්දුවක් ගත්තොත් අපේ රට වෙනස් කරන්න පුළුවන්. අපිට තිබෙනවා දැවැන්ත මතවාදී අරගලයක්. ජනතාවගේ චින්තනය වෙනස් කරන්න ඕනෑ. මිථ්‍යාව වෙනුවට සත්‍ය ගෙනෙන්න ඕනෑ. සම්ප්‍රදාය වෙනුවට රැඩිකල් බව ගේන්න ඕනෑ. අලුතෙන් හිතන්න පුරුදු කරන්න ඕනෑ. බැහැයි කියලා ඉන්නේ නැතිව පුළුවන් කියලා හිතන්න පුරුදු කරන්න ඕනෑ. පෞද්ගලික පටු අරමුණුවලින් තොරව ජනතාව සංවිධානය කරන්න ඕනෑ. හදන බලවේගයේ න්‍යෂ්ටිය බවට, අරටුව බවට පත්වීමේ සියලු සුදුසුකම් තිබෙන්නේ ජනතා විමුක්ති පෙරමුණේ ඔබට අපිට විතරයි.

අපි මේ රටේ ජනතාවගෙන් ඉල්ලනවා ජනතා විමුක්ති පෙරමුණ විශ්වාස කරන්න කියලා. අද අපේ රටේ දේශපාලනය, ජාත්‍යන්තර වමේ ව්‍යාපාරයන්ගේ වැඩිම සහයෝගය තිබෙන්නේ ජනතා විමුක්ති පෙරමුණටයි. විශ්වවිද්‍යාල ආචාර්යවරු, වෘත්තීයවේදීන්, ප්‍රගතිශීලී කලාකරුවන්, රට ඉදිරියට ගෙනියන්න කැමති භික්ෂූන් වහන්සේලා, පූජකතුමන්ලා මේ හැම දෙනාගේම සහාය, ආශීර්වාදය නොඅඩුව ජවිපෙට ලැබෙනවා. දැන් බිමට අලුත් බලවේගයක් ඕනෑ. කම්කරු ජනතාවට, ගොවි ජනතාවට දෛනික සටන් මෙන්ම අලුත් ආණ්ඩුවක් හදන සටනේ බලවේගයක් බවට පත්වෙන්න ඕනෑ. ධනවාදය පරද්දන රට පාලනය කරන බලවේගයේ කොටස් කාරයන් බවට පත්වෙන්න පුළුවන් ව්‍යාපාරයක් හදන්න ඕනෑ. අපේ පාලනයක් නිර්මාණය කිරීම වෙනුවෙන් අපි සියලු දෙනාම දායක වෙමු."

13 පිටුවෙන්

## ගංවතුරෙන් සහ ආණ්ඩුවෙන්...



ලේකම්තුමා කියනවා "සාකච්ඡා කරමු" කියලා. කවදාද සාකච්ඡා කරන්නේ, කොහොමද ඒක ඉවර කරන්නේ?

"අශ්වයා ගියාට පස්සේ ඉස්තාලය වහලා වැඩක් නැහැ" වාගේ ඔබතුමන්ලා මේ ක්‍රියාවලියම කරලා, කැබිනට් මණ්ඩලයේ අනුමත කර අවසාන කරලා, ගිවිසුම අත්සන් කළාට පස්සේ කියනවා, "මොනවා හරි ගැටලුවක් තිබෙනවා නම් සාකච්ඡා කරමු" කියලා. ඒ ක්‍රමයයි, අද මේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමයන් ගෙනෙන විධියයි දෙකම එක හා සමානයි. මේ කියන්නේ, "මේ ආණ්ඩුව වැරැදියට මේක කළා. කරන්න දෙයක් නැහැ. ඉවර කරන්න ඕනෑ" කියලා. ඊළඟ එකේත් කියන්නේ ඔහොම තමයි. ඒ වෙලාවේත් කියයි, "සිංගප්පූරුවත් එක්ක ගිවිසුම අත්සන් කළා. දැන් අත්සන් කරලා ඉවරයි. අඩුපාඩුවක් තිබෙනවා නම් ලබන අවුරුද්දේ මොනවා හරි කර ගනිමු" කියලා.

මේවා නිකම් ආවාට ගියාට, යන ගමන්, "එහෙම නම් පස්සේ කථා කරලා මොනවා හරි කරමුකෝ" කියලා සරලව කියන්න පුළුවන්. හැබැයි, ඒවා අපේ රටේ ජනතාවගේ ජීවිතත් එක්ක ගැට ගැහුණු ඒවා; වෘත්තීන් එක්ක ගැට ගැහුණු ඒවා. අපි දන්නවා, මේ කිසිම වෘත්තීය සංවිධානයක්, වෘත්තීයවේදීන් කවුරුවත් එකවර විරෝධතා මතු කරන්නේ නැහැ කියලා. ඔබතුමාගේ අමාත්‍යාංශය වුණත්, වෙන කිසිම අමාත්‍යාංශයක් වුණත් මේ පාර්ලිමේන්තුවට ගෙනෙන හැම පනත් කෙටුම්පතකටම කවුරුවත් විරුද්ධ වෙන්නේ නැහැ නේ. ඔන්න එහෙම නම් හිතා ගන්න පුළුවන්, මේක, ආණ්ඩුව ගෙනෙන හැම පනත් කෙටුම්පතකටම විරුද්ධ වීමක් කියලා. එහෙම නැහැ. ආයෝජන ප්‍රවර්ධනය කරන්න ගෙනෙන පනත් කෙටුම්පත් හැම එකකටම මේ රටේ වෘත්තීයවේදීන්, ජනමාධ්‍යයන් විරුද්ධ වෙලා නැහැ. මේ විරුද්ධතාව හැදිලා තිබෙන්නේ නිශ්චිත කාරණාවක් සම්බන්ධයෙන්. ඒක නිසා ඔබතුමාගේ අවධානය ඒකට යොමු කරනවා.........................

## හොරුන්ට දඬුවම් දෙන...



පෙන්වා නැහැ. පසුගිය ඉතිහාසය ගත්තොත් කොයි ඇමතිවරයාද, කොයි දේශපාලනඥයාද අල්ලස් හෝ දූෂණ චෝදනා යටතේ හිරදඬුවම් ලබලා දඬුවම් ලබලා තිබෙන්නේ? හැමදාම හොරකම ගැන කථා කරනවා; වංචා ගැන කථා කරනවා.

."ඒ පැත්තත් එකයි. මේ පැත්තත් එකයි. කොහොමත් එකයි. වැඩක් නැහැනේ" කියන තැනට තමයි මිනිස්සු පත් වෙලා ඉන්නේ. මේ හොරකම් නතරවෙයි කියන විශ්වාසය ජනතාව තුළ ඇති වෙලා නැහැ. ඒ නිසා මේ උසාවි පිහිටුවීමට පමණක් සීමා වෙන්නේ නැතිව, දේශපාලන "ඩීල්" නතර කරලා, හොරුන් ආරක්ෂා කරන දේශපාලන "ගේම්" නතර කරලා කොහොමද මේ හොරකම් නතර කරන්නේ කියන එක භාවිතයෙන් පෙන්වන්න.

මේ අධිකරණය පසුගිය කාලයේ කරපු හොරකම් පිළිබඳව විමර්ශනය කරන අධිකරණයක්. කෙනෙක් නිර්දෝෂි නම් ඒ අධිකරණයේදී ඔප්පු කරන්න පුළුවන් තමන් නිර්දෝෂියි කියලා. ඒ ගැන භය වෙන්න දෙයක් නැහැ. භය නිසා විරුද්ධ වෙනවා මිස, භය නැත්නම් මේ අධිකරණ පිහිටුවීමට පක්ෂ වෙන්න ඕනෑ. අපි කියනවා, ජනතා විමුක්ති පෙරමුණේ අපි මේ අධිකරණවලට භය නැහැයි කියලා. මොකද, අපි මේ රටේ ජනතාවගේ සම්පත් වංචා කරපු නැති, හොරකම් කරපු නැති, දූෂණ කරපු නැති පක්ෂයක් නිසා. දේශපාලනය තුළ පමණක් නොවෙයි, නිලධාරීන්ගේ පැත්තෙනුත් රටේ සියලු ක්ෂේත්‍ර පුරාම ඔඩු දුවලා තිබෙන මේ වංචා දූෂණ නතර කිරීම සඳහා මෙවැනි ශක්තිමත් නීතියක් වහාම ක්‍රියාත්මක කළ යුතුයි.

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com


# ජනතාවගේ අදහස්වලට ඇහුම්කන් දෙන පාලනයක් රටට අවශ්‍යයි

**ජ.වි.පෙ. නායක**
**අනුර දිසානායක සහෝදරයා**




රට ගොඩනැගීම සඳහා වෙනස් ආර්ථික ප්‍රතිපත්තියකට මාරුවීම, වංචා, දූෂණ නතර කිරීම, ජාතික සමගිය ගොඩනැගීම, ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීම යන දේශපාලන වුවමනාවන් මූලික විය යුතු බව අවධාරණය කළ ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා, ජනතාව සමග සංවාදය කරමින්, ඔවුන්ගේ අදහස්, උදහස්වලට ඇහුම්කන් දෙන පාලනයක් රටට අවශ්‍ය වී ඇතැයි ප්‍රකාශ කළේය.

ඔහු මේ බව ප්‍රකාශ කළේ පසුගිය 07වැනි දින කොළඹ බී.ආර්.සී. පිටියේ පැවති රතු මැයි රැලි වේදිකාවේදීය. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර දිසානායක සහෝදරයා මෙසේද පැවසීය.

"මේ දක්වා රට පාලනය කළ එක්සත් ජාතික පක්ෂයත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් වෙන් වෙන්වත්, දැන් දෙපිරිස එක්වත් රට පාලනය කරමින්, අසාර්ථකත්වයම ඔප්පු කොට තිබෙනවා. එක කාලයක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අය එක්සත් ජාතික පක්ෂයට අර ගනිමින්, තව කාලයක එක්සත් ජාතික පක්ෂයේ අය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට අර ගනිමින් අවුරුදු හැත්තෑවක් රට පාලනය කළා. අවුරුදු හැත්තෑවක් කියන්නේ ඉතාමත් දිගු කාලයක්. දශක හතක් මේ රට පාලනය කළ පාලකයන් අපේ රටත්, ජනතාවත් ගෙනැත් තිබෙන්නේ කවර තැනකටද? අවුරුදු හැත්තෑවක් අසාර්ථක වුණු මෙම පාලකයෝ තව අවුරුදු පනහක් රට පාලනය කළත්, මීට වඩා කිසි වෙනසක් වෙන්නේ නැති බව දැන් ඉතාම හොඳින් පැහැදිලි කර තිබෙනවා.

ජනතාවගේ වුවමනාවන් වෙනුවෙන් ඕනෑම කැපකිරීමක් කරන්න පුළුවන් දේශපාලනයකට විතරයි, මෙය වෙනස් කළ හැකි වන්නේ. අනික් සෑම පක්ෂයකටම දේශපාලනය බිස්නස් එකක්. අතිශය ලාභදායක ව්‍යාපාරයක් කරගෙන. පොදු ජනතාව හැටියට මහජනයාගේ දේපළ සොරමුලක් විසින් අත්පත් කර ගැනීම අපි ඉවසිය යුතුද? වංචාවෙන්, දූෂණයෙන් තොර ජනතා විමුක්ති පෙරමුණ ප්‍රමුඛ බලවේගවල පාලනයක් බිහි කිරීමේ අරගලයක් අපි දියත් කරමු. අපි දේශපාලනය ව්‍යාපාරයක් බවට පත් කර ගත් මිනිස්සු නොවෙයි. වංචාව, දූෂණය පිරිවරාගත් දේශපාලනය වෙනුවට කැප කිරීම, පරිත්‍යාගය උරුම කර ගත්ත දේශපාලන ව්‍යාපාරයක් අපේ රටේ බලයට එන්න ඕනෑ.

මේ මහ පොළොව තුළ වේගයෙන් ජාතිවාදය වපුරමින් යනවා. කොතැනකින් මතු වන ගිනි පුපුරකින් මහා ගිනි ජාලාවක් ඇති වෙයිද කියන සැකය මතු වී තිබෙනවා. හුදෙකලා ලෙස එක් ජාතිවාදයක් වර්ධනය වෙන්නේ නැහැ. එක් ජාතිවාදයක් විසින් තවත් ජාතිවාදයක් පෝෂණය කරනවා. හැබැයි, ජනතා විමුක්ති පෙරමුණ මේ රටේ ජාතිවාදයට එරෙහි සියලු බලවේගයන් එක්රැස් කරමින්, ජාතිවාදය පරාජයට පත් කර ජාතික සමගිය සඳහා වූ පියවරකට අපි අවතීර්ණය වී සිටිනවා.

ප්‍රජාතන්ත්‍රවාදයට අහිතකර විසකුරු බලයක් විධායක ජනාධිපති ක්‍රමයට තිබෙන බව ඕනෑවටත් වඩා පැහැදිලියි. ඒ නිසා අශිෂ්ටත්වය වෙනුවෙන් ගෝත්‍රවාදය වෙනුවෙන් පෙනී සිටින අයට අවශ්‍ය විදියට ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් පාවලා දෙන්න ඉඩ නොදෙන බව සහතික කරනවා. විසිවැනි සංශෝධනය ජයග්‍රහණය කිරීම සඳහා අවශ්‍ය බලවේග උපරිම ලෙස පෙළගස්වනවා.

ජනතාවත් එක්ක සංවාදය කරමින්, ඔවුන්ගේ අදහස්, උදහස්වලට ඇහුම්කන් දෙන පාලනයක් අවශ්‍යයි. අපි එහෙම පාලනයක් ගොඩනගමු. නව පාලනයක් සඳහා අවශ්‍ය ඉඩකඩ අන් කවරදාටත් වඩා වැඩියෙන් නිර්මාණය වී තිබෙනවා. ගොවි බිමේ ගොවි ජනතාව, ධීවර ජනතාව, වෘත්තීය සමිති ව්‍යාපාරය සංවිධානය කරන්න, පොදු ජනයා සංවිධානය කරන්න අසමත් වීම මතයි මේ පාලකයන් තවදුරටත් සිටින්නේ. ඒ නිසා මේ සියලු බලවේග ශක්තිමත්ව සංවිධානය කරන්න මෙම මැයි දිනයේදී අපි සියලු දෙනා එක්ව පියවර තැබීමට ආරාධනා කරනවා."







රතු මැයි පෙළපාළියේ විශේෂ අවස්ථා...




නේපාලයේ කාල් මාක්ස් සමරුවට එක්වෙමින්...




චීනයේ කාල් මාක්ස් සමරුවට එක්වෙමින්...



ජිනීවා හි ලෝක කම්කරු සම්මේලනයේදී...

# සියලු දෙනා එක හඬක් බවට පත් වුවහොත් ජයග්‍රහණය දුර නොවෙයි

**ජ.වි.පෙ. ප්‍රධාන ලේකම්**
**ටිල්වින් සිල්වා සහෝදරයා**

රටේ හෘද සාක්ෂියක් තිබෙන යහපත් මිනිසුන් නිහඬතාවය බිඳ දමා කතාකරන්නට පටන් ගත යුතු යැයි කියා සිටි ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා, ඒ සියලු දෙනා එක හඬක් බවට පත්වුවහොත් ජනතාවට ජයග්‍රහණ දුර නොවන බව පෙන්වා දුන්නේය.

ඔහු මෙම අදහස් පළ කළේ රතු මැයි රැලි වේදිකාවේදීය. එහිදී වැඩිදුරටත් කථා කරමින් ටිල්වින් සහෝදරයා මෙසේද කීය.

"මැයි දිනය සමරන මේ මොහොතේ ධනවාදයට වසර 500ක් ගතවෙලා තිබෙනවා. ඒ කාලය තුළ ධනවාදය ඔප්පු කරලා තියෙනවා ජනතාවට ගේන්න පුළුවන් මරණය, ලෙඩදුක්, වසංගතය, විරැකියාව, දුක, වේදනාව, කඳුල මිස ජීවිතය නෙවෙයි කියලා. ජනතාවට සතුට, සිනහව දෙන්න බැහැ කියල ඔප්පු කරල තියෙනවා. උපදින දරුවන්ට අධ්‍යාපනය, තරුණ තරුණියන්ට රැකියාවක්, ගොවියට ඉඩම්, ජනතාවගේ දහඩිය මහන්සියට හරියන වැටුපක් දෙන්න බැහැ කියල ධනවාදය ඔප්පු කරල තියෙනවා. අපිට හොඳ සෞඛ්‍ය සේවයක්, ප්‍රවාහන සේවයක්, මිනිහෙක් විදිහට ජීවත්වෙන්න ඕනෑ අවම දේවල් ටිකවත් දෙන්න ධනවාදයට බැහැ. තවදුරටත් එය අත්හදා බලන්න දෙයක් නැහැ. ලංකාවෙත් දැන් අවුරුදු 70ක් තිස්සේ ඒක ඔප්පු කරමින් තියෙනවා. ලෙනින් කියපු විදිහට ධනවාදය කුණුවෙලා දුගඳ හමන මළ කුණක් බවට පත්වෙලා. අපි කවුරුත් දැන් සූදානම් විය යුත්තේ මෙම මළකුණ වළලලා සියලු දෙනාට සාධාරණ ජීවත් විය හැකි සතුට සිනහව තිබෙන සෑම දෙනාටම අයිතිවාසිකම් ලබාදිය හැකි නව සමාජවාදී සමාජයක් ගොඩනගන්නයි.

දැන් කොයිතරම් ධනවාදය අර්බුදයට ගිහිල්ලද කියනවා නම්, දැන් ධනපති පක්ෂ පුද්ගලයින්ට මාරුවෙලා පුද්ගලයින් විදිහට ජනතාවගෙන් බලය ඉල්ලනවා. පක්ෂ වෙනුවට පුද්ගලයෝ ආදේශ වෙලා. පුද්ගලයින් ආදේශවීමම නරකම කාරණයක්. පුද්ගලයෝ පිටිපස්සේ යෑමෙන් රට විනාශ වෙනවා. ඒනිසා අපිට සටනක් තිබෙනවා. මේ මැයි දිනයෙන් පස්සේ දේශපාලනයේ බෙදුම් රේඛාව ජවිපෙ විසින් වෙනස් කරනවා. මීට කලින් අපේ රටේ දේශපාලනයේ බෙදුම් රේඛාව තිබුණේ කොලපාට, නිල්පාට කියලා එජාපය, ශ්‍රීලනිපය කියල බලයට ආපු එකයි. වමේ ව්‍යාපාරය තුන්වෙනි බලවේගය වෙලයි තිබුණේ. දැන් අලුත් දේශපාලන බෙදුම් රේඛාවක් ඇඳෙමින් තිබෙනවා. අනිවාර්ය ලෙස මෙම බෙදුම් රේඛාව අඳින්නේ ජනතා විමුක්ති පෙරමුණයි.

විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ යෝජනාවත් එක්ක එය තීව්‍ර වෙලා




තිබෙනවා. රටට ප්‍රජාතන්ත්‍රවාදය ඕනෑ. විධායක ජනාධිපති ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදයට මරු පහරක්. එය අහෝසි කළ යුතුයි. අපිට විතරක් නොවෙයි, ධනපති පක්ෂවලටත් ඒ ප්‍රජාතන්ත්‍රවාදය ලැබෙනවා. ජනාධිපති ඉස්සරහා කෙලින් හිටගන්න බැරි ඇමතිවරුන්ටත් ඒ ප්‍රජාතන්ත්‍රවාදය ලැබෙනවා. සමහරු බයවෙලා කෑ කෝ ගැහුවත් ඒක කාටත් හොඳයි. එනිසා අපි ඒ වෙනුවෙන් පෙනී ඉන්නවා. 

**15වැනි පිටුවට**










බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.